# රසවත් රසකථා
## (1 වන පොත)

- හිනා හිනා හතර හිනා
- මසුරන් වටිනා වැකි

**කතෘවරයාගේ වෙනත් කෘති:**

- **හොඳ උවදෙස් (1 වන පොත)** (පිටු 200)
  (අප සමාජය/ජීවිතය, ආදරය/විවාහය/පවුළ, අපගේ දෑස් වැනිවූ දරුවෝ, ඉංග්‍රීසි ගැන, අපට අත්‍යාවශ්‍යම නීරෝගීකම, /මනා සෞඛ්‍ය, සතුන්/ වනජීවීන්/සුරතල් සතුන්, කාළින රසවත් ප්‍රස්ථාව පිරුළු)

- **හොඳ උවදෙස් (2 වන පොත)** (පිටු 200)
  (අපේ පරිසරය විනාශ වීම අපි වළකමු, අපේ රට දියුණු කිරිම සඳහා වූ සාධාරණ හොඳ රාජ්‍ය ප්‍රතිපත්ති මෙන්න:, කළාව/ක්‍රීඩා, මගී ප්‍රවාහන දියුණු කරන ක්‍රම)

- **රසවත් රස කථා (2වන පොත)** (පිටු 128)
  (අප සමාජය, වෛද්‍යය සේවය, හෝටල්, සුන්දර අතීතය, හොඳ තේරවිලි)

- **රසවත් රස කථා (3වන පොත)** (පිටු 144)
  (පෙම්වතුන්/විවාහය/පවුල් ජීවිතය/ නැට්ටුක්කාරියෝ, රස ආහාර පාන, බීමතුන්, සොඳුරු පාසැල් දිවිය, සිඟන්නෝ, පිස්සෝ, හොල්මන්/මරණ/ මිනීමැරුම්/ජොයතිෂ්‍ය)

- **Selected Writings of Chanaka Bandarage** (336 pages, in English)

# රසවත් රසකථා
# (1 වන පොත)


## කතෘ: චානක බණ්ඩාරගේ

BA (Hons), LLB, GDLP (Aust), DAG, DTAG (UK)



**KKN ප්‍රකාශණයකි**

කොළඹ 8

දුරකථනය: 071 133 4224

arwdc@bigpond.com



සියළු හිමිකම් ඇවිරිණි

Copyrights Protected

# රසවත් රසකථා (1 වන පොත)

*එක හුස්මට කියවන්න පුළුවන් රසවත් පොතක්; සිනා සාගරයක්*

---

@චානක බණ්ඩාරගේ

KKN ප්‍රකාශණයකි, කොළඹ 8

---

ISBN 9787 – 055 – 65223 -0 – 7

---

ප්‍රථම මුද්‍රණය: 2016 සැප්තැම්බර්

---

# පටුන

පිටු


- හිනා හිනා හතර හිනා 1 – 133

- මසුරන් වටිනා වැකි 134 – 160

# • හිනා හිනා හතර හිනා

1. දියවැඩියා රෝගියෙක් එයාගේ අන්තිම කැමැත්තේ ලියලා තියනෙවා මගේ ඇඟේ සියලුම සීනි මගේ වයිෆ්ට කියලා

2. කතා බහින් අඩු විවාහක යුවලකි. සියලු ගනු දෙනු කරන්නේ තුන්ඩු කැලි වලින් පමණි. මහත්තයාට උදේ පාන්දර එලාම් එක නොවැදීම නිසා පරක්කු වී අවදි වී වැඩට යාමට වූ ප්‍රමාදය ගැන බිරිඳට මැසිවිලි නැගුවා. බිරිඳ චිට් එකක් දුන්නා 'ඔයාගේ කෝට්වෙ යට තියෙන මගේ ඉස්සෙල්ල චිට් එක බලන්න' කියා. මහත්තයා එය අරන් බැලුවා. එහි ලියා තිබුනේ 'ඔයාගේ එලාම් එක අද උදේ 5ට වැදුනේ නැහැ, ඉක්මනට නැගිටින්න' කියායි.

3. වයසක සත්ව ගොවියෙක් ඔහුගේ බිරිඳ සමග ඌරු කොටුවේ වැටට හෙත්තු වී සිටිද්දී, වියපත් බිරිඳ කියනවා 'ලබන සතියේ එන අපේ 50 වැනි විවාහ සංවස්තරයට අප මොකද කරන්නේ, අපි පාටි එකක් ගනිමුද?.' ? ඔහු කියනවා 'අපි ඌරෙක් මරමු'. බිරිඳ කියනවා 'අයියෝ, වසර 50ට ඉස්සර වෙච්ච දේට අහිංසක ඌරා පලිද?'

4. නැතිවූ ක්‍රෙඩිට් කාඩ් එක ගැන ඔහු පොලිසියට පැමිණිලි නොකළේ මන්ද? හොරා නෝනා තරම් ක්‍රෙඩිට් කාඩ් එකෙන් හොරකම් කරන්නේ නැහැල්ලු.

5. වෙනදා හැමදාම අරක්කු බෝතල් ½ බොන ඔබ තුමා ඇයි අද විතරක් වීදුරු 2ක් බීල නැගිට්ටේ? නෑ, මට අද අමදාපප සභා මීටිම මෙහෙයවන්න යන්න තියෙනවා.

6. ගුරුතුමා - මේ ප්‍රශ්නෙට උත්තර දෙන්න; ඔබේ පියා රුපියල් ලක්ෂයක් මසකට හම්බ කරන අතර ඉන් බාගයක් ඔබේ අම්මාට දෙන්නේ නම් ඔහුට කුමක් හිමිද? ‘පපුවේ අමාරුව’.

7. මිනිසා මැවීම පිළිබඳව රචනාවක එක් ශිෂ්‍යාවක් මෙසේ ලීවාය. ඉස්සෙල්ලාම මිනිසාව මැවුවා. හොඳට ඒ දිහා බලලා, මීට වඩා හොඳට මෙයාව මට මවන්න පුළුවන් කියා සිතා, වැරදි නිවැරදි කර, ගැහනියව මැව්වා.

8. සිසුවිය ඉස්කෝලෙට ගියේ පරක්කු වෙලාලු. මේක අහු උනාලු ලොකු මහත්තයට. ඉතින් ලොකු මහත්තයා සිසුවියගේ ඇහුවලු ‘මොකද ඔය ළමයා එන්න පරක්කු උනේ?. ‘ඉස්කෝලේ මහත්තයෝ. මම අද වැව් කණ්ඩිය දිගේ එනකොට කොල්ලෙක් මගේ පස්සෙන් ආවනේ’. ‘ඔව් ඉතින් ඒක පරක්කු වෙන්න හේතුවක් නෙමෙයිනේ. ඊට පස්සේ සිසුවිය උත්තර දුන්නලු. ‘ඉස්කෝලේ මහත්තයෝ ඒ කොල්ලා අවේ හෙමින් හෙමින් නේ.’

9. ‘සුදු හාල් වලට රතු සායම් දැම්මද; මිරිස් කුඩු වලට ගඩොල් කුඩු දැම්මද; ගම්මිරිස්වලට පැපොල් ඇට දැම්මද, දුඹුරු හාල්

වලට වැලි දැම්මද; හා, එහෙනම් ගිහින් බුදු පහන පත්තු කරපන් ‘.

10. මල්ලියි සීයායි  එක්ක ආදරෙන් බැඳිලා හිටපු අයියා රට ගියාලු රස්සාවකට. ආදරයෙන් රැකගත්තු බලු පැටියයි සියාවයි මල්ලිට බාරදීලා. ටිකකාලෙකට පස්සේ මිනිහ සෙට්ල් වෙලා එහෙම තොරතුරු හොයන්න ගෙදරට කතා කලාලු. මල්ලිත් එක්ක කතාකරන ගමන් අයියා ඇහුවේ බල්ලා ගැන .අනේ බල්ලා මලානේ. අයියට දැන් හරි දුකයි. මනුස්සයෝ ඔයවගේ ආරංචි ඔහොමත් කියනවද? මුලින් කියන්න තිබ්බේ අයියේ බල්ලා කුඩුවේ. ඊලග දවසේ කතා කලහම උඃ එලියට එන්නේ නැහැ ගන්න මාර ට්‍රයි එකක් දුන්නේ! උඃට කැම දෙන්න උත්සහකලා ..බල්ලා කුඩුව ඇතුලෙම ඇදන් වැටුනා. උඃ මැරෙයි වගේ, අන්තිමට මරුනා  කිව්වනම් මට දුක නැහැ නේ .හරි හරි කමක් නැහැ කෝ සියා? අයියේ, සියා බලු කුඩුවේ.

11. විදේශ අමාත්‍යාංශයෙන් නව චක්‍ර ලේඛනයක් ගහලා - ඉංග්‍රීසි වචනයක් හෝ බැරි  තානාපතිවරුන්ට හස්ත මුද්‍රාවෙන් එම රටවල වැඩ කිරීම පිළිබඳ ප්‍රමාණවත් හස්ත මුද්‍රා භාෂාව පිලිබඳ දැනුමක් ලබාදෙන්න කියලා.

12. මධු සමය ගත කිරීමට තානායමට ගිය නව යුවල කාමරය තුල පෙම් බස් දොඩමින් සිටියා. මනාලයා කිවා ‘මින් පස්සේ ඔයයි මමයි දෙන්නෙක් නොවෙයි එක්කෙනෙක්’. මනාලිය කිවා ‘ඒක මං හොඳට දන්නවා, ඒත් අද රෑට කෑම දෙන්නෙකුට ඕර්ඩර් කරන්න හොඳේ’ කියා.

13. අපි දෙන්නා එක්වුනොත් මගේ මූණත් ඔබේ මොළයත් තිබෙන ළමයෙක් මේ ලොවට බිහිකල හැකිනේදැයි මැර්ලින් මොන්රෝ ජෝජ් බර්නාඩ් ෂෝගෙන් ඇසුවේය. ඒ වුනාට බැරිවෙලාවත් මගේ මූණත්, ඔබේ මොළයත් ඒ දරුවාට ආවොත් වෙන්නේ හරි අකරතැබ්බයක් නොවේද කියා ෂෝ ඇසුවේය.

14. අර අතිශය රුමතියට කැල්කියුලේටරයේ 10යි 5යි එකට එකතු කරගන්න බැරි මොකද? එයා හැමතැනම 10 බොත්තම හොයනවා.

15. ඊයේ ග්‍රාම සේවක ආවා ගෘහස්ත නාමලේඛනය හදන්න, අත දරුවා හිටියේ කොට් එකේ. මම මිනිහට ඇහෙන්න මගේ මිනිහට කිවුවා -'පොවනවා හස්බන්ඩ් කිරි ටික දරුවට, දානවා මගේ නම ගෘහ මූලිකයාට ' කියලා. හරියටම මගේ වැඩේ හරි ගියා- ග්‍රාම සේවක මගේ නම දාලා ලයිස්තුවේ ඉහලටම.

16. මත්පැන් අවන්හලක සිය මත් බිම වීදුරුව දිහා බලා සිටින තරුණයෙකි. පැය භාගයක් පමණ ඔහු ඒ දෙසම බලා සිටියි. හදිසියේම හැඩි දැඩි පුද්ගලයෙක් අවන්හලට පැමිණ තරුණයා අසලට පැමිණ ඔහුගේ වීදුරුව ගෙන මත්පැන් සිය මුවේ හලා ගනී. තරුණයා හැන්ඩිමට පටන් ගනී. එවිට හැඩිදැඩි පුද්ගලයා කියනවා 'මම විහිළුවක් කලේ, ඉන්න මම ඔබට මත්පැන් වීදුරුවක් අරන් දෙන්නම්.කෙනෙක්

හඬනවා මට නම් බලං ඉන්න බැහැ'. එවිට අසරණ තරුණයා එවිට කියනවා ' නෑ එහෙම ප්‍රශ්නයක් නෙවයි; අද මගේ ජීවිතයේ නරකම දවස. උදේම මම පරක්කු වී අවදිවී වැඩට ගියා, ලොක්කා මාව රස්සාවෙන් අස් කළා. මම කාර්යාල ගොඩනැගිල්ලෙන් අයින් වෙලා මගේ කාරයට ගිය, එවිට මගේ කාරය සොරකම් කරලා, පොලිසිය කිවුවා ඒ අයට කරන්න පුළුවන් දෙයක් නැතිලු, මම ටැක්සියක් ගත්තා ඒකෙන් බැහැලා තියෙන්නේ මගේ සල්ලි පුරෝපු පර්ස් එක එකේ දාලා, මම ගෙදර එනකොට නෝනා තව කෙනෙක් එක්ක අපේ නිදියහනේ, මම ගෙදර අත් හැරලා මෙතනට අවා, බලන්න ජීවිතය විනාශ කරගන්න කියලා මගේ විස්කි එකට තදබල වස දාලා වීදුරුව බොන්න හදනකොට ඔබ ඇවිල්ලා එක බීවා.

17. ඇමරිකන් කාරයෙක්, බ්‍රිතාන්‍ය ජාතිකයෙක් සහ ශ්‍රී ලාංකිකයෙක් කෝච්චියකින් ඇමරිකාව ඇතුලේ ගමනක් ගියා. තමන් සල්ලි කාරයෙක් කියලා පෙන්නන්න ඇමරිකන් කාරයා ඩොලර් 50 නොට්ටුවකින් සුරුට්ටුව පත්තු කර ගත්තා. මහා ගාම්භිර විදියට හිටියා.බ්‍රිතාන්‍ය ජාතිකයත් ඇරියේ නැහැ, මිනිහ ඩොලර් 100 නෝට්ටුවක් පත්තු කරගෙන සුරුට්ටුව පත්තු කරගත්තා. හක හක ගාලා හිනාවුනා. අපේ දුප්පත් සිංහලයා ළඟ සල්ලි තිබුනේ නැහැ. මිනිහ චෙක් පොත අරන් ඩොලර් 500 චෙක් එකක් ලියලා දෙන්නටම පෙන්නලා ගිනිකුරක් ගහල පත්තු කරලා සුරුට්ටුව පත්තු කරගත්තා. මැදිරිය සුද්දෝ දෙන්නා මැදිරිය සිංහලයට දීලා නැගිටලා ගියා.

18. සේවකයා - සර් මම බඳින්න යන්නේ. හාම්පුතා - ඇයි, සුමානයක් නිවාඩු ගත්තනේ, ඇයි එතකොට නොබැන්දේ? සේවකයා - මගේ නිවාඩුව සවුත්තු කරගන්න බැහැනේ.

19. හාම්පුතා - ඇයි, තමන් තනියෙම හිනාවෙන්නේ? සේවකයා - මම පුරුදු වෙනවා සර් කියන විහිළුවලට හිනාවෙන්න.

20. රජතුමෙක් සිය රටේ කාන්තාවන්ට රන් ආභරණ නොපැළඳිය යුතුයයි නියෝගයක් කලත් කිසි කෙනෙක් එය ගණන් ගත්තේ නැහැ. මෙයින් කිපුණු ඔහු තවත් නීතියක් දැම්මා, මුල් නිතිය වෛශ්‍යාවන්ට පමණක් අදාල නොවේය කියා, සියලු කාන්තාවෝ අභාරන පැළඳිම නැවැත්වුවා.

21. කෙනෙක් පොලිස් පොතේ පැමිණිල්ලක් දානවා 'මට දිනපතාම රැට තර්ජනාත්මක ටෙලිෆෝන් කෝල් එනවා එයාගේ වයිෆ් එක්ක තියෙන සම්බන්ධය නවත්වන්න කියලා, නැත්නම් මරනවා කියලා '. 'ඉතින් නවත්තලා දානවකෝ' කියලා රාලහාමි කියනවා.' ඔවු රාලහාමි මට නවත්තන්න ඕන, ඒ හාදයා එයාගේ වයිෆ්ගේ නම කිවුවේ නැහැනේ, ඉතින් මම කොහොමද දන්නේ කොයි ගෑනිද කියලා, ඒකයි මම පොලිසියට ආවේ කොයි ගෑනිද කියලා හොයලා බලලා මට කියන්න කියලා.'

22. 'මා ලබන සතියේ රට යනවා'. 'ඔයා යන එක හොඳයි'.'ඇයි එහෙම කිව්වේ?' 'ලබන සතිය පරිසර දූෂණය වැළැක්වීමේ සතියනේ.'

23. පැරණි මිතුරියෝ දෙන්නෙක් හම්බ වුනා. ඔයාට කොහොමද ඇමති කමක් හම්බ උනේ? ඉඟුරු වලට අමාත්‍යාංශයක් දාලා මාව ඉඟුරු ඇමතිනි කරලා දාන්න කියල මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටියා. මට කිව්වා, ඔව් දැන් එච්චරයි අඩු අමාත්‍යාංශයකට තියෙන්නේ; හැබැයි නරක් වූ ආහාර වලටත් අමාත්‍යාංශයක් ඕනාමයි කියලා. පස්සේ, හදලා මාව ඇමතිනි හැටියට පත් කරලා කොහොමහරි මේ ප්‍රශ්නය විසදන්න කියලා කිවුවා. මම ඒ සම්බන්ධ ඇමතිනි වුනේ ඔන්න ඔහොමයි.

24. ඔන්න දවසක් අලියෙක් හිටු කියල කූඹියෙක් පස්සේ එලවනවලු.කූඹියා පණ කඩාගෙන දුවන කොට තුන් මං හන්දියක් හම්බ වුනාලු.එක පැත්තක පන්සලක්ලු අනික් පැත්තේ ඉස්කෝලයක්ලු.අනික් පාරේ කඩයක්ලු. කූඹියා ඕන දෙයක් කියල පන්සලට ගියාලු. අලියා තුන්මං හන්දියට ඇවිල්ල හොල්මන් වෙලා හෙව්වලු මොන පැත්තටද මු ගියේ කියලා. පස්සේ අලියා පන්සලට තමයි ගියේ කියල කූඹියව අල්ලගත්තලු. කොහොමද අලියා දැනගත්තේ? - කූඹියාගේ අඩි පාර දැකලා (හොඳ කූඹියා, සෙරෙප්පු දෙක ගලවලා පන්සලට ඇතුල් වෙලා තියෙන්නේ).

25. මම දැන් හොඳට බලාගෙන හිටියේ ඔයා හැමතිස්සෙම එක සිගරට් එකකින් තව සිගරට් එකක් පත්තු කරනවා. ඔවු මම එහෙම කරන්නේ ගිනි පෙට්ටි වලට වැය කරන සල්ලි ඉතුරු කරගන්ඩ.

26. මගේ වාහනේ පස්සේ අලියෙක් පන්නගෙන ආවා, මම වාහනේ වමට සිග්නල් දාල කෙලින්ම ගියා; අලියා දකුණට තිබුණු පාරේ ගියා . මේ අලියා රියදුරු පාසලක උපදේශක කෙනෙක්.

27. ලෝකව්‍යාප්ත සමික්ෂනයක්දී හෙළි උනා පුදගලයන්ගෙන් 96%ක් එම අංකය (21,146,703,436) කියවීමට උකටලිවූ බව.

28. මගේ බල්ලාවත් ආණ්ඩුවට යන්නෑ කියපු අය ආණ්ඩුවට ගියා කියලා පහුගිය දවස්වල කතාවක් තිබුණා, ජලභීතිකා බේත් විදලද දන්නෑ ගියේ.

29. ගමේ කිරි විකුණන මාමාගෙන් ගැමියා ඇහුවා - අද නිකන් කිරි වතුර වගේනෙ කියලා . මිනිහා කියනවා - කිරි වතුර වගේ හින්දනේ බෝතල් වලට දාල ගේන්නේ නැත්තම් මම කිරි කෑලි වලට කපලා, උර වලට දාලා විකුනනවනේ කියලා.

30. විවාහ වීම යනු ආපන ශාලාවකින් කෑම ඕඩර් කරනවා වගේ. ඔබ ඔබට අවශ්‍ය දේ ඕඩර් කරනවා. ඉන් පසු අනික් කෙනා කන දේ බලනවා. එවිට ඔබ සිතනවා ‘අනේ මම ඒ දේ ඕඩර් කළා නම්’ කියා.

31. එක්තරා මහාචාර්යවරයෙක් දේශනයකට සහභාගි වී එය කරගෙන යන අතරතුරේ එකා දෙන්න නැගිට ගිය හෙයින්

එකම එක පුද්ගලයෙක් පමණක් ඉතිරි විය.මහාචාර්ය වරයා ඔහු අමතා, මට සන්තෝෂයි ඔබ විතරයි මෙතන මගේ දේශනයට සවන් දෙන්න ඉන්න එක ගැන. පෙරලා පිළිතුරු ලැබුණි. නෑ සර් මම මේ හෝල් එක වහලා යතුරු අරන් යන්න ඉන්නේ, සර්ගේ කතාව ඉවර වෙනකම්.

32. ඔයාගේ එක පුතෙක් දොස්තර, දුව ලෝයර්, දෙවෙනි පුතා රජයේ ගණකාධිකාරි. ඒත් ඔයා ජීවත්වෙන්නේ ඔස්ත්‍රේලියවේ ඉන්න පුතා එවන සල්ලි වලින්, මිනිහට එහෙ රස්සාවකුත් නැහැල්ලු. ඔවු මිනිහට ආණ්ඩුවෙන් ලැබෙන ඩොල් එක මේ ඔක්කොමටම මෙහෙ ලැබෙන පඩියට වඩා වැඩියි.

33. මහත්තයා -මුදලාලි, එළු මස් ගාන කීයද? මුදලාලි-කටු නැති එක 400යි. කටු තියන එක 300 යි. මහත්තයා -නැහැ මුදලාලි, ඊට අඩුවෙන් නැද්ද? මුදලාලි-බල්ලෙකුට වගේ නම් ඊට අඩුවෙන් එකක් තියනවා, කිලෝ එක 250 යි මහත්තයා -ආ ඔව් ඔව් මුදලාලි බල්ලට තමයි. ඒකෙන් කිලෝ එකක් දෙන්න (මෙතෙක් වෙලා නිහඬව සිටි පුංචි පුතා මහා සද්දෙට,-‘දැන් යන ගමන් අපි බල්ලෙකුත් ගන්නවද තාත්තේ?’).

34. බිත්තර දාපු කිකිලිත් කිව්වලු. මගේ බිත්තර තැම්බුවට මාව තම්බන්න ලේසි නෑ. කියලා. අන්න ඒකිත් දැන් බේක් වෙලා.

35. කැන්ගරුට සිඩ්නි වරායේ පාලමට වඩා උඩ පනින්න පුලුවන්ද. ඔව්. ඇයි? පාලමට උඩ පනින්න බැහැනේ.

36. ගුරුතුමා - ඔබේ ජිවිතයට වැඩියෙන්ම උපකාරී වූ පොත මොකක්ද? ශිෂ්‍යයා -'මගේ දෙමවුපියන්ගේ චෙක් පොත'.

37. කාන්තා පාසලක කෑම ශාලවේ ඇපල් ගොඩේ මෙසේ සඳහන් නිවේදනයක් ගසා තියෙනවා 'ළමයි ඇපල් ගොඩෙන් එක ඇපල් ගෙඩියක් විතරක් ගන්න, මේට්‍රන්වරිය උඩ් ඉදන් බලා ඉන්නවා'. දඟකාර සිසුවිය විස්කෝතු බඳුන ළඟ මෙවන් නිවේදනයක් ලියා තබනවා 'ඔබට අවශ්‍ය තරම් ගන්න, මේට්‍රන්වරිය බලා සිටින්නේ ඇපල් ගොඩ දෙසය.'

38. දොස්තර තම රෝගී මිතුරාට පැමිණ ඔහුව හමුවන මෙන් ඉල්වා කෙටි ලිපියක් යැවුවා. මිතුරා නොපැමිණි කල දොස්තර ඔහුව බැලීමට ඔහුගේ ගෙදරට ගියා. 'මම පුංචි ලියුමක් එව්වා, හම්බ උනාද' කියා ඔහු මිතුරාගෙන් ඇහුවා. 'ඔවු ඩොක්ටර්, ගොඩාක් ස්තුතියි, මම ඒක ෆාමසියට දීලා බේත් ගත්තා, දැන් ගොඩාක් ගුණයි' කියා මිතුරා කිවා.

39. ලොකු ආයතනයක ලොකු මහත්තයෙක් BMW කාරයක පටුපාරක හදිසි ගමනක්, එතුමාට කොහොමත් හැම ගමනක්ම වැදගත් හදිස්සි ගමන් තමයි. පිටුපස සීට් එකේ අලුත්ම වැදගත් තොරතුරු ඇතුලත් ජාත්‍යයන්තර සඟරා - ටයිම්, නිව්ස් වීක් වගේ, ඊට උඩින් එල්ලපු ජේත්තුකාර කෝට් එකට දෙකක්ම - පාට දෙකකින්ම ඉටි කවර වල

බාහාපු. ගම්බද පාරේ පැයක් විතර ආ විට පොඩි පාලමක් පසු කරන්න අසළට එනවත් සමග අනිත් පසින් ජීප් රථයක වතු සුපිරින්ටන්ඩන්ට් කෙනෙක් තේ වත්තේ රාජකාරියට යන ගමන් එනවා, මේ පටු පාලමේ ඉස්මත්තට ආවා. හදිස්සිකාරයෝ දෙන්නම දෙපැත්තේ ඉන්නවා කාලයේ වටිනාකම දන්නා. වාහන දෙකෙන් එකක් පස්සට නොගත්තොත් මාරුවීමට නොහැකියි. ටිකක් බලාහිටිය BMW ලොක්කා ජාත්‍යයන්තර සඟරාවක් අරන් කාරයෙන් බැහැලා. බොනට් එක උඩට නැගලා කකුලක් පිට කකුලක් දාගෙන ඒ වැදගත් ජාත්‍යයන්තර සඟරාව කියවන්න පටන් ගත්තා, කාලයෙන් උපරිම ප්‍රයෝජන ගන්නා කෙනෙක් බව එහෙම කළේ. අනිත් පස ඇති ජීප් එක පිටිපස්සට ගන්නා තුරු. දෙපැත්තේම වාහන පෝලිමයි එහා මෙහා යන. ටික වෙලාවක් බලා හිටිය වතු සුපිරින්ටන්ඩන්ට් වතු ඇඳුමෙන්ම තොප්පියත් අතට අරන් වාහනයෙන් බැහැලා,' මචං, ඕක කියවලා මටත් ටිකන් දෙනවකෝ බලන්න'. කියලා කිවුවාලු. දෙන්නම හිනාවෙලා එකවර වාහන දෙක පසු පස්සට ගත්තා, තදබදය නිමා උනා.

40. එක්තරා රටක අනියම් ලිංගික ඇසුරු පැවැත්වුවහොත් ගල් ගසා මරනවා. එය දැන දැනත් අපේ ලිංගික පැත්තට ගොඩාක් බර කෙනෙක් ඒ දේ ඒ රටේ ඉඳන් නිතරම කරනවා. මිනිහාගෙන් යහළුවෙක් ඇහුවහම මිනිහා කියනවා - එසේ පහරදීමෙන් මැරෙණ අයට දිව්‍යලොකේදී කන්‍යාවියන් 72 දෙනෙකුගේ පහස ලැබීමට ඒ පිනම ලැබෙනු ඇත කියා මට මේ රටේ ආගමික නායකයෙකු

කීවා, ඉතින් එවැනි පහසක් ලබා ගැනීමට මා ද යම් පරිත්‍යාගයක් කල යුතුයි කියලා.

41. තමන්ගේ ස්වාමිපුරුෂයා සැම රැයකම හරියටම ඉන්නේ කොහෙද කියා දන්නා ස්ත්‍රියට කියන නම කුමක්ද? වැන්දඹුව.

42. මිතුරිය 1  - ඔයාගේ මහත්තයා  ලක්ෂපතියෙක් නේ; මිතුරිය 2  - එයාව ලක්ෂපතියෙක් කලේ මමයි; මිතුරිය 1  - ඔව් එක නම් ඇත්ත; මිතුරිය 2  - ඔයා කොහොමද දන්නේ?;  මිතුරිය 1 - බඳින්න කලින් ඔයාගේ මහත්තයා කෝටිපතියෙක්නේ.

43. තම මියගිය පියාගේ මිනි වල මත මල් වඩමක් තැන්පත් කල පුතෙක් තම කාරය වෙත යද්දී මිනිවලක් ළඟ කෑ මොර ගහන මිනිහෙක් දැක නතර විය. 'ඇයි ඔබ සමුගත්තේ, ඇයි ඔබ සමුගත්තේ', කියා මොහුගේ මොරදීම කෙනෙකුට අසා උසුලාගත නොහැකියි.. මල්වඩම තැබූ පුතා එම පුද්ගලයා වෙත පැමිණ'සමාවෙන්න, මමත් මගේ මියගිය පියා වෙනුවෙන් මල් වඩමක් තබා එන්නේ, නමුත් ඔබ වැනි මල ගිය කෙනෙකු වෙනුවෙන් වැලපෙන කෙනෙක් නම් මගේ ජීවිතයට දැක නැහැ, මරුනේ ඔබේ ආදරණීය බිරිඳද? දෙමවුපියෙක්ද, දරුවෙක්ද නැත්නම් කිට්ටුම පවුලේ ඥාතියෙක්ද? ටිකක් කල්පනා කර ඒ මිනිහා කියනවා 'මගේ බිරිඳගේ ප්‍රථම ස්වාමි පුරුෂයා' කියා.

44. මාද්‍යවේදියෙක් අහවල් ඇමතිට 'මී හරකා ' කියලා කිව්වා කියලා අවුරුදු 10ට හිරේ යවලා. චෝදනාව - 'රාජ්‍ය රහස් හෙළි කිරීම'.

45. දවසක් යාළුවාත් එයාගේ පෙම්වතියත් සමඟ ටියුෂන් ක්ලාස් ඉවර වෙලා එලියට අවළු. යාළුවා අන්තිම ලෝබයා. සල්ලි තියෙනවා වියදම් කරන්නේ නැහැ, ඇඟේන් ඇටයක් යනවා වගේ. නිකමට වගේ පෙම්වතියගෙන් ඇහුවලු 'මොනවද බොන්නේ කියලා'. අතේ සතේ නැති පෙම්වතිය කිවුවලු 'ඔයා කැමති දෙයක්' කියලා. යහළුවා කියනවා වතුර තමයි හොඳම පානය, එන්න අපි වතුර 2ක් බොමු කියලා. පෙම්වතිය හිතුවා මේ මිනිහා කූල් වතුර බෝතල් 2ක් ගනී කියලා. මෙන්න ලඟම තිබුණු හොටෙලේට එක්ක ගිහින් පයිප්පෙන් ඇල්වතුර දෙකක් වේටර්ට කියලා විදුරුවලට ගෙන්නාගෙන බිලා ගෙදර ගියාලු.

46. අනුන්ගේ වතුවලට පැනලා හොරෙන් කෙසෙල් කැන් කපාපු සිද්ධියකට අමුම, අමු හොරෙක් සැකේට ලක්වෙලා. ගමේ කිහිප දෙනෙක් එකතුවෙලා හොරාට නිර්දෝෂී බව ඔප්පු කරන්න කියලා හාස්කම් තියෙන දේවාලයකට කූදලාගෙන ගොස් අඹු දරුවන් සිහිකර දිව්රපන් කියලා, හරියට හොරකම ඇත්තටම කලාද දැනගන්න. මේ හොරා හිමිහිට මුං ඇටත්, මෑ ඇටත් අත් දෙකේ මිටි මොලවාගෙන ඉදලා, දරුවන් දෙසටත් ඇඹෙනිය දෙසටත් දික් කරමින් දිව්රලා. මුං පල්ලා, මෑ පල්ලා කෙසෙල් හොරකම් කලේ නැහැ ,නැහැ නැහැමයි කියමින් ඒ ඇට තද කරලා. අත්

දෙකේ ගුලිකරන් හිටිය මුං ඇටත් මැ ඇටත් සට සට ගා පුපුරලා. දැකපු මින්ස්සු පුදුම වෙලා. හොරා වීරයෙක් වගේ නිදහස් උනා. පසුකාලෙක දේවාලයක් භාරවත් කටයුතු කලාලු.

47. භාෂා පරිවර්තකයෙක් කොම්යුනිකේෂන් සෙන්ටර් එකක මේසයක් තියාගෙන එය තුල වැඩ කළේය. කොම්යුනිකේෂන් සෙන්ටර් හිමියා ඔහුට කථා කොට තමා පොඩ්ඩකට එලියට යන නිසා සෙන්ටර් එක බාරව වැඩ කරන ලෙස ඉල්ලිය. ෆොටෝ කොපි කර ගැනීමට කෙනෙක් පැමිණියේය. ඔහුගෙන් අප මිතුරා ඇසුවේ, 'ඔයාට මේක ෆොටෝ කොපි කරගන්න ඕන සිංහලෙන් ඉංග්‍රිසියයටද, නැත්නම් ඉංග්‍රිසියෙන් සිංහලටද' කියායි.

48. පොල් ගහනකොට,පොල් මුදලාලිට වාසියි. තෙල් මුදලාලි කොට උඩ; මෙට්ට මුදලාලි ඔන්න පහන් පත්තු කරනවාලු තවත් පොල් ගහන්න කියලා.

49. ඔන්න එක දවසක් රබර් කිරි කපන කොල්ලෙක් රියදුරු පාසලකට පැමිණියේ රියදුරු පුහුණුව ලබා රියදුරු බලපත්‍රයද ලබා ගැනීමේ අදහසිනි. දිනක් ඔහු පුහුණුව ලබමින් සිටි අවස්ථාවේ මාර්ගයේ සිග්නල් කණුවක් අසලදී පුහුණුකරු කොලුවාගෙන් මෙසේ ඇසීය, දරුවා කියන්න බලන්න කොළ වැටුනොත් මොනවද අපි කළ යුත්තේ යනුවෙනි. එවිට කොලුවා කිවුවේ කිරි කපන එක නවත්වලා ගස්වලට පොහොර දාන්න පටන් ගන්නවා යනුවෙනි.

50. ලොව ස්ත්‍රීන් වර්ග ස්ත්‍රියක 5ක් සිටිනවා. මට ඒ ස්ත්‍රීන් 5 දෙනාම ඉන්නවා යයි එක් මිතුරෙක් තව මිතුරෙකුට කිවා. මොනවද ඒ 5 වර්ගය කියා අහුවහම් ඔහු කිවේ: ස්වාධිනව ගෙදර වැඩපොළ කරන ස්ත්‍රිය, මට විශ්වාස කල හැකි තැනැත්තිය, මාව සිනහවෙන් තබන තැනැත්තිය, මට කායික ආශ්වාදය ලබාදෙන ස්ත්‍රිය සහ ඉහත ස්ත්‍රීන් හතර දෙනා කිසිදා එකිනෙකාට හම්බනොවන තැනට වැඩ කරන ස්ත්‍රිය කියායි.

51. මිතුරිය 1 - ඇයි ඔයා නොබැන්දේ? මිතුරිය 2 - මම හෙව්වේ අංග සම්පූර්ණ පිරිමියෙක්ව. මිතුරිය 1 - ඉතින්? මිතුරිය 2 - මට එහෙම කෙනෙක් හම්බවෙන කොට වයස 45යි. මිතුරිය 1 - ඉතින් ඇයි එයාව නොබැන්දේ? මිතුරිය 2 - එතකොට එයා හොයන්නේ අංග සම්පූර්ණ ගැහැනියක්.

52. ඔන්න එකමත් එක රටක (ලංකාවේ නෙවෙයි) කාන්තාවක් පාරේ යන කොට සිඟන කාන්තාවක් ඇවිත් රෑ කෑම ගන්න සල්ලි ඉල්ලුවා. එතකොට ඒ කාන්තාව ඇසුවා, මම ඔබට සල්ලි දුන්නොත් ඔබ ඒ සල්ලි වලින් බොනවද කියලා. එතකොට සිඟන කාන්තාව කීවා නෑ, මම බීම නවත්තලා අවුරුදු ගාණක් වෙනවා කියලා. ඊට පස්සේ ඒ කාන්තාව ඇසුවා එහෙනම් මේ සල්ලි වලින් ඔබ ෂොපින් යයිද කෑම ගන්නේ නැතුව කියලා. එතකොට සිඟන කාන්තාව කීවා මට ෂොපින් යන්න සල්ලි වියදම් කරනවට වඩා ජීවත් වෙන්නයි ඕන කියලා. නැවතත් අනිත් කාන්තාව අහනවා ඔබ සැලෝන් එකකට යයිද කෑම ගන්නේ නැතුව කියලා. එතකොට සිඟන කාන්තාව කියනවා ඔබට පිස්සුද මම

අවුරුදු 20කින් සැලෝන් එකකට ගිහින් නෑ කියලා. එතකොට පොහොසත් කාන්තාව කියනවා මම ඔබට සල්ලි දෙනවා වෙනුවට මමයි මගේ සැමියායි සමග අද රෑ කෑමට ආරාධනා කරනවා කියලා. එතකොට සිඟන කාන්තාව පුදුමයෙන් අහනවා ඔබේ සැමියාට කේන්ති යන එකක් නැද්ද මම වගේ අපිරිසිදු කැත අප්‍රසන්න කාන්තාවක් ඔබලා සමග රෑ කෑමට ගෙන ගියොත් කියලා. එතකොට පොහොසත් කාන්තාව කියනවා, මට ඔහුට පෙන්නන්න ඕන අර කියපු දේවල් අතහැරියාම ගැහැණු කෙනෙක් පත්වෙන තත්වය.

53. බස් එකේ යුවතිය ළඟ හිස් අසුන දුටු පිරිමියා - 'මේ අසුන හිස්ද' කියා ඇසුවා.; යුවතිය - 'ඔව්, මේ මගේ අසුනත් හිස් වෙයි ඔබ ඉඳ ගත්තොත්' කියා කීවා.

54. රැස්වීමේදී  එක් කාන්තාවක් පැයකට වඩා නොනැවතී කථා කරනවා. ඇනුම් අරිමින් සිටි එක් විඩාපත් මිනිහෙක් අසල සිටි තවත් මිනිහෙක්ගෙන් අහනවා මෙයාගේ කට වහන්න විදියක් නැද්ද කියලා. දෙවෙනි  මිනිහා කියනවා, මමත් දැන් අවුරුදු 20ක් තිස්සේ ට්‍රයි කරනවා තාම විධියක් දන්නේ නැහැනේ කියලා. ඒ කොහොමද කියලා පලවෙනි මිනිහා අහනකොට, දෙවන මිනිහා කියනවා මම ඒ කාන්තාවගේ ස්වාමි පුරුෂයා කියලා.

55. නීතිඥයෙක් හමුවට ආ කෙනෙක් ඇහුවා, මහත්තමයා ළමයෙක් ක්‍රිකට් ගහන කොට බෝලේ ඇවිල්ලා මගේ දොරේ වීදුරුවේ වැදුනොත් මට වන්දි ගන්න පුලුවන්ද.

නිතින්ගා මහතා කිවා නෑ, ඒ දරුවගේ දෙමවුපියන් කෙලින්ම වග කියන්න ඕන නෑ, නමුත්, ඔයාට ඒ දරුවට විරුද්ධව එයාගේ දෙමව්පියන් මාර්ගයෙන් නඩුවක් දාන්න පුළුවන්. ඔයාට වීදුරුවේ පාඩුව පමණක් නොවෙයි, හිත් වේදනාවටයි, නිතින්ගා ගාස්තුත් ඉල්ලන්න පුළුවන් කියලා. කියක් විතරද කියලා ඇහුවහම ලක්ෂයක් විතර කිවා. හා කමක් නැහැ මහත්තයා මට හැත්ත පන්දාහක් ඇති, මොකද මට නිතින්ගා ගාස්තු නිකන්නේ ලැබුනේ. ඒ කොහොමද කියලා නිතින්ගා මහත්තයා අහනකොට ඒ කෙනා කියනවා වීදුරුව කැඩුවේ ඔයාගේ පුතා. ඔයාගේ නීති උපදෙස් මම ඔක්කොම මොබයිල් එකේ රෙප් කළා කියල කියලා.

56. මට හම්බවෙලා තියෙන මහත්තුරුන්ගෙන් මගේ හස්බන්ඩ් විතරයි කොන්ද කෙලින් ඇතිව කතා කරලා තියෙන්නේ. ඒත් මම දැන් වු ලේට්.

57. ‘තමුසෙලාගේ කඩෙන් අපි අරං ගිය TV සෙට් දෙක හරියට වැඩ කරන්නේ නැහැනේ. ඒවා ආපහු අරං අපේ සල්ලි ආපහු දෙනවා. අපි එහෙම පොරොන්දුවක් ඔයාලට දුන්නේ නැහැනේ. ඇයි මේ ලොකුවට ඕගොල්ලන්ගේ බිත්තියේ ගහලා තියෙන්නේ ‘හොඳ නැත්නම් සල්ලි ආපසු දෙනු ලැබේ’ කියලා. ඔවු තමුසෙලගෙ සල්ලිවල කිසි නරකක් තිබුනේ නැහැනේ.

58. රතිඤ්ඤා එක පත්තු කරලා ගිනිපෙට්ටිය විසිකරලා රතිඤ්ඤා එක සාක්කුවට දාගත්ත කතාව මතක්වුණා.

59. $H_2SO_4$ කියන්නේ මොකක්ද කියලා රසායන විද්‍යා ආචාර්ය වරයා සිසුවාගෙන් ඇසුවා. අනේ සර් මගේ දිව අග මේ තියෙනවා කියා සිසුවා කිව්වා. ඉක්මනට එළියට ගිහිල්ලා කෙළ ගහල එනවා, ඒ සල්ෆියුරික් ඇසිඩ් කියලා ආචාර්ය වරයා කිව්වා.

60. රැවටීම සහ විශ්වාසය කඩ කිරීම මත සැමියා බිරිඳට නඩු පැවරුවා. බිරිඳ කිව්වා - මම නොවෙයි රැවැට්ටුවේ එයායි. එයා මට කිව්වා එදා රෑ  ගෙදර එන්නේ නැහැ කියා, පස්සේ ආවා.

61. දොස්තර මහතා ලෙඩාට කිව්වා මේ බේත බිව්වහම පොඩ්ඩක් කකුල ඉදිමෙයි, මම නම් පොඩ්ඩක් වත් ඒක ගණන් ගන්නේ නැහැ කියා. ලෙඩා කියනවා ඔයාගේ කකුල ඉදිමුනොත් මමත් ගනන් ගන්නේ නැහැ, ඒත් මෙතැන ඉදිමෙන්නේ මගේ කකුලනේ, මම නම් ඒක ලොකුවට ගණන් ගන්නවා. බොහොම ස්තුතියි, බේත ඔයාම තියා ගන්න කියා.

62. කොහේද මේ බල්ලාව ගෙනි යන්නේ? වෙට් ළඟට. ඇයි? මුට පිස්සුද කියලා බලන්න, මු මගේ නැන්දම්මව හැපුවා නේ. පිස්සු නම් මොකද මූට කරන්නේ? මරනවා. අනේ මරන්න එපා, මට දෙන්න. ඇයි? මටත් නැන්දම්මා කෙනක් ඉන්නවා.

63. දවසක් උපාසක මහත්තයෙක් සිල් පවාරණය කරලා ගෙදර යනවලු.කොල්ලෝ වගයක් තලගොයෙක්  වැරදි පැත්තෙන් පුච්චන්න හදනවලු. උපාසක කිව්වලු ‘තලගොයා

පුළුස්සන්නේ අනෙක් පිටටʻ කියලා, කරන විදියත් පෙන්නලා දීලා.

64. පෙට්‍රල්, භූමිතෙල් බලයෙන් වැඩකරන ට්‍රැක්ටරයක්. තරමක් නූගත් කොලුවෙක් ආසාවෙන් වාහනය පිසදානවා හෝදනවා. රියදුරු උපදෙස් දුන්නා, මලේ ඕකට බොනට් එක ඇරලා ඕකට වතුර දාපන් කියලා. අදහස් කලේ රේඩියේටරය. වතුර පනිට්ටු කීපයක්ම ගෙනිච්ච බව දුටු රියදූරා රේඩියේටරය ලීක්ද කියලා බලන්ඩ අවා.  බලපුවම පැට්‍රල්,බූමිතෙල්, තෙල්වතුර, ටැංකි සේරම වතුරෙන් පුරවලා.

65. අද පොල් ගෙඩියක් කඩා ගන්න කෙනෙක් නැහැ ඕක්කොම පාර්ලිමේන්තුවේ.

66. කොහොමද සිර කාරයා එලියට පැන්නේ, පිටවෙන තැන් සේරම වහල තිබ්ද්දීත්? මිනිහා පැනලා තියෙන්නේ ඇතුල්වෙන ගේට්ටුවෙන් සර්.

67. පියා -ඔයාට ආරංචිද අද ʻකිඩ්නැපින්ʼ එක ගැනʼ? වයිෆ් - ʻආ එකට කමක් නැහැ එයා අවදි උනා.ʼ

68. දීපු චීස් සන්ලයිට් කියලා හිතලා ඒවායින් රෙදි හෝදලා.

69. 1 වැනි යහළුවා - මට තියෙන ප්‍රශ්ණය මේ ගැහැණු කියන ජාතිය තේරුම් ගන්න බැහැනේ. 2 වැනි යහළුවා - මට

තියෙන ප්‍රශ්ණය, මේ ගැහැණු කියන ජාතියට අපි කරන හැම දේම තේරෙනවනේ.

70. මොකද පුතේ ඔයා ගොඩාක් සන්තෝසෙන්? තාත්තා ඊයේ රෑ අර ඩිනර් සෙට් එකේ කෑලි 24නෙ තිබුනේ. ඔන්න දැන් කෑලි 25යි.

71. යමරජු - අර ශ්‍රී ලංකාවෙන් ආපු කසිප්පුකාරයට ලෝදිය පොවන්න ඕන බලෙන්ම හරි. සේවකයා - රජතුමනි - මිනිහා දැනටමත් ලෝදිය වක්කරගෙන බිලා ඔන්න කටගැස්මක් ඉල්ලනවා.

72. මම ලෝකෙම ප්‍රසිද්ධ ලෝයර්, මැනුවල් පොත කියවලත් මට හයි කරගන්න බැරිවෙච්ච මේ අළුත්ම වොෂින් මැෂින් එක අකුරක්වත් කියවන්න බැරි බබානිස් උඹ කොහොමද හයි කලේ? ‘මට කියවන්න බැරි උනාට හිතන්න පුළුවන්නේ සර්.

73. මහාචාර්යවරයා වෛද්‍ය සිසුන්ගෙන් ප්‍රශ්ණ විමසුවා. මේ බෙහෙතෙන් කොච්චර දෙන්න ඕනද? වෛද්‍ය ශිෂ්‍යයා කිවා සර් ග්‍රෑම් 10 යි කියා. එවිටම ටෙලිෆෝන් කෝල් එකක් ආවා, මහාචාර්යවරයා ඒ කෝල් එකට උත්තරදී පැමිණියා. එවිට සිසුවා කිවා, සර් මට වැරදුනා ග්‍රෑම් 10 ක් නොවෙයි ග්‍රෑම්1යි කියා. ඔරලෝසුව බැලු මහාචාර්යවරයා කිවා දැන් ප්‍රමාද වැඩියි, ඒ ලෙඩා දැන් ඕවර්ඩෝස් වෙලා මැරිලා, මොකද, මම බෙහෙත ප්‍රේස්ක්‍රයිබ් කරලා දැන් විනාඩි 2ට වැඩියි කියලා.

74. ඇයි ඔයා අර අසිස්ටන්ට් ලෙක්චරර්ට ප්‍රොෆෙසර්, ප්‍රොෆෙසර් කිය කියා පස්සෙන් යන්නේ. මටත් ඉතින් විභාග පාස් වෙන්න විදියක් තියෙන්න එපැයි.

75. ඇයි ඔයා ඔයාගේ දීර්ඝ කාලින ගර්ල් ෆ්‍රෙන්ඩ් ගෙන් වෙන් වුනේ? එයා නරක වචන පාවිච්චි කරනවා. මොන වගේ නරක වචනද? විවාහය, පෝරුව, වෙඩින් රිං, ගොයින් අවේ සාරි, ගෙවල්, නෑයෝ, කාර්, ළමයි වගේ ඒවා.

76. ස්ත්‍රීන් තමන්ගේ වයස අඩුවෙන් කීවත්, ඒ අඩුකරන වයස තවත් කාන්තාවකට එකතු කර කියන නිසා වයසේ අපතේ යන ප්‍රමාණයක් නැහැ.

77. මස්කඩකාරයා - බල්ලෙක් මගෙන් මස් හොරකම් කරනවනේ. නීතීඥයා - ඔබට බල්ලා අයිතිකරුගෙන් අලාභය අය කර ගත හැක. දැන් ඒ මගෙන් ගත්ත උපදෙසට රුපියල් 250ක් අඩු කරන්න, මස් වල ගාන වන රුපියල් 450න්.

78. නුවර සිට පොලොන්නරුව දක්වා ධාවනයවූ සෙනඟ පිරි ලංගම බස් රථයක සිටගෙන ගමන් කරපු මගීන් දෙදෙනෙක් අතර රන්ඩුවකි. එක්කෙනෙක් සරම් කාරයෙක්. අනිකා කලිසම් කාරයෙක්. සරම ඇඳී පුද්ගලයා අහනවා අනෙකාගෙන් 'තමුසේ කලිසමකුත් ඇඳගෙනද ඕයි. මෙහෙම කරන්නේ' කියලා. කලිසම ඇඳී පුද්ගලයා අහනවා 'තමුසේ සරමකුත් ඇඳගෙනද මෙහෙම කතා කරන්නේ' කියලා.

79. ලෙඩා - ගිය අවුරුද්දේ උන හැදිලා ආ වෙලේ ඩොක්ටර් මට කිව්වා නාන්න එපා කියලා. දොස්තර - ඇයි ඔබ අද ආවේ? ලෙඩා - දැන් නැවට කමක් නැද්ද කියලා ඩොක්ටර්ගෙන් අහන්න.

80. අවමංගල්‍ය උත්සවයකි. බිරිඳට සිනායයි. සැවොම ඇය දෙස බලති. එවිට ඇය කියයි 'මෙය තමා එකම අවස්ථාව ඔහු හරියටම යන තැන මම දන්න'.

81. ඔයා අවුරුද්දට හරියට වැඩ ඇල්ලුවද? ඔව් තුන්වේලම ක්ෂණික නූඩ්ල්ස් කාලා තේ වතුර වෙනුවට කෝලා බිලා ෆේස්බුක් එකෙන් අකුරු කියෙව්වා. හික් හික්.

82. ගිය වසරේ පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රධානෝත්සවයේදී ප්‍රධාන අමුත්තා දීර්ඝ අවවාද අනුශාසනයක් කළා. මේ වසරේදී ඔහුට ආරාධනයක් වත් ලැබුනේ නැහැ. මන්ද කියා ඔහු විදුහල්පතිගෙන් විමසුවා. ඔයා ගිය අවුරුද්දේ දීපු අනුශාසනා ළමයි කවුරුවත් පාවිච්චි නොකර පරිස්සම් කරගෙන තියාගෙන ඉන්නවනේ කියා විදුහල්පති තුමා කිව්වා.

83. ඔය සෙන්කෝලේ අරං දුවන්නේ කලින් පොකට් ගහලා දුවපු පුරුද්දටද?

84. ධනවතෙකුගේ දුවක් විවාහ කරගැනීමට පැමිණි තරුණයා පියාගෙන් ඇසූ පළමු ප්‍රශ්ණය දෙන දෑවැද්ද කීයද කියායි. රුපියල් ලක්ෂයයි කියා ධනවතා කිව්වා. මේ තරම් කෝටිපතියෙක් දෙන්නේ රුපියල් ලක්ෂේද කියා සිතා

තරුණයා අමනාපයෙන් යන්න ගියා. ඊළඟට පැමිණි තරුණයා දැවැද්ද ගැන ඇහුවේවත් නැහැ. ඉතා සතුටට පත්වූ ධනවතා කිවා, මගේ දුවට දැන් 23යි. එයාගේ ජීවිතයේ එක වසරකට රුපියල් ලක්ෂය බැගින් මම ඔයාට දැවැද්ද රුපියල් ලක්ෂ 23ක් දෙනවා කියා. තරුණයා කිවා, එහෙනම් මම තව අවුරුදු 12කින් ඔයාගේ දුවව බඳින්න එන්නම්. එසේ කියා යන්න ගියා.

85. දවසක් මහව ස්ටේෂන් එකේ ඉන්දිද්දී  වේදිකාවට බඩු කෝච්චියක් ආවා. මගේ යාලුවෙක් විහිලුවට වගේ කිව්වා බඩු කෝච්චිය ආවා, බඩු ඉක්මනට නග්ග ගන්න කියලා. එතකොට එතන හිටපු කාන්තාවක් මගේ යාලුවට ගහන්න පැන්නුවා.

86. සමන් හරින්ට ඩොලර් 1000 ක ණයක් දුන්නලු. සමන් මේක ඉල්ලන්න හරින්ගේ ගෙදර ගියහම කිව්වලු දැන් නැහැ පස්සේ දෙන්නම් කියල. දවසක් හරින් සල්ලිත් අරන් සමන් හම්බවෙන්න ගියාලු. සමන් ගෙදර නැහැල්ලු. සමන්ගේ නෝනා ඉන්නවලු. නෝනා ඇහුවලු මොකද සමන්ව හොයන්නේ කියලා. මොකුත් නැහැ කියල ඩොලර් 1000 පෙන්නලා කිව්වලු හාද්දක් දුන්නොත් ඩොලර් 1000ක් දෙනවා කියලා. ඩොලර් 1000 ට ආස වෙලා හාද්දක් දීලා එය ගත්තලු. සමන් ගෙදර ආවහම කිව්වලු බලන්න හරින් මට එක හාද්දකට ඩොලර් 1000ක් දුන්නනේ කියලා. සමන් කටවහගෙන හිටියලු.

87. ආදායම් බදු දෙපාර්තමේන්තුවට ලිපියක් ලියන ස්වාමි පුරුෂයෙක් තමන් වැරදි තොරතුරු ලබා දීම ගැන සමාව ඉල්ලනවා. ඔහුගේ ලිපියෙන් කියනවා - 'මා ගෘහ මුලිකයා බවට සටහන් තැබුවා'.

88. 'කොල්ලෝ, මේ පාර අපේ 5 වැනි වසරේ විවාහ මංගල උත්සවය සමරන්න මාව කවදාවත් නොගිය තැනකට ගෙනියන්න'. 'හොඳයි කෙල්ලේ මම එහෙනම් ඔයාව කුස්සියට එක්ක යන්නම්; ගිහින් උයන හැටිත් පෙන්වා දෙන්නම්.'

89. එක්තරා විදේශ මහකොමසාරිස් කාර්යාලයක තිබුනා දැන්වීමක් - නැතිවූ පාස්පෝට් එකකට අලුත් එකක් අයදුම් කිරීමේදී 'නැතිවූ ගමන් බලපත්‍රයේ ෆොටෝ කොපියක් අදාළ අනෙකුත් ලියකියවිලි සමඟ ඉදිරිපත් කළ යුතුයි' කියා.

90. කලකට පෙර මෙල්බර්න් වලදී ටැක්සියක් එලවන අපේ කෙනෙක් සිංහලෙන් බිරිඳට කථා කරලා (හැන්ඩ්ස් ෆ්‍රී) පැසෙන්ජර් ගැනත් කියලා හිනා උනාලු. 'මේකා තඩි මහත සුද්දෙක් . මුගේ බරට තමා පැට්රොල් පිච්චෙන්නේ. මු අපි දෙන්නාටත් වඩා දෙගුණයක් බරයි. මුගෙන් හරිනම් ගානෙන් දෙගුණයක් තමයි ගන්න ඕනේ කියලා. ගමනාන්තයෙදී අපේ ඩ්‍රයිවර් ඉංගිරිසියෙන් කිව්වලු ගාන ඩොලර් විස්සයි කියලා, නමුත් සුද්දා හතළිහක් දුන්නලු. ඒ මොකද කියලා ඇහුවාම සුද්දා කැඩිච්ච සිංහලෙන් මෙහෙම

කියලා බැහැලා ගියාලු 'මට භාවිතයක් නැති නිසා සිංහල කථා කරන්න අමාරුයි. නමුත් මම ලංකාවේ උපන් බර්ගර් කෙනෙක්, ඔබටයි ඔබේ බිරියටයි ජය'.

91. වශී ගුරුකමකට අදාළ තරුණියගේ කෙස්ගහක් ගෙනෙන්න කිව්වාලු. තරුණයාත් තරුණියගේ ගෙදර යාම් ඊම් කිරීමේ පුරුද්දක් ඇති නිසා පපුවත් ඉස්සරහට දමාගෙන පුරුෂ ධෛර්යය අරගෙන ගියාලු. යනකොට තරුණිය සහ ඇගේ තවමත් වයසේ හැටියට මහලු පෙනුමක් නැති ආච්චි එකිනෙකාගේ කෙස් වැටි පීරමින් සිටියාලු. තරුණයට වාඩිවෙන්න කියලා ඔහුට සංග්‍රහ කරන්න බවලතුන් ගේ ඇතුළට ගිහින්.අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් තරුණයා බිම වැටී තිබුන කෙස්ගහක් ඉක්මනට අහුලා ගත්තලු. දවස් හතකට පසුව තරුණියගේ වැන්දඹු ආච්චි අම්මාගෙන් තරුණයාට විවාහ යෝජනාවක් ආවලු. ගුරුකම අති සාර්ථකයි.

92. එක පාරටම යාලුවෙක් මං පැදගෙන යන මෝටර් බයික් එකේ පාර මැදට පැනලා, අත දාලා නවත්තලා කියනවා 'නවත්ත, නවත්ත. ඔන්න ඔයාගේ බයික් එකේ රෝද දෙකම කැරකෙනවා' කියලා.

93. ඔන්න එක නෝනයි මහත්තයයි දෙන්නෙක් කාර් එකේ ගමනක් යනවාලු. කාර් එකේ වේගය සීමාව ඉක්මවලා ගිහිල්ල පොලීසියෙන් නැවැත්තුවාලු. පොලිස් මහතා: මම ඔබට දඩ කොලයක් ලියනවා ඔබ 60 පාරේ අඩු ගණනේ 75න් වත් ගිහින් තියෙනවා. මහත්තයා: නෑ සර් මම 55ට ගියේ. එතකොට නෝනා පැනලා කියනවා: ඇයි අනේ ඔයා

අසූවටනේ ගියේ. පොලිස් මහතා: ඔබගේ සිග්නල් ලයිට් වැඩ කරන්නෙත් නෑ. මහත්තයා: මොනවා, මම දන්නෙත් දැනුයි. එතකොට නෝනා කියනවා: ඇයි අනේ අපි සති ගානක ඉඳන් ඕක දන්නවනේ. ඔයා එක සැරයක් අලවන්නත් හැදුවේ. පොලිස් මහතා: ඔබ සීට් බෙල්ට් දාලත් නෑ. මහත්තයා: ආ මම ඒක ගැලෙව්වේ ඔබ ළඟට බැහැලා යන්න කියලා. නෝනා: ඔයා මේ පිස්සු කියනවා. ඔයා කවදද සීට් බෙල්ට් දැම්මේ. මම හැමදාම කියනවා අහන්නේ නැනේ. මහත්තයා: කට වහපන් ගෑනියේ. පොලිස් මහතා: නෝනා ඔයාගේ මහත්තයා ඔයාට වෙනදටත් කතා කරන්නේ මෙහෙමද? නෝනා: නෑ, එයා බීලා ඉන්න වෙලාවට විතරයි.

94. ආඩම්බරකාර බුද්ධිමතෙක් මෝඩ කොලුවෙක් සමඟ ඔට්ටුවක් ඇල්លුවා. ‘මෝඩයෝ මම නුඹෙන් අහන සෑම ප්‍රශ්නයකටම නුඹ උත්තරය දන්නේ නැත්න්ම් නුඹ මට රුපියල් 5ක් දෙන්න ඕනා. නුඹ මගෙන් ප්‍රශ්නයක් අසා මම උත්තරේ දන්නේ නැත්නම් මම නුඹට රුපියල් 5000ක් දෙනවා. මෝඩ ළමයා ‘හා’ කිවා. බුද්ධිමතා අහනවා ‘මේ ලෝකේ මාහාද්වීප කියක් තියෙනවද?’ මෝඩ ළමයා දන්නේ නැහැනේ, ඒ නිසා රුපියල් 5ක් බුද්ධිමතාට දෙනවා. මෝඩ ළමයා කියනවා ‘දැන් මම ඔයාගෙන් ප්‍රශ්නයක් අහනවා - කකුල් දෙකෙන් සිටගෙන සිටින කකුල් 3න් නිදා ගන්න සත්වයා කුමක්ද?’. බුද්ධිමතා සෑම තැනම උත්තරය සොයා බැරිම තැන කියනවා ‘මම දන්නේ නැහැ මෝඩ ළමයෝ, මෙන්න ඔබේ රුපියල් 5000’, කියා එම මුදල ඔහුට

දෙනවා. ඊට පසු අහනවා 'කමක් නැහැ මෝඩ ළමයෝ මොකක්ද උත්තරය' කියා. මෝඩ ළමයා ඔහුට රුපියල් 5 දෙනවා.

95. නාවික් හමුදාවට බඳවා ගන්නා සම්මුඛ පරීක්ෂණයේදී - 'ඔයා පීනන්න දන්නවද?'. රැකියා අපේක්ෂක - 'ඇයි ඔයාලා ළඟ නැව් නැද්ද?'.

96. ගරාජයේ සේවකයා මැනේජර් හම්බ වෙලා අමාරුවෙන් සික් ලීව් එකක් දාලා එලියට ආවේ පෙම්වතිය සමග චිත්‍රපටය බලන්න. විවේක කාලයේදී පෙම්වතියට අයිස්ක්‍රීම් එකක් අරන් දෙන්න එලියට යන කොට මෙන්න බොලේ ගැරේජ් එකේ මැනේජර් ඉන්නවා ගැරේජ් ඔෆිස් එකේ ටයිප් ගහන බර්නි එක්ක, බොක්ස් එකක් ඇතුලේ. සේවකයා දැක්කා මැනේජර්ව සහ බර්නිව මුහුණට මුහුණ. බර්නි දැන් ලජ්ජාවේ ඇඹරෙනවා, සේවකයාගේ මුහුණවත් ඇය බලන්නේ නැහැ. වෙනදාට හරිම සැර මැනේජර් අමුතු ධෛර්යයක් මවා 'ආ තමුසෙත් මෙහෙද? මං හිතුවා ලෙඩින් කියලා, කමක් නෑ, කමක් නෑ. මේ අපටත් එක්ක අයිසි චොක් දෙකක් අරන් එනවා. තමුසෙත් ඕන දෙයක් ගන්නවා ඉතුරු සල්ලි තියාගෙන', කියා පන්දාහේ කොලයක්ම දෙන ගමන් කියනවා 'මේක කාටවත් කියන්න එහෙම එපා, හොඳේ ?' කියලා.

97. ඩොක්ටර් මගේ මිසිස්ගේ බඩ දෙසට මීයෙක් ගියා, එයා හැමදාම නිදා ගන්නේ කට ඇරගෙන නේ. මං ඉක්මනට

එන්නම්, එතකං එයාගේ කට ලඟට අමු කරවල කෑල්ලක් අල්ලාගෙන ඉන්න. නමුත් ඩොක්ටර් එනවිට ස්වාමියා බිරිඳගේ කට ලඟට මාළු කූරියෙක් අල්ල්ලගෙන සිටියා. මම කිවුවේ අමු කරවල කෑල්ලක් අල්ලා ගෙන ඉන්න කියලානේ කියා ඩොක්ටර් කිවා. හරි, ඩොක්ටර්, ඒත්, මියාට කලින් මීයාගේ පස්සෙන් එලවපු බලලාව එලියට ගන්න එපායැ' ස්වාමියා කිවා.

98. දෂ්ට කරපු සර්පයා අඳුනනවද කියල දොස්තර මහත්තය ඇහුවලු .යාළුවා කිව්වලු, අඳුනනවානම් දෂ්ට කරනවද මහත්තයෝ කියලා.

99. විභාගයේදී ලකුණු 0 ක් ගත් සිසුවකුගේ ප්‍රශ්න පත්‍රයෙන් කොටසක් 1)වීර පුරන් අප්පු මැරුනේ කුමන සටනින්ද?පිළිතුර ......ඔහුගේ අවසාන සටනින්. 2)1948 නිදහස් ගිවිසුම අත්සන් කළේ කොහෙදිද? පිළිතුර.....පිටුව යට 3)දික්කසාදය සඳහා ප්‍රධාන හේතුව කුමක්ද?පිළිතුර ...විවාහය. 4)ඔබට උදය ආහාරයට ගත නොහැක්කේ කුමක්ද? පිළිතුර ..දවල් ආහාරය සහ රාත්‍රී ආහාරය 5)අසමත් වීමට බලපාන හේතුව කුමක්ද? සමත් නොවීම.

100. ගෙදර සීලිමේ ඉන්නා හොතාම්භුවා එක්ක ඔයා ඔයතරම් තරහ මොකද. උගෙන් එන ගඳ. එතකොට ඔයාගෙන් එන ගඳ ගැන ඌ මොනවා කියනවා ඇද්ද?

101. මේ ලඟදි අපේ ගමේ ලීබඩු සාප්පුවට ගොඩවුන සුද්දෙක් එහි විකිනීමට තිබුණු කෑම මේසයකට අතින් පොඩි තට්ටුවක් කර ‘දිස් ෂුඩ් බි කොස්ට්ලි’ යැයි කිවේය, එවිට කඩ හිමියා කිවේ ‘පිස්සු කෙලින්න එපා මහත්තයා  කොස් ලී නෙමෙයි, නියම කරුවල ලීයෙන් හදල තියෙන්නේ’ යනුවෙනි.

102. ප්‍රංශයේ මාළු වෙළඳ සලක මැනේජර් ඔහුගේ සහායකයාගෙන් අහනවා, මොකද මේ ශ්‍රී ලංකාවෙන් එන කකුළුවෝ විතරක් පියන නොගැසූ භාජනවලට ඔයා දන්නේ කියා. ඔහු කියනවා ‘ඕන නැහැ සර් ශ්‍රී ලංකාවෙන් එන කකුළුළුවෝ හරියට ඒ රටේ මිනිස්සු වගෙයි. එකෙක් උඩට නැග ගෙන එනකොට අනිත් උන් ඌව පල්ලේහාට ඇදලා දානවා’ කියා.

103. මොලයක් බද්ධ කරීමට දොස්තර මහත්තයා කලාකරුවෙකුගේ මොලයට රුපියල්  2යි, කාර්මිකයෙකුගේ මොලයට රුපියල් ලක්ෂ 5යි, හැබැයි දේශපාලනඥයෙක්ගේ මොලයකට රුපියල් ලක්ෂ 50යි, ඒ මොකද? ඒවා කවදාවත් පාවිච්චි නොකරන මොල.

104. දේශපාලනඥයයා - මට චන්දෙදි තමුසේගේ සහාය අවශ්‍යයි. චන්ද දායකයා - මම අනිත් පක්ෂයේ එක්කෙනාට පොරොන්දු උනානේ. දේශපාලනඥයයා -දේශපාලනයේදී පොරොන්දු වෙන එක දෙයක්, කරන දෙය තව දෙයක්. චන්ද දායකයා -එහෙමද, මගේ සහයෝගය ඔයාට ලැබෙනවා එහෙනම්.

105. 1 වැනි ධනවත් කාන්තාව - මගේ දියමන්ති මම හෝදන්නේ විස්කි වලින්, රතුකැට වයින් වලින්, නිල් මැණික් බ්‍රැන්ඩි වලින්. 2 වැනි ධනවත් කාන්තාව - මගේ මැණික් මම ශුද්ධ කරන්නේ නැහැ, කිළුටු වුනහම මම විසි කරනවා.

106. ගුරුතුමා - කලිසම ඒක වාචිකද, බහු වාචිකද? ශිෂ්‍යයා - උඩ කැල්ල ඒක වාචිකයි, පහල බහු වාචිකයි.

107. මිතුරෙක් තව මිතුරෙකුට - බලන්න මගේ අසල්වැසියා මට රුපියල් 5,000ක් ණයයි ගෙවන්නේ නැහැනේ, මොකද මම කරන්නේ?'. 'සල්ලි දුන්නා කියලා රිසිට් පතක් තියෙනවද?' 'නැහැ'. එහෙනම් ඔබ ඔහුට ලිපියක් ලියන්න 'මට ඔබ රුපියල් 50,000ක් ණයයි, වහාම ගෙවන්න කියලා.' යාළුවා කියනවා 'බැහැනේ, මිනිහා මට රුපියල් 5000නෙ ණය'. 'ඒක තමයි, එතකොට මිනිහා ඒ උත්තරය ඔයාට එවයි, එතකොට ඔයාට ඕන සාක්කි ලැබිලා'.

108. දිනක් 1980 ගණන් වල මම පණිවිඩයකට අගනුවර සිට ටෙලිෆෝනයෙන් ගෙදරට කතා කලෙන් නිවසේ සිටි මල්ලි රිසිවරයේ සිට කවුරුත් ගෙදර නැහැ කී විටකතාව අවසානේ මම ඔහුට කීවා ඔයා දැනුත් සිගරැට් බීල නේද ඉන්නේ?.නැහැ ඔයා කොහොමද අක්කේ එහෙම කියන්නේ ?මම කීවා රිසිවරෙන් මට ගඳ එනවා මල්ලී

කියලා . ඇත්තද අක්කේ, අනේ සොරි, මම එකක් බීවා තමයි, ආයේ බොන්නේ නැහැ, මම නවත්තනවා.කීවා. එදා ඉඳලා එයා බිව්වේ නැහැ.

109. එක් ස්වාමියෙක් බිරිඳගේ දැඩි ඉල්ලීම නිසා ඇයට මිල අධික වූ ඕර්ගන් එකක් ගෙනත් දුන්නා. එදින සිට ඇයගේ එකම කාර්යය වූයේ එය වාදනය කරමින් ගීත ගායනයයි. ටික දිනකින් ඔහු තම බිරිඳට යෝජනා කරන්නේ ඕර්ගන් එක විකුණා ඒ මිළට ගැලපෙන ෆ්ලුට් එකක් ගෙනෙන්නටය. පසුව එය ක්‍රියාවට නැංවූ අතර ඒ පිළිබඳව ඔහුගේ මිතුරකු විමසූ විට ඔහු කියා සිටියේ,'ෆ්ලුට් එක ගහනකොට සින්දු කියන්නන බැහැනේ ඒ නිසා මං නෝනට ෆ්ලුට් එකක් ගෙනත් දුන්නා' යනුවෙනි.

110. තරුණිය - ඩාර්ලින් ඔයා මගේ විවාහ මංගල්‍යය දා මට රිං එකක් දෙනවද? 'ඔවු ඔවු, මොකක්ද ඔබේ නොම්බරය?'

111. එක සංචාරකයෙක් යාල සචාරයක ගිහිල්ලා ඇවිල්ලා වූ දෙයක් යාලුවෙකුට කිව්වලු. මේ සංචාරකයා කළේ යාලේ (අනවසරයෙන්) ඇවිදින්න යනකොට දිවියෙක් කඩා පැනලා මෙයා දුවන්න පටන්ගත්තලු. දිවියා මෙයාව අල්ලගන්න ළගටම එනකොට දිවියව ලිස්සලා වැටුනලු. මෙයා දුවනවලු. ආයිත් දිවියා මෙයාට ළං වුණ ගමන් දිවියව වැටුනලු.ඔය අතරේ වනජීවී කාර්යාලේ ගෙයක් තිබිලා මෙයා ගෙට රිංගලා දොරවහගෙන.මේ කතාව අහගෙන

හිටපු යාළුවා කියනවා උඹේ නිර්භීතකම හින්දා මිසක් මට එහෙම නම් එතනම මළපහ යනවා. එතකොට සංචාරයට ගිය යාළුවා කියනවා 'ඔයා හිතන්නේ දිවියා ලිස්සලා වැටුනේ මොනවා පැගිලා කියලද?'

112. ප්‍රංශ ස්ටේසමේ කෝච්චිය එනකම් ඉන්නකොට චීන ලඳක් හම්බුනා. ඉංග්‍රීසියෙන් නම ඇහුවහම කැඩිච්ච ඉංග්‍රීසියෙන් කිවුවා - සෙක්ස්, සෙක්ස්, සෙක්ස්, ෆ්‍රී සෙක්ස් ටු නයිට් කියලා. මාව කලන්තේ දාලා ගියා. ළඟ හිටපු එයාගේ යාළුවා මට කියනවා '6 6 6 3 6 2 9'

113. බ්‍රිතාන්‍ය ජාතික තරුණ ළමෝ දෙදෙනෙක් ශ්‍රී ලංකාවට සංචාරයකට ඒමට ලෑස්ති වෙනවා. එක් පියෙක් ඔවුනට උපදෙස් දෙනවා 'ඔය ලංකාවේ ත්‍රී වීල් කාරයෝ විශ්වාස කරන්න එපා. ඔවුන් ඔබලාට වංචා කරාවි, පරිස්සමෙන්'. කොලඹදී තරුණයෝ දෙදෙනා ගාලුමුවදොර සිට ඔවුන්ගේ ගල්කිස්ස හෝටලයට යන්න ත්‍රී වීලයකට ගොඩ වෙනවා. ත්‍රි විල් කරු නිවැරදිව රුපියල් 420ක් අය කරනවා. එක් තරුණයෙක් එවිට කියනවා 'මගේ පියා කිවා කොළඹ ත්‍රී විල් කාරයෝ විශ්වාස කරන්න එපා කියා 'මම ඔබට දේන්නේ රුපියල් 300ක් පමණයි කියා රුපියල් 300ක් පමණක් දෙනවා. අනිත් තරුණයද කියනවා 'ඔව් මමත් ඔබට දෙන්නේ රුපියල් 300ක් පමණයි කියා එයාත් රුපියල් 300ක් දෙනවා.

114. ඉතාම උගත් මහාචාර්යවරයා විදේශ සංචාරය නිම කර ආපසු ශ්‍රී ලංකාවට ආවා. දැන් අපේ පුතා ඇවිදිනවනේ, බිරිඳ කිවා. දැන් කොච්චර කල්ද? දැන් මාසයක්. ආ, එහෙනම් ගොඩක් දුර ගිහිං ඇති.

115. දුරකතනයෙන් කථා කරන්නා - 'සර් අද 8 පන්තියේ කමල් ඉස්කෝලේ එන්නේ නැහැ, සනීප නැහැ'. විදුහල්පති - 'ඔය කවුද කථා කරන්නේ? ' දුරකතනයෙන් කථා කරන්නා -'අපේ තාත්තා'.

116. ඇමති මණ්ඩලය ගණන ඉල්ලක්කම් තුන ඉක්මවිය යුතුම  ගණනක් බව රාජ්‍ය නක්‍ෂත්‍ර කරු දන්වලා, මහා කලබලයක්. කුස්සියේ පොල්ගෑම, අටු කොස්, හබල පෙති, මඩ පුවක් සහ දියබුන් ගෑහීම සඳහා ඇමතිලා 5 දෙනෙක් වහාම පත් කරලා. එකක් ලක්ෂ 400ක් වන අලුත්ම මොන්ටෝරෝ  රථ 5ක් එදාම ඕඩර් කරලා, එක්කෙනෙකුට බොඩි ගාඩ්ස්ලා 10 දෙනෙක් එක්ක.

117. අධික ලෙස ලෝහ රසායන විද්‍යාව උගන්වන ගුරුවරයා ළමුන්ට ප්‍රායෝගික පාඩමක් කරමින් සිටියා. ළමයි දැන් මම මේ රුපියල් 10 කාසිය මේ ඇසිඩ් බඳුනට දානවා, ඒ කාසිය දිය වෙයිද?. නෑ සර්, ළමුන් සියලු දෙනාම එක වරම අත් උස්සාගෙන කිවා. බොහොම හරි, ඇයි ඔගොල්ල එහෙම කිවුවේ? කාසිය දිය වෙනවා නම් සර් කවදාවත් ඒක ඇසිඩ් වලට දාන්නේ නැහැ.

118. දවසක් මගේ යාලුවෙක් හබරණ පාරේ පයින් යනකොට අලියෙක් පන්නගෙන ඇවිල්ලා. යාළුවා දුවලා දුවලා ගිහිල්ල බෝක්කුවක් යටට රිංගලා. අලියා බෝක්කුව ගාවට ඇවිල්ලා එක පැත්තකින් හොඩවල දැම්මලු .යාළුවා එතකොට අනිත් පැත්තට ගියාලු .මෙන්න අලියාත් අනිත් පැත්තට ගියාලු ගිහින් හොඩ වැල දානකොට මගේ යාළුවා අනිත් පැත්තට යනවලු. ඔහොම දෙතුන් ගමනක් කරලා අලියා ගිහිල්ල ලොකු ගල් ගෙඩි දෙකක් ගෙනල්ල දෙපැත්තේ හිර කරලා ගියාලු. මෙන්න පැය බාගයකට විතර පස්සේ තවත් අලියෙකුත් එක්ක ඇවිත් ගල් දෙක අයින් කරලා දෙන්න දෙපැත්තෙන් හොඩවැලවල් දෙක දැම්මලු. යාළුවා  හොඩවැල් දෙකටම ඇඟිලි දෙකක් එබුවා. අලි බයවුණා කටුස්සා රිංගුවා කියලා. උන් බයේ පැනලා දිව්වා. ගල් අයින් කරලා යාළුවා ගෙදර ගිහිල්ලා.

119. කාන්තාවක් දොස්තර වෙත ගොස් කියනවා, තමන්ගේ ශරීරයේ කොතැනක හෝ  තමන් අල්ලන කොට විශාල වශයෙන් රිදෙනවා කියලා. දොස්තර කිව්වා ඒක වෙන්න බැරි දෙයක්, කමක් නැහැ පෙන්නන්න කියලා. ඇය ඇඟිල්ලෙන් උරහිස අල්ලලා හූ තියනවා වේදනාවෙන්.  ආයි ඇඟිල්ලෙන් දණහිස අල්ලනවා, කෑ ගහගෙන පස්සට පනිනනවා, විලුඹ අල්ලලා මර ලතෝනි දෙනවා, මේ විදියට අල්ලන හැම තැනම වේදනායි කියලා කෑ ගහනවා. කියනවා. දොස්තර බලලා කියනවා ‘ඔයාගේ ඇඟිල්ල කැඩිලා’.

120. ඉස්සර නිතර ලෙඩින් වගේ හිටපු, ඔබට හරියට කරදර කරපු ඔබේ නෝනා දැන් ශාන්ත දාන්ත තීන්ත කුඩුව

වගේ; ඒ මොකද, හොඳ දොස්තර කෙනෙක්වත් හම්බ වුනාද? ඔවු. හොඳ දොස්තර කෙනෙක් හම්බ උනා. එයා නෝනාට කිවා ඔයාගේ ඔය නිතර තරහකාරී, තරහකාරී ගති මහළු වයසේ පෙරනිමිත්තක් බව. එදායින් පස්සේ මගේ නෝනාට කිසි ලෙඩක් නැහැ.

121. විවාහවීමට ආසාවෙන් සිටින තරුණයෙක් සිය මිතුරාට කියනවා 'සෑම විටකම මම කෙනක් ගෙදරට ගෙන ආ විට මගේ මව ඒ අයට කැමති නැහැ' කියා. යහළුවා කියනවා 'ඒක් ලෙහෙසි දෙයක්, ඔබ ඔබේ මව වගේම කෙනෙක් ගෙනත් පෙන්නන්න'. තරුණයා කියනවා 'මම ඒකත් කළා, එයාට මගේ තාත්තා කැමති නැහැනේ' කියා

122. 'ඔයා ඇත්තටම මට ආදරේද?' 'ඔවු'. 'එහෙනම් වෙන කාවහරි බඳින්නකෝ.'

123. රූමත්, ගෞරවනීය කාන්තාවක් ෆාර්මසියට ඇතුළු විය. කවුන්ටරය වෙත පැමිණි ඇය ඖෂධවේදියාගෙන් සයනයිඩ් මිලදී ගත හැකිදැයි විමසීය.දෙවියනේ මොකටද ඔබට සයනයිඩ්? ඔහුට කියැවුනි. මගේ සැමියා මරාදමන්න. ගැහැණිය පිළිතුරු දුනි .බැහැ බැහැ කොහොමටවත් දෙන්න බැහැ එය නීතියට පටහැනියි මගේ බලපත්‍රය නැතිවේවි අපි දෙන්නටම හිරේ යන්න වේවි. ඖෂධවේදියා කීය. සත්තකින්ම නැහැ යැයි පැවසූ ගැහැණිය අත් බෑගයෙන් ඖෂධවේදියාගේ බිරිද සහ ඇගේ සැමියා ඇදක් මත සිටින ඡායාරූපයක් න පෙන්වීය. ඖෂධවේදියා මෙසේ පැවසීය: 'කලින් කියන්න එපායැ මෙන්න සැරම එක'.

124. මගේ නැන්දා කෙනෙක් රඟපාපු නාට්‍යය කණ්ඩායමත් එක්ක මමත් පොඩි ළමයා කාලේ රට වටේම ගියා. නාට්‍යයේ නම - 'හරි යනකොට ඔහොම තමයි'. හවස නවාතැන් ගන්න පාසල් ශාලාවකට එනකොටයි දැක්කේ බස් එකේ ගහලා තිබුන විශාල් බැනර් එකේ 'හ' යන්න කවුද 'න' කරලා.

125. පිටිසර දුරකථන සහ විදුලිය කොහොමත් නැති, ජල පහසුකම් අඩු දුෂ්කර ගැමි ප්‍රදේශයක එක දවසක් අපේ යාලුවෙකුට ඇහෙනවලු ළඟ ගෙදරකින් 'ඉන්ටනෙට්එක දාන්න, ඉන්ටනෙට්එක දාන්න' කියලා වයසක කාන්තාවකගේ කටහඬක්. මිනිහට හරි පුදුමලු විදුලිය වත් නැති මෙහෙ මොන අන්තර්ජාලද කියලා. පස්සේ හෙමිහිට හොයලා බැලුවමලු තේරුනේ ඒ ගෙදර ඉඳලා තියෙන්නේ වයසක ජෝඩුවක් විතරලු. ඇහිලා තියෙන්නේ 'ඉන්ට, නෙට් එක දාන්න' කියලලු (ඒ ප්‍රදේශයේ හරියට මදුරු කරදරලු).

126. අපේ ගමේ ඇට වර්ගයක් යොදාගෙන කරන සූදු ක්‍රීඩාවේ යෙදෙනවා තරුණයන්. හරියටම ඒ අවස්ථාවල් වලට පොලිස්සියේ සාජන් මහත්තයෙක් කඩා පනිනවා. ක්‍රීඩාවේ යෙදෙන තරුණයෝ පැන දුවනවා. බිම දමා තිබෙන තරුණයන්ගේ මුදල් ඔට්ටු එකතු කර ගෙන සාජන් මහත්තයා සාක්කුවේ දමාගෙන යන්නට යනවා. කාටවත් නඩු නැහැ.

127. තරුණ ළමයෙක් වඳුරෙක් ඔහුගේ උරහිස උඩ තියාගෙන පාරේ ඇවිදිනවා. මෙය දුටු පොලිස් කාරයෙක් 'මම හිතන්නේ ඔබ ඔය වඳුරාව සත්තු වත්තට ගෙන යා යුතුයි' කියා. ඊට දින කිහිපයකට පසු මෙම ළමයා වඳුරා තම උරහිසේ තබා ගෙන නැවතත් ඇවිදිද්දී එම පොලිස් කාරයාවම හමු වෙනවා. පොලිස් කාරයා කියනවා 'මම කිවානේ ඔය වඳුරාව සත්තු වත්තට ගෙනි යන්න කියා'. එවිට ළමයා කියනවා 'ස්තුතියි, ගෙනිච්චා. අද මා ගාව ඉතුරුවෙච්ච සල්ලි ටිකක් තියෙන නිසා එයාව මම අද චිත්‍රපටියක් බලන්න චිත්‍රපට ශාලාවට ගෙනි යනවා' කියා.

128. දවසක් ළමයෙක් තාත්තාට කියනවලු අපේ අම්මාත් ළමා අයිතිවාසිකම් අමු අමුවේ උල්ලංඝනය කරනවා තාත්තේ කියලා. තාත්තා ඇහුවලු ඇයි පුතේ කියලා. ඇයි කියන්නේ මට නිදිමත නැති වෙලාවට බලෙන් නිදි කරවනවා. නිදිමත තියෙන වෙලාවට ඇහරවනවා කිවුවලු.

129. 'ඔබගේ ප්‍රථම මධු සාමය සහ දෙවන මධු සාමය අතර වෙනස කුමක්ද? 'නයගරා සහ වයගරා'.

130. අපේ ගෙදරට නයෙක් ඇවිත් ෆ්රොස්ට් ෆ්‍රී ෆ්රිජ් එක යට දරන ගහගෙන ඉන්නවා.

131. මම තාත්තත් එක්ක ඉස්කොලේ ගියා අපේ ප්‍රාඩෝ එකෙන්. මට පීඩ්සා එකක් අරන් දෙන්න තාත්ත ඩොමිනෝ

එකට බැහැල ගියා. පසුව ගිහින් බලන කොට අපේ ප්‍රාඩෝ එක අරන් යනවා වෙන කෙනෙක් එයාගේ මොන්ටොරෝව එක තියල. පස්සේ අපේ තාත්තා ඔෆිස් ගියේ ලක්ෂරි කැබ් එකක් හයර් කරලා.

132. ලොකු නයෙක් ගියා. හස්බන්ඩ් ගේ අලුත් පෝෂ් කාර් එක අයිනෙන් ගෙයි මැද සාලෙන් රට ටයිල් කරපු පෝටිකෝව යටින් රිංගලා ලේදර් පුටු සැට් එකෙන් වයිඩ් ස්ක්‍රීන් ප්ලාස්මා ටීවී එක උඩට නැගල හයිෆයි සෙට් එක උඩිනුත් බඩගාලා බැස්සේ අලුත්ම LG වොෂින් මැෂින් එක යටට. ඌව අයින් කලේ අබාන්ස් එකට කොන්ත්‍රාත් දීලා යුනිෆෝර්ම් ගහපු සේවකයෝ ඇවිල්ලා.

133. මගේ ගැන කියනවනාම් - මගේ ගෙදර ලක්ෂ 900, මගේ කාර් එක ලක්ෂ 360, මගේ දුරකතනේ ලක්ෂ 2, මගේ ඔරලෝසුව 40,000, මගේ පඩිය මාසෙට ලක්ෂ 16, මගේ වයස 35, මගේ ගම දකුණේ, මගේ හිත සංවේදියි, මම පුණ්‍ය කටයුතුවලට දෙන මගේ අදායම් බද්ධ 25%.

134. අපේ ගෙදරට ගැරඩියෙක් රිංගල වෙච්ච දෙයක්. ගෙනාපු අලුත් අගල් 32 ටීවී එක උඩින් ගිහින් සෝෆා එක අස්සට රිංගුවා.පස්සේ කාමරේ තිබ්බ බුරුත අල්මාරිය යටින් කුස්සියට ගියා. රටින් ගෙනාපු වෙස්ටින්හවුස් ෆ්‍රිජ් එක උඩින්, ගැස් කුකර් එක අස්සෙන්, අවන් එක ලගට අවා බඩගාගෙනම. පස්සේ මයික්‍රෝවේව් එක උඩ තිබ්බ ක්‍රාෆ්ට් චීස් බෝල තුනක්ම ගිලලා දැම්මා. ඌගේ වලිගෙ වැදිලා අක්කා ඇමරිකාවෙන් එවපු පීනට් බටර් බෝතලේයි,

ස්ට්‍රෝබෙරි ජෑම් බෝතලෙයි  කුඩේ කුඩු. මම දිවුවා, අම්මෝ මම පුදුම බෙරිල්ලකින් තමයි බේරුනේ.

135. මේ චිත්‍රය කීයද? රුපියල් ලක්ෂයයි. ඇයි ගිය මාසේ පනස් දාහයි කීවානේ. ඔවු තීන්තවල ගාන දැන් නැගලා.

136. සුද්දට සුද්දා කියන්නේ මොකද? හම සුදු හින්දාද? නැත්නම් එයාපෝර්ට් එකෙන් බැහැපු වෙලේ ඉඳලා එයාලා ආපහු එයාපෝර්ට්එකෙන්  යනකම්ම සුද්දෙ දාන හින්දද.

137. ඇයි මිනිස්සු  ඔයාට ෆැන්ටාස්ටික් කියන්නේ. මගේ තාත්තා ඇල්කොහොල් බොන නිසා මිනිස්සු එයාට ඇල්කොහොලික් කියනවා, ඒ නිසා මම තීරණය කළා ෆැන්ටා බොන්න.

138. මටත් සිගරට් එකක් දෙන්න. මම හිතුවා ඔයා සිගරට් බීම නවත්තලා කියලා. ඔවු මම සල්ලි දීලා සිගරට් බීම නැවැත්තුවා.

139. බොහොම ප්‍රසිද්ධ ලංකාවේ කෙනෙක් පිටරට (ඇමරිකාවේ) ප්‍රසිද්ධ හෝටලේක නතර වෙලා හිටියලු. කොහොම හරි විටක් කන්න අමතක කරන්න බැරි නිසා පුරුද්ද එහෙදිත් මතුවුණාලු. හෝටලයේ හොඳ පුටුවක හරිබරි ගැහිලා හපයක් දාලා ළඟ තිබුණු හබරල වගේ ලොකු මල් ගහකට ගැහුවලු තුන්  පාරක්. අනේ වැඩ කරන අය මල් පෝච්චිය හෝදන්න අරගෙන යනකොට මේක දැක්කලු මල් පැල සප්ලයිකාරයෙක්, ටක් ගාලා පින්තූරයක් අරගෙන

ඒ මල් පෝච්චියට සල්ලි ගෙවන්නම් කියලා ලොකු ගානක් ගෙවලා අරගෙන. මැනේජර් මිනිහට අපේ එක්කෙනාව පෙන්නලා. මල්ල කරේ කියලා දැන ගත්ත අපේ මැන් කීච්චාලු ඩිසයින් එක ගහන මැෂිම කාමරේ තියෙන්නේ කියලා. පෝච්චි සියකට එවලේම ඕඩරේ දීලා, බර ගානක ඇඩ්වාන්ස් එකකුත් එක්ක. අපේ මැන් 8 වන තට්ටුවේ කාමරේ ඉඳලා බුලත් කනවා කෙල ගහනවා, බුලත් කනවා කෙල ගහනවා. ඩොලර් ලක්ෂ ගානක් හම්බ කරලා. අලුත් ඩිසයින් එක ඒ රටේ පත්තරවලත් ගිහිල්ලා. පස්සේ හෝටලේ මැනේජර්ටම එපාවෙලා (කාපට් වලත් බුලත් කෙළලු) සල්ලි එපා කාමරෙන් යන්න කියලා යවලා දාලා.

140. මොකද මේ කනක් පිච්චිලා? රත්වුණ ඉස්තිරික්කයෙන් කෝල් එකක් කියලා හිතලා කනට ගත්තා.

141. සයිමන් නිශ්ශබ්ධව තම හරකා ලවා කුඹුර සී සැවා. ඔය හරකාට ටිකක් හයියෙන් කෑ ගහන්නකෝ ඌට හයියෙන් යන්න කියා යාබද කුඹුරේ වැඩ කරන ඔහුගේ මිත්‍රයා වන උක්කුවා කෑ ගසා කිවා. මූ ගිය අවුරුද්දේ මට ගෙරෙව්වා, එදායින් පස්සේ මගේ මූත් එක්ක මගේ කථා බහක් නැහැ.

142. ටච්මේ බෝල සෙල්ලම් කරද්දී ගමේ කොලුවෙක් අතින් අසල කඩේක විදුරු ජනේලයක් බිදිලා බෝලයක් වැදිලා. අලාබය රුපියල් එක්දාහක් ගෙවන්න කියලා කොලුවාගේ අම්මා කැදවලා. මේ අලකලන්චිය පියාටත්

ආරංචි වෙලා සවස වැඩ අවසන් කර එන ගමන් බසයෙන් බැස, කඩේට ගොඩවැදී, කොලුවාගේ පියා බව නොඅඟවා, කැඩුන ජනෙල් වීදුරුව රුපියල් පන්සියක් දෙනවා නම් දාලා දෙන්නම්කෝ කියලා. හා හා ඕකට යන්නේ රුපියල් දෙසිය හතලියයි වැඩිපුර රුපියල් තුන්සීය හැටක්ම අමතර ඉල්ලනවානේ කියද්දී, මුදලාලි මේ වීදුරුව කැඩුනේ මගේ පුතා අතින් මෙන්න රුපියල් දෙසිය හතළිය කියා රුපියල් දෙසිය පනහක්ම දී යන්නට ගිහින්.

143. තම සියා ලගට දිව ආ මුණුබුරා ‘සියේ අලුත් ෆිල්ම් එකක් ඇවිල්ල තියනවා යමුද බලන්න ''මට මේ වයසේ මොන ෆිල්ම් ද බන් කොල්ලෝ’ කියා  සියා කීය. නෑ සියේ ඒ ෆිල්ම් එකේ තියෙන්නේ වඳුරු රැලක් එක්ක කැලේ ජීවත් වෙන ලස්සන ගෑනු ළමයෙක් ගැන. කතාවේ මුල ඉඳල අගටම ඒ ගෑණු ළමය ඇඳගෙන ඉන්නේ කොළ අතු කැල්ලක් විතරයි. ‘හා හා යමන් එහෙනම් කාලෙකින් වඳුරු රැලක් දැක්කේ නැහැ.’

144. කාසාදයත් හිරගෙයක් වගේ හින්දලු කසාද බන්දලා දෙන එකට හිර දෙනවා කියන්නේ.

145. ඔන්න දවසක් සැමියා පත්තරයක් කියවමින් ඉන්නකොට, බිරිය කේන්තියෙන් ඇවිල්ලා කොසුපාරක් දීලා බනින්න ගත්තලු. සැමියාට හිතාගන්නත් බැරිලු මොකද මේ කියලා. බිරියට සැමියාගේ සාක්කුවේ තිබිලා ‘නියෝමි’ කියලා ලියපු කොලයක් අහුවෙලා. කවුද ඒ කියලා ඇහුවලු.

සැමියා, අනේ ඩාර්ලිං ඒ මම ඊයේ ඔට්ටු අල්ලපු අශ්වයනේ කියලා කියුවලු. වයිෆ් ලැජ්ජාවෙන් හිනා වෙලා සමාව ගත්තලු. ඊළඟ දවසෙත් මෙන්න බොලේ එකපාරටම මේ මනුස්සයට නොනවත්වා තඩිබාන්න ගත්තලු.මොකද මේ අදත් මට තඩි බාන්නේ කියලා ඇහුවලු. ඇය තරහෙන් පුපුරමින් 'අන්න තමුසෙගෙ අශ්වයා ෆෝන් එකෙන් තමුසෙව අහනවා' කියලා කියුවලු.

146. වය්ෆ් එක්ක ඩිඩා ඉන්දියාවට යන්න ගුවන් යානයට ගොඩවුණා. එම යානය මහල් දෙකකින් සමන්විතයි. දෙදෙනාම යානයේ උඩුමහලේ ආසනවල වාඩිවුණා. නමුත් ඩිඩා හා නෝනා ගුවන් ටිකට් ලබාගෙන තිබුනේ පහත මහලයේ ගමන් කිරීමටයි. ටික වෙලාවකින් එහි පැමිණි ගුවන් සේවිකාවක් කියා සිටියේ දෙදෙනාට පහත මහලයේ ආසන වලට යන ලෙස කරුණු පැහැදිලි කරමින්ය. ඩිඩා සහ නෝනා කීවේ අපිට ගුවන් යානයේ ඕනෑම තැනක වාඩිවීමේ අයිතිය ඇතිබවයි. මේ වනවිට එම ආසන දෙක හිමි මගින් දෙදෙනාද ඒ අසළට පැමිණ සිටියා. අවසානයේදී මෙම ප්‍රශ්නය ගුවන් නියමුවාට යොමු කළා. එහි පැමිණි නියමුවා ඩිඩාට සහ නෝනාට යමක් කනට කොඳුරා කියූ සැනින් දෙදෙනාම ඔවුන්ගේ ගමන් මලු රැගෙන පහත මහලයේ ආසනවලට ගොස් වාඩිවූණා. පසුව ගුවන් සේවිකාව නියමුවාගෙන් අසා සිටියේ ඔයා අර දෙන්නට මොනවද කිවුවේ යනුවෙනි. ගුවන් නියමුවාගේ පිළිතුර වුයේ, ගුවන් යානයේ කාර්මික දෝෂයක් ඇති බැවින් පැය අටක ප්‍රමාදක් නිසා යානයේ උඩු මහල ගුවන් ගත නොවන බවයි.

147. බිරිඳ සැමියාට මෙසේ කීය. ඒයි මගේ හැට්ටේ කටුව ගහනවකෝ. 'කෝ දෙනවා, තමුසෙලා මහා ලොකුවට අයිතිවාසිකම් ගැන කතාකරනවා, මේ ලෝකේ පිරිමි නැත්නම් තමුසෙලට හැට්ටේ කට්ටක්වත් ගහගන්න කෙනෙක් ඉන්නවද'?. අනේ නිකන් ඉන්නවා, මේ ලෝකේ පිරිමි නැත්තම් කටුගහන්න නෙමෙයි, හැට්ට අදින්න ඕනැත් නැහැ.

148. පෙම්වතා සිය පෙම්වතියට කියනවා 'මට ඔයාට කියන්න ඉතා වැදගත් දෙයක් තියෙනවා. මම මෙච්චර කල් ඔයාට බොරු කලේ, මම බැඳලා ළමයි 4 දෙනෙක් ඉන්න තාත්තා කෙනෙක් කියලා. පෙම්වතිය කියනවා, ආනේ මම බය වෙච්ච තරමක්, මම හිතුවේ මේ කාර් එක ඔයාගේ නොවෙයි කියා කියයි කියාලා.

149. පොලිස් නිලධාරියා වෙත ඉක්මන් ගමනින් ආ පොඩි එකෙක් මෙසේ කිවේය. අනේ අන්කල් විගහට එනවද? අපේ තාත්තා අතන බාර් එකේ රණ්ඩු වෙනවා. දරුවාද සමග සැනෙකින් බාර් එකට ආ නිලධාරියා එහි තිදෙනෙකු ගහගන්නා අයුරු දැක මෙසේ ඇසුවේය. දැන් පුතා මේ තුන් දෙනාගෙන් පුතාගේ තාත්තා කොයි එක්කෙනාද? හරියටම දන්නේ නැහැ අන්කල්. ඒක දැනගන්න තමයි තුන්දෙනාම මේ රණ්ඩුවෙන්නේ.

150. චිත්‍රපටිය බැලීමට ගිය පීරිස් මහතා එය බැලීම පසෙක ලා නිදා ගත්තා, මහා හඬින් ගොරවමින්. ඔහුට එහා පැත්තෙන් සිටි කෝලිතට මෙය කරදරයක් උනා. ඔහු පීරිස් මහතාට තට්ටු කර ඔච්චර හයියෙන් ගොරවන්න එපා කියා

කිවා. මොනවද ඔය ෆිල්ම් එකේ බලන්න තියෙන්නේ, ඉවර වෙනකම් නිදා ගන්නවා මිසක් කියා පිරිස් මහතා නැවත නිදා ගන්න හැරුනා. පික්චර් එක බලන්න නොවෙයි, මටත් මේ පොඩ්ඩක් නිදා ගන්න ඕන, කොහොමද ඉතින් ඔයා ගොරවනකොට මම නිදා ගන්නේ කියා කෝලිත කිවා.

151. අප්‍රේල් 1 ඔයාගේ දිනය සමරන්නේ කොහොමද? ගෝල්ෆේස් එකේ දිගටම ඇවිදිනවා අමුඩ ලේන්සුවක් විතරක් ගහගෙන; ඇල්ලුවොත් කියනවා දහනායක උන්නැහේට පුළුවන් ඇයි මට බැරි; ඊටත්ම මගේම දිනයනේ.

152. ‘ඔයා මට කඩේ නොගියට කමක් නැහැ, අපේ මහත්තයා සීනි තේ කොල ටික සේරම කඩෙන් මට ගෙනත් දෙනවා’.

153. ඔය කුඩේ පුටුවට හෙත්තු කරලා කුඩෙන් ඉදගන්නකෝ අන්දරේ අතුරේ ගිය හැටි කියල දෙන්නම ඕනෙනම්.

154. ෆ්‍රෙන්ච් නොදන්නා අපේ කෙනෙක් අසනීප වෙලා ප්‍රන්සේ රෝහල් ගතවෙලා ඉන්න වෙලාවක බඩගිනි වෙලා ගෙදරින් දීපු කෙහෙල් කොලේ බැඳපු බත් එක කන්න ගත්තලු . ඒක දැක්ක වෛද්‍යවරයෙක් දැකල හයියෙන් කිව්වලු, ‘බොන් (ඇ)පෙති’ කියල. ලෙඩා අහාර ගැනීම නවතා දීපු බෙහෙත් පෙති සියල්ල බීගෙන බීගෙන ගියාලු.

බොන ගමන් සිතුනලු ප්‍රංස දොස්තරලා හරි හොදට සිංහල දන්නවා ඒකනේ බෙහෙත් බොන්න මතක් කලේ කෑමට පෙර කියලා. පස්සෙයි දැනගෙන තියෙන්නේ ෆ්‍රෙන්ච් වලින් ‘බොන්(ඇ)පෙති’ කියල කියන්නේ ‘සුබ ආහාර වේලක්’.

155. ජනවාරි 1 දාට ප්‍රංශයේ සුබ පතන්නේ ‘බොන් අනේ’ කියලා. ඉතින් අපේ මහත්තයාගේ ප්‍රංශ යාලුවෝ සේරම මට ‘බොන් අනේ’ කිව්වා. ප්‍රංශ බස නොදන්නා මම හිතුවා ‘බොන්න අනේ’ කිව්වා කියලා. කවදාවත් බෝන්නැති මමත් වයින් බෝතලේම බිව්වා.

156. කන් දෙකම පිච්චුන කාන්තාවක් දොස්තර මහතාවෙත පැමිණියේය. මොකද උනේ දොස්තර විමසීය. මම රෙදි මදිනකොට පෝන් එක වැදුණා. වැරදිලා අයන් එක කනේ තියා ගත්තනේ. ඉතින් අනිත් කනත් පිච්චිලානේ? දොස්තර විමසීය. ඔව් ඒ හාදයා ආයි කතාකලානේ.

157. පිඟන් පොලේ ගැහුවේ මට තරහ ගිය නිසා. මං හිතුවා ලාබ පිඟන්ද කියලා චෙක් කරලා බැලුවා වෙන්නැති කියලා.

158. එඩ්වර්ඩ් පේදිරිස් ජාතික වීරවරයෙක් කියලා ටීචර් කිව්වහම ළමයෙක් අහලා ටීචර්, එයා හයේ පාරවල් කීයක් ගහලා තියනවද කියලා.

159. දීර්ඝ විවාහයක රහස කුමක්ද? අපි සෑම සතියකම දෙසැරයක් සවසට අවන්හලකට කන්න යනවා. ලස්සන සුවඳැති ඉටිපන්දම් ගැසූ අවන්හලේ රාස්ලිප්ත සංගීතය, සුමුදු ආලිංග නැටුම්. මගේ නෝනා එහි යනවා සෑම අඟහරුවාදා දිනකම, මම එහි යනවා සෑම සිකුරාදා දිනයකම.

160. ටෝනි කියනවා පොලීසියට 'මගේ බිරියට මා අවුරුද්දු දෙකකින් කථා කර නැහැ, හොයන්නෙත් නැහැ. ඇයට බාධා කරන්න මම කොහොමත්ම කැමති නැහැ. පසුගිය වසර තුනම මම කලේ ඇගේ මිනිමරුවාව සෙවීම'.

161. ප්‍රථම වරට ගුවනින් ගිය ගැමියා සහ ඔහුගේ බිරිඳ ඔවුන්ට හිමි ආසනවල වාඩිවී ආසන පටි තදකර ගත්තේ ගුවන් සේවිකාවන්ගේ ඉල්ලීම පරිදිය. යානය ගුවන් ගතවී විනාඩි දහයකින් පමණ ගුවන් සේවිකාවන් යානයේ ගමන් කරන මගීන්ට ආහාර සැපයීමට සමත්විය, ගැමියා සහ බිරිඳ අසලට ආ සේවිකාවක් ඔයාලට මොනවද කන්න ඕනෑ, ටිකට් එකට කෑමත් අඩංගුයි ? චිකන් බුරියානිද, ස්පැගටිද යනුවෙන් ඇසුවාය. දෙදෙනාම කෑම ප්‍රතික්ෂේප කළහ. නැවතත් ඔහුන් අසලට පැමිණි සේවිකාවක් කෝපි, තේ, සිසිල් බීම ඕනෑද? පෙර පරිදි ගැමියා සහ බිරිඳ ප්‍රතික්ෂේප කළහ. පැය 10ක ගමනකින් පසු යානය නියමිත ගුවන් තොටුපලට ළඟාවිය. ගැමියා සහ බිරිඳ අසල සිටි මගියෙක් ගැමියා ගෙන් මෙසේ ඇසිය. ඇයි ඔයාලා දෙන්නා ගුවන් යානයේදී ලබාදුන් ආහාර ප්‍රතික්ෂේප කළේ? ගැමියා මෙසේ පිළිතුරු දුන්නේය. අනේ මහත්තයෝ, අද කාලේ අපේ රටේ

හොඳ හෝටලේකින් කන්න දෙදෙනෙකුට අඩුම ගානේ රුපියල් දෙදාහක්වත් ඕනෑ. ගුවන් යානයේදී අපි කෑම කාලා යානෙන් බහිනකොට බිල දුන්නොත් අපි කොහොමද ඔච්චර ලොකු බිලක් ගෙවන්නේ? ඇයි සේවිකාව කිව්වනේ එකට කෑමත් අඩංගුයි කියලා කිව්වහමයි ඒ දෙන්නට තේරිලා තියෙන්නේ.

162. ‘මට ආඩම්බරයෙන් කියන්න පුළුවන් පසුගිය අවුරුදු 20ටම මම එකම එක කාන්තාවකට පමණයි ආදරය කලේ. මගේ නෝනා දන්නවනම් මට හොඳටම අනියි.’

163. ගුවන් සේවිකාව මෙනු කාඩ් එක දීලා ඇවිත් ඇහුවා මොනවද කන්නේ කියලා මගේ මහත්තයා ගත් කටටම කියුවා ‘අයි වෝන්ට් අ ස්පැනිෂ් ඔම්ලට් කියලා විත් අනියන්ස් ’, කියලා. ගෑනී තරහෙන් කිවුවා දිස් ඉස් නොට් අ හොටෙල් කියලා.

164. මම දන්නා කෙනෙක් ට්‍රිප් එකක් යන ගමන් කොල්ලෝ කෙල්ලන්ට දෙන්න ටෙලිපොන් නොම්මර කොලකෑලි වල ලියන් ගිහින් එක තැනකදී කලබලේට වාහනේ යන ගමන් කොළ කෑල්ල කියල අතේ තිබ්බ සල්ලි ටික විසිකරලා.

165. තරුණ ස්ත්‍රියක් සඳහා වූ අවමඟුල් උත්සවයකදී මිනි පෙට්ටිය උස්සන් යන අය එය අත් වැරදීමකින් ගෙදර සාලේ බිත්තියේ වැද්දුවා. එවිට මිනී පෙට්ටිය තුලින් සිහින් කෙඳිරියක් ඇහුනා. වහාම මිනි පෙට්ටිය ඇර බැලීමේදී

තරුණිය මැරී නොමැති බව වටහා ගත්තා. ඒ තැනැත්තිය තවත් අවුරුදු 10ක් ජීවත් වී, පසුව, මැරුණා. ඇයට නැවතත් අවමඟුල් උත්සවයක් පවත්වා, අවසානයේ, මිනී පෙට්ටිය උස්සන් යන කොට ඒ යන අයට ඇගේ සැමියා උස් හඬින් කියනවා 'බලාගෙන පෙට්ටිය සාලේ බිත්තියේ හෙම වද්දන්න එපා' කියා.

166. ඇන්ටි අන්න මාමා කාර් එකකට අහු වෙලාලු. අපොයි අම්මේ, මලාද පුතේ? නෑ ඇන්ටි, අර පාලිත අන්කල්ගේ විකුණා ගන්න බැරිව තිබුන පරණ කාර් එක එයා ලක්ෂ 14ට අරං.

167. එක සැලුන් එකකට තරුණයෙක් ඇවිල්ල බාබර් ගෙන් අහනවලු  සැලුන් එක වහන්න වෙලා යයිද කියලා. බාබර් කියනවලු ඔව් තව පැයක් විතර යයි කියලා.ඇත්තද මම පස්සේ එන්නම් කියල මිනිහා යනවලු. ආයි දවසක ඇවිල්ලා අහනවලු වහන්න වෙලා යයිද කියලා. බාබර් කියනවලු ඔව් තව වෙලා යයි කියලා. මෙහෙම මේ මනුස්සයා හැමදාම වගේ ඇවිල්ලා අහනවලු කවදාවත් කොණ්ඩේ කපන්නේ නැහැලු. දවසක් මේ මනුස්සයා ඇවිල්ලා බබර්ගෙන් සැලුන් එක වාහන වෙලාව ඇහුවම, ඔව් වෙලා යනවා කියලා. සාප්පුවේ වැඩ කරන කොල්ලට කිව්වලු ගිහින් බලන්න අර යකා කොහෙද යන්නේ කියලා.කොලුවා ඇවිල්ලා කියනවලු 'මිනිහා  බාබර් ගේ ගෙදරට යනවා කියලා'.

168. අම්මා - පුතේ ඔයා අද ගෙනත් තියෙනේ අමු දරනේ. කොල්ලා - ඔවු අම්මා, කර දරත් තිබුනා. මට ගෙන්න ඕන වුනේ නැහැ අම්මේ අපේ ගෙදරට කරදර.

169. බාබර්ගේ කොන්ඩේ කපන්නේ කවුද? කතුරයි, පනාවයි, දැලිපිහියයි සර්.

170. ආදම් සහ ඒව් ලොව සිටී ප්‍රීතිමත්ම යුවල වුයේ ඇයි? ඔවුන්ට නැන්දම්මලා නොසිටි නිසා.

171. මගේ නෝනා දවසක් පැමිණිලි කරනවා මම කවදාවත් එයාව වටිනා තැනකට ගෙනියන්නේ නැහැ කියලා. මම කිවුවා හරි කාර් එකට නගින්න මම ඔයාව පෙට්‍රල් ෂෙඩ් එකට ගෙනියන්නම්, මම අද ෆුල් ටැන්ක් ගහනවා කියලා.

172. ඔයාට ඔයාගේ පඩියෙන් පවුල නඩත්තු කරන්න බැරි ඇයි? මට සුමානෙකට හම්බවෙන්නේ දවස් 5 ක පඩියක්, ඒත් මගේ වයිෆ් දවස් 7ම වියදම් කරනවා.

173. දීසියේ තිබ්බ කැවුම් ගෙඩි 2ක ගත්තේ පුතා නේද? මම ගත්තේ නැහැ අම්මේ. ඇත්ත කියන්න පුතා, බොරු විතරක් කියන්න එපා. ඇත්තමයි අම්මේ, මම ගත්තේ නැහැ, මම ඒ දෙකම කෑවා.

174. මැදපෙරදිග වැඩකරපු නංගි කෙනෙක් උදේක මැඩම් සුපර් මාකට් යන්න ලැහැස්ති වෙලා නංගිගෙන් (අරාබි

භාෂාවෙන්) ඇහුවලු ගෙදර බිත්තර තියෙනවද කියලා. නංගිට තේරිලා නැහැ. බැරිම තැන මැඩම් එයාගේ පිටිපස්සට ඇගිලි ටික තියලා (බිත්තරේ වගේ) කුක්කු කූ කිව්වලු. ඊට පස්සේයි නංගිට තේරිලා තියෙන්නේ.

175. මහත්මයෙක් තම බිරිඳට කාරයක ඉස්සරහ දොර ඇර දෙන්නේ නම් එක්කෝ එය අළුත්ම කාරයක්, නැත්නම් අලුත්ම බිරිඳක්.

176. තම ඩ්‍රින්ක් එක ගොඩාක් රස හින්දා වෙන්න ඇති ඔයා මගේ එක හිස් වෙන්නම බිව්වේ?; නෑ මට ඕනා උනා මේඩ් ඉන් මොන රටේද කියලා බලන්න - ඒක ගහල තියෙන්නේ මගේ එක යට පැත්තෙනේ.

177. කොන්ඩෙ කපලා සාරි ඇඳල- නිය තොල රතු පාට කරලා. - වෙද නලාව කරේ දාලා- ටකස් ටකස් අඩිය තියලා- ලොකු බෑගයකුත් අරගෙන-උණු දිය බෝතලෙත් රැගෙන- දොස්තර නෝනෙක් ආවේ- අවේලාවෙ ඇතුළු වෙන්න මුරකරු හට සැක හිතිලා- ඇත අයිඩන්ටිය ඉල්ලා- කැඩිච්ච ඉංගිරීසි ටිකක් දමා - මේ නෝනා පල්ලම් බැහැලා.

178. මාමයි මමයි වෙල්යායේ හාන කොටට, කුළු මීමෙක් ආවයි මට අනින්නට, වටපිට බැලුවා තැනකුත් නැහැ නගින්නට, පිට පොට ගසා නැන්ගෙමි මාමගේ කරට.

179. මාගේ මිතුරා මගෙන් අහනවා - ‘ඔබ දික්කසාදයක් ඉල්ලන්නේ ඇයි’? මා කියනවා - ‘ඊයේ රෑ සහ පසුදා දවල්

වෙනකම්ම මගේ බිරිඳ අපේ ගෙදර හිටියේ නැහැ, ඇහුවහම කියනවා එයා හිටියේ නංගිගේ ගෙදරලු. යහළුවා අහනවා - 'ඉතින්'? මම කියනවා - 'මගේ නෝනා බොරු කියන්නේ, ඒ වෙලාවේ මමයි හිටියේ නංගිගේ ගෙදර'.

180. රොසයිරෝ නීති උපදේශක ආයතනය වෙත ගිය සේවාදායකයෙක් රොසයිරෝ මහතාගෙන් විමසුවා ඔහුගෙන් දෙවරකට මුදල් අය කලේ මන්ද කියා. ආ, ඔයා උදේ ඇවිත් නීති උපදෙස් අරං ගියා, ආයමත් පැයකට විතර පස්සේ නැතිවූ කුඩය හොයාගෙන ආවා. ඒ දෙකටම තමයි අපි චාජ් කලේ.

181. 'ආච්චි බුලත් හපයි' කියන අයිති එක වර්තමාන කාලයට. ඇයි ඔයා අතීත කාලයේ කියලා ලිව්වේ? අපේ ආච්චි මැරිලා දැන් ගොඩක් කල් මිස්.

182. වෙළුම් පටිවලින් අත් කකුල් වෙලාගෙන එල්ලාගෙන රෝහල් වාට්ටුවක ප්‍රතිකාර ගන්නා කෙනෙක් තමන්ට සිදු වූ අකරතැබ්බය විස්තර කරලා. මිනිහා කැමරාවකුත් බෙල්ලේ එල්ලගෙන අත ඇති ෆොටෝ බලමින් බස් එකක යද්දී ගැස්සිලා පොටෝ එක බිමට වැටිලා කාන්තාවකගේ පයට පෑගී තියෙන විට කියලා තිබෙනවා ඒක ගන්න කකුල පොඩ්ඩක් උස්සන්න කියලා. මේ මුකුත් නොදන්නා ඇය අහලා මොකෝ මගේ කකුල උස්සන්න කියන්නේ කියලා, ෆොටෝ එක ගන්න කියලා කියද්දී , වටේ හිටිය ඔක්කොමත් එක්ක හොඳටම ගහලා අඬු කැඩෙන්නම.

183. අද මොකද පාරේ ට්‍රැෆික් වැඩි? ට්‍රැෆික් ලයට් නවත්තලා රාලහාමි කෙනෙක් ඒ කාර්යය භාරගෙන.

184. හොඳ තරුණයෙක් දුර පළාතක නිවසක් සොයා යද්දී නොදැනීම රෑ බෝවිය. ආපසු යන්නත් බස් නැතිහෙයින් කොහේ හෝ රාත්‍රිය ගත කරන්නට සිදු වෙලා. කවුරුත් මේ ආගන්තුකයාට පිහිට වුණේ නැහැ. කෙනෙකුගෙන් උපදෙසක් ලැබුනේ වැඩිවියට පත් කෙල්ලක් නොසිටින ගෙයක් සොයා බලා නවාතැන් ඉල්ලුවොත් පහසු වෙන බවයි. නිවසකට ගොස් වැඩිවියට පත් කෙල්ලක් ඉන්නවාදැයි ඇසීය. ඇයි ඒ මොකෝ එහෙම අහන්නේ යි ඇසූ විට දවසක් නිදා ගන්න කියනවාත් සමග ගුටි පූජාවකින් සංග්‍රහ ලබලා ඉස්පිරිතාලේ ඇඳේ.

185. අවුරුදු 60ක් විවාහ ජීවිතය ගත කල යුවලක් එය සැමරීමට, ස්වාමියා බිරිඳට කියනවා 'ඔබට මේ දිනය සැමරීමට මොකක්ද කරන්න අවශ්‍ය?' ඇය කියනවා -'අපි උඩ තට්ටුවට දුවලා ගිහිල්ලා, ඇඳේ තුරුල් වෙලා ඉමු'. ඔහු කියනවා 'ඔබ කල්පනාකර කියන්න. අපට ඒ දෙකම කරන්න අමාරුයිනේ, ඒ හින්දා දෙකෙන් එකක් විතරක් තෝරා ගන්න'.

186. ඔන්න පන්තියේ ගුරුතුමිය කිනිතුල්ලා ගැන රචනාවක් ලියන්න කියලා. ළමයා මෙහෙම ලිවුවා - කිනිතුල්ලා වනාහි කෘමියෙකි. ඌ බල්ලන් පුසන්ගේ ඇඟේ

වෙසේ. පහුවදා ටීචර් කීවාලු හුනා ගැන  ලියන්න කියලා. අපේ කෙලි ඒකේ ලියලා තියෙන්නේත් කිතුල්ලා ගැන. අන්තිමට ලියලා තියෙනවා පුසන් හුනන් කනකොට කිනිතුල්ලාටත් රජ බොජුන් කියලා. බැරිම තැන ටිචර් කිවලු මෝරා ගැන ලියන්න කියල. කෙලි ඉතින් කිනිතුල්ලා හැර සතෙක් ගැන දන්නේ නැහැනේ .ඉතින් ලිවලු මෙහෙම - මෝරා ජලයෙහි වාසය කරයි.  මෝරාගේ ඇඟේ කිනිතුල්ලන් නොමැත .බැරි වෙලාවත් කිනිතුල්ලන් සිටියෙ නම් ... කියලා. එතැන් සිට කිනිතුල්ලාන් ගැනම ලිවාලු.

187. කරුණාකරලා ඔයාලගේ අතේ තිබෙන මාලිමා යන්ත්‍රය අංශක 360ක් කරකවා යා යුතු නිවැරදි දිශාව තෝරා ගෙන ආයෙත් යමින් සිටි දිසාවටම යමින් සිටිනා බව දැනගන්න.

188. අසනීප තත්වයේ සිටින මිනිසෙක් දොස්තර බැලීමට යනවා. දොස්තර සම්පූර්ණ වෛද්‍ය පරීක්ෂණයක් අණ කරනවා. පසුව දොස්තර කියනවා ‘කනගාටුයි, ඔබට කියන්න ඉතාම නරක පුවතක් තියෙනවා, ඔබ මැරෙනවා, ඔබට වැඩි කලක් ඉතුරුවී නැහැ’ කියා. මිනිසා කියනවා ‘අයියෝ එය ඉතා නරක පුවතක්’ කියා. ඔහු අහනවා ‘දොස්තර මහත්තයෝ මට කොපමණ කලක් තව ඉතුරුව ඇද්ද කියා‘. දොස්තර කියනවා ‘කනගාටුයි 10යි ’ කියා. මිනිසා අහනවා ‘අවුරුදු 10ක්ද, මාස 10ක්ද, සති 10ක්ද , මොකක්ද’ කියා.  දොස්තර කියනවා ‘නවයයි ……’.

189. ඔන්න එක ගමක බූරුවා ගහන මිනිහෙක් හිටියලු. මිනිහාගේ නම ජිජි බෙලින්. හැමෝම කිව්වේ ජීජී කියලා. දවසක් ඒ තිප්පලට පොලිසියන් පැන්නලු. ජීජීත් එතන ඉඳලා ඒ වෙලාවේ. මිනිහ දුවලා දුවලා ගිහින් වැසිකිළියක් අස්සේ හැංගිලා. රාළහාමි කෙනෙක් මෙයා හැංගෙනවා දැකල දොර ළඟට ඇවිත් ඇහුවලු උඹ කවුද කියලා. මෙයා කියලා 'මහත්තයා මම ජීජී ' කියලා. 'හා එහෙනම් උඹ ජීජී ඉවරවෙලා වරෙන්' කියල රාළහාමි දොර ළඟට වෙලා හිටගෙන හිටියලු.

190. මේ ඇඩ් එක මේ ඉරිදා පත්තරේට ගිහිල්ලා දාන්න; පාරේ හංදියේ ලයට් කනුවෙත් අලවන්න - 'කැඩිලා තියෙන පවුල් අලුත් වැඩියා කර දෙනු ලැබේ. අවුල් වූ පවුල් සුද්ද පවිත්‍ර කර දෙමි. නිට්ටාවට සුව කරමි. නොමිලේ සේවය. හොර රහසේම ලියන්න. දුක 502301.'

191. ඔන්න සුදු අන්තුවෙක්ගේ පුතා බූරු පොලක බූරු ගහනවා. මේක තාත්තට ආරංචි වුණා. කෝටුවකුත් කඩාගෙන තාත්තා ගිහින් කොල්ලව අල්ලාගෙන තෝත් මේ ජරා වැඩේට පුරුදු වුණාද කියලා හොඳටෝම බැනලා දෙකක් ගහලා ගෙදර පැන්නුවා. ඊට පස්සේ කෝ මේ කොල්ලා අල්ලපු ඔට්ටුව කියලා අනිත් බූරුවා කරුවන්ගෙන් ඇහුවා. උන් ඒක පෙන්නුවම අල්ලපු ඔට්ටුවක් ආපහු ගන්න එක හොඳ නැහැනේ කියලා තාත්තා එතනින් වාඩි වෙලා සෙල්ලම කරගෙන ගියා.

192. සියා - මදුරුවෝ හින්දා අද නම් නිදා ගන්න බැහැ පුතේ. මෝඩපාල - මම උන්ට නේන්න හොඳ වැඩක් කරන්නම් සීයේ. සියා - ඒ මොකක්ද පුතේ? මෝඩපාල - ඉස්සරහා ගේට්ටුව වහලා එන්නං.

193. ගුවන් සේවිකාව මගෙන් ඇහුවා කෑමට මොනවද ඕනෑ කියලා. මට මෙලෝ දෙයක් තේරුනේ නැති නිසා 'නෝ' කියලා කිවුවා. ටික වෙලාවකින් තව ගුවන් සේවිකාවක් ආයෙත් මොනවදෝ ඇහුවා. ඒත් මම 'නෝ' කියලා කිවුවා. අන්තිමේ ගමන අවසන් වෙනකම්ම මට කන්නවත් බොන්නවත් ලැබුනේ නැහැ. වටේ අය දිහා බැලුවම දුකේ බැහැ; තලු මර මර කනවා. මොනවා කරන්නද?

194. ස්පාඤ්ඤ ජාතික නාවික කපිතාන් ඔහුගේ නැව තුල ඇවිදින අතර සොල්දාදුවෙක් දුව ඇවිත් කියනවා 'සතුරු නැවක් අප වෙත එනවා' කියා. කපිතාන් පිළිතුරු දෙනවා 'ගොස් මගේ රතු කමිසය අරන් එන්න' කියා. සොල්දාදුවා එම කමිසය ඔහුට ලබා දෙනවා. සතුරු නැව සමඟ දරුණු සටනක් කර එය පරාජය කර පලවා හරිනවා. සොල්දාදුවා කියනවා 'විශිෂ්ටයි කපිතාන් තුමනි, එත් රතු කමිසය කුමටද?' කියා. එවිට කපිතාන් කියනවා 'යම් විදියකින් මම තුවාල උනා නම් මගේ ලේ පිරිනු කමිසය සෙසු නාවිකයන් විසින් නොදැක යුතුයි, මන්ද ඔවුන්ගේ ආත්ම ශක්තිය හීන විය හැකයි' කියා. එවිටම තවත් සොල්දාදුවෙක් විගස පැමිණ කියනවා' කපිතාන් තුමනි තවත් සතුරු නැව් 20ක්

එනවා' කියා. කපිතාන් සන්සුන්ව කියනවා 'ගිහිල්ලා මගේ කහ පාට කලිසම අරං එන්න' කියා.

195. ඇත පිටිසර ගමකට මිනිමරු අලියෙක් පැනලා කියලා වනජීවීඑකේ වැඩ කරන මල්ලිට රෑ ඩියුටි කෝල් කරලා. අක්කණ්ඩි ටෙක්ස්ට් මෙසේජ් එකක් එවලා 'මල්ලි පරිස්සමින් යන්න, අල්ලපු ගෙදර සැර බල්ලාව මඟ හැරලා'.

196. පෙරහැරට ගෙනාපු අලියෙක් මද කිපිලා කුලප්පු වෙලා. ඇමතිතුමාගේ මැතිනිය හොඳටම කුලප්පු වෙලා, ඇයි එයාට ඒ අලියා ගැන කිවුවේ නැත්තේ කියලා.

197. ඇස් නොපෙනෙන පුද්ගලයෙක් (අන්ධ) ගමනක් යන අතර මඟ දී ඔහු ඉදිරියෙන් පැමිණි ස්වාමින් වහන්සේ නමකගේ ඇගේ හැපෙනවා, අන්ධයා - කොහෙද ඕයි උඩ බලාගෙන යන්නේ? ස්වාමින් වහන්සේ - මම මේ මහන කෙනෙක්. අන්ධයා - තමුසෙට පිස්සුද ඕයි පාරේ තියාගෙන මහන්න, ඉදිකට්ට එහෙම ඇනුනා නම්.

198. ඕගොල්ලන්ගේ එයා ලයින් එකට දීලා තියෙන කෝඩ් එක PIA, ඇයි ඒ? 'පර්හැප්ස් ඉට් මේ අරයිව්'

199. ෂෙඩ් එකේ පෙට්‍රල් තමාම ගහගත් මහතෙක් වාහනය නැවත පන ගන්වා සිගරෙට්ටුවක් දල්වා ගත්තා. අතේ ගෑවී තිබුණු පෙට්‍රල් නිසා ක්ෂණයකින් අත ගිනිගත්තා. අත ජනෙල් වීදුරුවෙන් එලියට දමා ගසමින් ගින්දර නිවීමට

තැත් කළා.මෙය දුටු පොලිස් රාලහාමි කෙනෙක් දඩ කොලයක් ලියා දුන්නා 'ගිනි අවියක් අපරික්ෂාකරිව පරිහරණය කිරීම' කියා.

200. 'කපිතාන් කාල් කාන්තා වැසිකිලියට ගියේ ඇයි?' 'ඔහුට ඕනා කර තිබුනේ කිසිම මිනිහෙක් ගොසින් නැති තැනකට යාමට'

201. දයාන්ගේ බිරිඳට ටැන්සානියාවෙන් විදුලි පණිවුඩයක් ලැබුනා, දයාන්ව සිංහයෙක් කාලා මැරිලා කියලා. බිරිඳ විදුලි පණිවුඩයක් යැවුවා සිරුර එවන්න කියලා. මිනීපෙට්ටිය ආ පසු බිරිඳ තව විදුලි පණිවුඩයක් යැවුවා මිනිපෙට්ටියේ ඉන්නේ සිංහයා පමණයි, දයාන්ගේ මිනිය වහාම එවන්න කියා. පිළිතුරු විදුලි පණිවුඩයක් ඉක්මනින් එවා තිබුනා, දයාන් ඉන්නේ සිංහයාගේ ඇතුලේ කියලා.

202. මෝඩපාල - අයියෝ දෙයියනේ මට ඉඳලා වැඩක් නැහැ. සීයා- ඇයි දෙයියනේ මොකද උනේ? මෝඩපාල - මල්ලිව ගඟේ ගියා. සීයා- මො..මො...මොන මල්ලිද? මෝඩපාල -කොත්තමල්ලි

203. 'ඩ්‍රැකියුලාගේ නෝනාට නිදා ගන්න බැරි ඇයි?'. 'ඩ්‍රැකියුලා නිදා ගන්නේ මිනිපෙට්ටියක නිසා'.

204. සැකයක් මත රණ්ඩු වෙන අම්මා සහ තාත්තා බය කිරීමට සිතු අවුරුදු හතක දරුවා තාත්තා තනි වෙනතුරු සිට මෙසේ කීය 'තාත්තා මම ඔක්කොම දන්නවා.' අනේ පුතේ

අම්මට නම් කියන්න එපා. පුතා මේ සල්ලි වලින් මොනව හරි ගන්න පියා ඉතා සාන්ත ලෙස කීය.මෙයින් දිරිමත් වූ කොලුවා අම්මා ලගට ගොස් 'අම්මා මම ඔක්කොම දන්නවා.' අනේ පුතේ තාත්තාට නම් කියන්න එපා. මම පුතාට රස කෑමක් හදල දෙන්නම් අම්මා කීය. මාරයි නේ මේක නියම බිස්නස් එකක්නේ. මාර විදිහට ලාබ ලැබෙනවනේ. මෙහෙම හිතපු කොලුවා ගෙදරට ආ ලියුම්කාරයා ලගට ගොස් 'ලියුම් මාමේ, මම ඔක්කොම දන්නවා.' එක්වරම කොලුවා වඩාගත් ලියුම්කරු අඩමින් 'උඹ  මගේ පුතා කියල අම්මාද පුතේ කිව්වේ'?

205. පෙරේරා සහ සිල්වා දෙදෙනාම දික්කසාද උසාවියේදී හමුවී, යාලු උනා. පෙරේරා කිවා එයා දික්කසාදය ඉල්ලුවේ එයාගේ බිරිඳට 'මේ කියපු දේ මේ මතක නැති වෙන නිසායි' කියා. සිල්වා කියනවා එයා දික්කසාදය ඉල්ලුවේ එයාගේ බිරිඳට හැමදේම මතක තියෙන නිසා හිංදා කියා.

206. කාන්තාවක් සිය මිතුරිය විවාහක මුද්ද ඇගේ වැරදි ඇඟිල්ලේ දමා සිටිනවා දැක ඒ මන්දැයි විමසුවා. මිතුරිය පිළිතුරු දෙනවා 'මොකද, මා බැන්දේ වැරදි මනුස්සයා නිසා'.

207. අර ඊමේල් එක ආවේ නැනේ අම්මේ. බයවෙන්න එපා දුව, ආවාම ඉස්සරහ දොරේ බෙල් එක ගහයි.

208. මොකක්ද ලිඳ ළඟ සමාජෙට බැඳේන්න ඕන සුදුසුකම - ගෙදර කිසිම වැඩක් කරන්නේ නැති මිනිස්සු,

ලිඳ ළඟට ඇවිල්ලා ගෑණුත් එක්ක මුකුළු කර කර ඉන්න එක සහ ලිඳෙන් වතුර බාල්දි ඇදලා දෙන එක.

209. ලිඳ ළඟ සංගමයට බැඳෙන්න සාමාජික ගාස්තු සුදුසුකම්? - අනේ අක්කේ, නංගියේ වදින්නම් මගේ මිනිහව ඕගොල්ලන්ගේ කතා වලට අල්ලා ගන්න එපා.

210. ලයිට් බල්බ් එකක් මාරු කිරීමට දේශපාලනඥයන් කී දෙනෙක් උවමනාද? 'දෙන්නයි, මාරු කිරීමට එක්කෙනයි, එය නැවත මාරු කිරීමට තව එක්කෙනයි.'

211. පරණ මිතුරෝ දෙදෙනෙක් බොහෝ කාලයකට පසු හමු උනා. ඔබ දැන් මොනවද කරන්නේ? 'PhD'. 'ෂා කොච්චර හොඳද ඔබ එහෙනම් ආචාර්ය වරයෙක්!'. 'නැහැ පිඩ්සා හෝම් ඩිලිවරි.'

212. මහත්තයටයි නෝනාටයි හැප්පි නිව් ඉයර්. මක් කිව්වා? හැප්පි නිව් ඉයර්. ඔවු ඔවු හැපින්නියක්ම තමා මෙකී.

213. පත්තරේ දාලා තිබුණු දැන්වීමක් - 'විශ්ව කෝෂයේ සියලුම කාණ්ඩ සහ සෙසු ඉතා වටිනා බුද්ධි වර්ධන පොත් වලින් ½ ක් වහාම විකිණීමට. දැන්වීම්කරු කථිකාචාර්යවරියක් සමඟ විවාහ වූ නිසාය.'

214. අවුරුදු 50ක් මඟුල් කෑ බන්දු සහ ශ්‍රියාට විශේෂ සම්මානයක් බන්දුගේ වැඩපොලෙන් පිරිනැමුණා. විවාහයේ සාර්ථකත්වයට හේතු ඇහුවාහම බන්දු කියනවා, මම මේ ආයතනයේ අවුරුදු 40ක් සේවය කරනවා. මම උදේ මෙහේ වැඩට ආවහම ශ්‍රියා එයාට ඕන විදියට ගෙදර වැඩ කරනවා. හවස මම ගෙදර ගියහම මම ශ්‍රියාට ඕන විදියට ගෙදර වැඩ කරනවා කියා.

215. ඕ අයි සී මහත්තයා කියලා කෙනෙකුත් ඇවිල්ලා අද බුරුවො ගහන තැනට, පොලිසියෙන් පනින එකක් නැහැ.

216. ලෝක ප්‍රසිද්ධ බොක්සිං ශූරයෙක් ශල්‍යකර්මයකට ගියා. කොච්චර උත්සහ ගත්තත් සිහිය ආපහු ආවේ නැහැ. පස්සෙ, බැරිම තැන මුහුණට මාර්ස්ක් එකක් අල්ලලා ගණන් කළා. 9 කියනකොට මිනිහා දඩිබිඩි ගාලා නැගිට්ටා.

217. DNA ටෙස්ට් එකට ආවේ මොකද? තාත්තා කවුද කියලා මට දැන ගන්න ඕනේ, දැන් දන්නේ අම්මා පමණයි. ඔව්, තාත්තාලා වැඩි වුනාම සමහරවිට අම්මත් දන්නේ නැහැ.

218. සීයා - පුතේ මෝඩපාල, ඔයාගේ නුවණ ගැන හිතනකොට මට මැටි මුට්ටියක් සිහි වෙනවා.

219. ‘සමන් අයියේ ඕන හොඳ එකක් අවොත් බදිනවා. රොඩී, සන්නාසි, අන්නාසි, අභිකුන්ටක, මන්වාදී, පිල්වාදී,

මදටිය ඔය ඕන කෙනෙක් කමක් නැහැ; ලිවින් වූගේද? අකමැතිනම් නැහැ අයියේ ඒත් ගොඩාක් කල්පනා කරලා බලන්න ඕනේ.' 'මාලා නංගි ඔය ඇත්තමද කියන්නේ. කැ..කැ..කැ...කැස්සක් එනවා කථා කරගන්නත් අමාරුයි නංගි ...තියන්නං'.

220. සීයා - 'පුතේ උඹ ලොකු මිනිහෙක් වෙන්න කැමති නම් හොඳට ඉගෙන ගන්න ඕන'.මෝඩපාල - 'ඉගෙන ගත්තත් නොගත්තත් සීයේ තව අවුරුදු 16 කින් විතර මම ලොකු මිනිහෙක් වෙනවාමයි.'

221. ඔබතුමා සත්ව පාලනේ ඉඳලා බෝග වගාවට මාරු වෙලා ආව හින්දා වෙන්නැති අතන බිත්තර තවානක් දාලා තියෙන්නේ.

222. වැස්සට ඒ තැනට ගිය එක කමක් නැහැ කියමුකෝ, මොකටද එතන ඒවාට හොට දාන්න ගියේ?

223. කෙල්ලේ, ගෙට පල හනිකට. STF එකෙන් කසිප්පු අල්ලන්නද කොහෙද ගෙට පැනලා. මගේ කසිප්පු තිප්පොල, අපරාදේ.

224. පැණි හල හල නිවුස් හොයන අය; දෙන්නකෝ කෝල් එකක් LTN එකට 58775 ; නිව්ස් ෆස්ට්, ෂුඅර්.

225. බොහෝ කුනාටුවලට ගැහැණියකගේ නම දෙන්නේ ඇයි? කුනාටුවත් යනකොට යන්නේ ගෙදරයි, කාර් එකයි අනිත් හැමදේමයි අරන්නේ.

226. පැණි මුට්ටිය බිඳුනා වගේ ලේ එන්නේ මොකද අය්සේ ? මුට්ටිය කලින් දාලා බැලුවා මුකුත් උනේ නැහැ; ඔලුව දාපු පාර ගමන්ම වැදුනා මෝල් ගස් පාර.

227. ඉතා රෑ බෝවී ගෙදර ආ බිරිඳ නිදන කාමරය හෙමින් ඇරියා. ඇඳේ මුළුමනින්ම වසා තිබූ බ්ලැන්කෙට්ටුව යටින් දැක්කා මහත්තයාගේ කකුල් දෙක වෙනුවට කකුල් 4ක්. ළඟ තිබුණු ක්‍රිකට් බැට් එක අර ගත් ඇය බ්ලැන්කෙට්ටුවට පුළුවන් තරම් තදින් පහරදී, ඉවරවූ පසු, කුස්සියට ගියේ වතුර වීදුරුවක් බීමට. නමුත්, එහි සඟරාවක් කියවමින් සිටි සැමියා දැක පුදුම උනා. ඔහු කිවා ‘අන්න ඔයාගේ වයසක දෙමවුපියෝ දෙන්නා අපිව බලන්න ආවා, මම අපේ නිදන කාමාර්ය ඒ දෙන්නට දීලා මම ආවා, පවුනේ, ඔයා ඒ ගොල්ලන්ට හලෝ කිව්වුවද?’

228. කඩේ මුදලාලි ඔහුගේ ගෝලයාට බැන වැදුනේ මී කතුරු නැත්නම් මී පාසානම් විකුණපන්. සබන් නැත්නම් සබන් කුඩු. හාල් මැස්සෝ නැත්නම් කට්ටා කරවල විකුණපන් යනුවෙනි. මුදලාලි එසේ කියා දුන්නේය. ඔන්න දවසක් යාළුවා මේ කඩේට ඇවිත් කොලුවෝ මට නොම්මර එකේ අත පිහින ටිෂුයු පෙට්ටියක් දෙන්න යැයි ඉල්ලා සිටියේය. එවිට කඩේ කොලුවා කියා සිටියේ ‘අනේ අයියේ

ටිෂුයු නම් ඉවරයි. නොම්මර එකේ වැලි කඩදහි පෙට්ටියක් දෙන්නද?'කියලා.

229. වැසි දවසට බයිසිකල් පැදීමේ පුරුද්ද අත හැර දැමීමට මම අධිෂ්ටාන කර ගතිමි. ඒ බයිසිකලය තෙමෙන නිසාවෙනි.

230. බිරිඳ ස්වාමියාට කියනවා 'අපේ අසල්වැසි ගෙදර මහත්තයා හැමදාම වැඩට යන්න ඉස්සෙල්ල එයාගේ වයිෆ්ව ඉඹලා යන්නේ, ඇයි ඔයාට එහෙම කරන්න බැරි?' ස්වාමියා කියනවා 'මම කොහොමද එහෙම කරන්නේ, ඒ අය ලඟදිනේ ආවේ, මං ඇයව තවම දන්නෙවත් නැහැනේ' කියා.

231. දවසක් ලෙඩෙක් අයි .සි .යු , අයි .සි .යු කියල කියවනවලු. නර්ස් කිව්වලු ඔයාව අයි .සි .යු දාන්න තරම් අමාරුවක් නැහැ කියල .ඒ පාර ලෙඩා කියනවලු එයා කතා කලේ එයාගේ ඉංග්‍රීසි ජාතික නෝනාට කියලා.

232. විශ්ව විද්‍යාලේ ඔයාගේ ප්‍රියතම විනෝදාංශය - කෙල්ලෝ ටිකක් වට කර ගෙන වීරයා වගේ කයයිවාරු කතා කියන එක. කෙල්ලෝ නැති කොට? ඇයි අම්මන්ඩිලා හිටියේ.

233. මෝඩ පහේ පුතා සමග ගමේ ජීවත් වූ නොන්ඩි ඒබ්‍රහම් හදිසියේම රෝහලට ඇතුලත් කර ටිකවෙලාවකින්

මියගියේය. ගමෙන් පිට සිටින සහෝදරයින් කලබල නොවන ආකාරයට ටෙලිග්‍රෑම් පණිවිඩයක් යැවීමට සිතූ මෝඩ පුතා මෙසේ ලිවීය .' 'තාත්තට අන්තිමයි භූමදානය එන ඉරිදා'.

234. ඔබ තානාපති කෙනෙක් හෝ එවැනි කාර්යාලයක කෙනෙක් නොවෙයි. ඇයි ඔබේ පරණ වාහනයේ DPL කියා ගහගෙන යන්නේ? 'ඩීසල් පෙට්‍රල්, ලාම්පුතෙල් තුනෙන්ම දුවන නිසා.'

235. බස් හෝල්ට් එකේ හිටපු තරුණයෙක් එතන හිටපු මුදලාලි කෙනෙකුගෙන් වෙලාව කීයද ඇහුවා. මුදලාලි උත්ත්තරයක් දුන්නේ නැහැ. ආයෙත් ඇහුවා, නෑ උත්තරයක්. තරුණයා යන්න ගියා. මේක දැකපු එතන හිටි කෙනෙක් මුදලාලිගෙන් ඇහුවා, 'ඇයි මුදලාලි අරයට වෙලාව කිව්වේ නැත්තේ' කියලා. මුදලාලි කියනවා 'හරි, මං වෙලාව කිව්වා නම් මිනිහ මා එක්ක කතාවට වැටෙනවා. ඊ ලඟට මිනිහ කෝපි බොන්ඩ යන්න කතා කරනවා. මං අඩියට කැමති මිනිහා නිසා කියනවා නෑ අපි අඩියක් ගහන්න යමු කියලා. අපි දෙන්නට ටිකක් වැඩි වෙනවා. මිනිහ මාව ගෙදර ගිහින් දානවා. අපේ ලොකු කෙල්ල ඇහැට කනට පේන එකී. ඒකි මෙයාට වහ වැටෙනවා. ඉතින් කොහොමද ඕයි, ඔරලෝසුවක් ගන්න බැරි එකෙකුට මං දුවක් දෙන්නේ.'

236. ගොලුමහත්මයෙක් කොස්ගම යන්න බස් එකේ නැග්ගලු. ටිකට් ගන්න කිව්වම මිනිහා වටපිට බලනකොට කොස්ගහක් දැකලා ඒක පෙන්නුවලු. කොන්දොස්තර තේරුම් අරන් කොස්ගමට ටිකට් එකක් දුන්නලු. තව දවසක් මෙයට ඌරුබොක්කේ යන්න වෙලා ඇඟිල්ලෙන් ඌරු නැට්ටක් හදලා පෙන්නලා. කොන්දොස්තර හිනාවෙලා ටිකට් ඒක දීලා. තව දවසක් නිකවැරටියේ යන්න ගිහින්. නිකර් වාටියක් පෙන්නන්න ගිහිල්ලා ගුටිකාලා බස්සලා.

237. රාත්‍රී 12ට පමණ තනිකඩ 95 හැවිරිදි නෝනා හෝටලේ කළමනාකරුට ටෙලිෆෝන් කර කියනවා, අනේ ඉක්මනට එන්න මගේ අල්ලපු කාමරේ මිනිහා ඇඳුම් නැතුව ඉන්නවා කියා. වහා දිව ආ හෝටල් කාර්ය මණ්ඩලයට එවැනි නිර්වස්ත්‍ර කිසිවෙක් නෝනගේ කාමරයේ දක්නට ලැබුනේ නැහැ. නෝනාගෙන් ඇසූ විට ඇය කියනවා - මගේ කාමරයේ අල්මාරිය උඩට නැගලා, සිලිමට යටින් තියෙන හුලං කවුළුවෙන් අනිත් කාමරය ඇතුලත  බලන්න කියා.

238. ස්වාමියා බිරිඳගෙන් අහනවා - ‘මා මළ පසු ඔබ ආයි බඳිනවා නේද?’; බිරිඳ කියනවා ‘නැහැ, මම මගේ නංගි එක්ක ජිවත් වෙනවා’. පසුව බිරිඳ අහනවා ‘මා මළ පසු ඔබ මාව බඳිනවා නේද?’. සැමියා කියනවා ‘නැහැ, මමත් ඔබේ නංගි එක්ක ජිවත් වෙනවා’.

239. ගෙදර වැඩට හිටිය සේවිකාව අස්වී යනවිට අස්වීමේ ලිපියක් ස්වාමි දුවගෙන් ඉල්ලුවා. ඇය මෙසේ ලියුවා - මේ සේවිකාව නාස්තිකාර, ඉතා අලස, වැඩට අකමැති, කම්මැලි

කෙනෙකි කියා. අනේ නෝනා මොනවහරි හොඳවයින් දෙක තුනකුත් ලියන්නකෝ කියා සේවිකාව ඇයද සිටියා. එවිට ස්වාමිදුව ලීවා - මෙයා හොඳට කයි, හොඳට නිදා ගනියි, හොඳට ඕපා දූප කියවයි කියා.

240. ගුරුවරිය පංතියේ සිසුන්ට කිවා රචනයක් ලියන්න 'මට රුපියල් ලක්ෂයක් ඇදුනොත් මොකද කරන්නේ' කියා. ළමුන් සැමෝම රචනාව ලියා දුන්නා, එක් ළමයෙක් හැර. ඔහුගෙන් මොකද කියා ඇසුවාහම කිවුවා, මම මේ පීරියඩ් එකම නිකන් හිටියා, මොකද ඒක තමයි මම කරන්නේ මට රුපියල් ලක්ෂයක් ඇදුනොත් කියා.

241. කළු පටි සම්මානලාභී කාරටේ ශුරයෙක් යුධ හමුදාවට බැඳුනා. සැලියුට් කිරීමට ගිය ප්‍රථම අවස්ථාවේදීම නළල පලාගෙන බරපතල තුවාල හැදී මැරුණා.

242. නැන්දාම්මාව පෙන්න බැරි බෑනෙක් හිටියා. දවසක් මිනිහාගේ යාලුවෙක් මිනිහාට කියනවා ඔයා නැන්දාම්මාට අකමැති වුනත්, එයා ඔයාගේ මිසිස් හින්දාවත් කැමති වෙන්නකෝ කියලා. බෑනා කියනවා මට මගේ නන්දම්මාව පෙන්න බැරි ඒ කාරණය නිසානේ කියලා.

243. මොකද අර මනුස්සයාගේ මුහුණ හැමතිස්සෙම ඇඹුල්? මිනිහා හැම තිස්සෙම දෙහි කනවා.

244. ඔන්න එක ගමක අලුත විවාහ වුන යුවලක් මදුසමය ගත කරන්න මනාලියගේ නිවසට පැමිණියා. පළමු දින

රාත්‍රිය ගතකර පසුදින උදෑසන අවදිවූ මනාලයා මනාලියට පැවසුවේ හන්දියට ගිහින් ප්ලේන්ටියක් බොන් න ඕනා කියාලා යනුවෙනි. සවස් වනතුරුම මනාලයා නොපැමිණී නිසා නිවසේ අය කලබලයෙන් මනාලයාව සොයන්නට වූහ. මනාලිය ගැන හොඳ හැටි දන්නා මනාලියගේ මව දූවේ මට ඇත්ත කියන්න ඊයේ රෑ මොනවා හරි ප්‍රශ්නයක් වුනාද? මනාලිය හඬ අවදි කරමින් අනේ අම්මේ එයා හරි අවංකයි මට එයා කිව්වේ එයාගේ නරක පුරුදු හා අනියම් ඇසුරු සියල්ල නවතා මාත් එක්ක ඊයේ ඉඳලා අලුත් ජීවිතයක් ගත කරන නිසා මටත් ඇත්ත කියන්න කියලා යනුවෙනි. පසුව මනාලියගේ මව පැවසුවේ  උඹ මොනවටද උඹ නටපු නාඩගම් කියන්න ගියේ. දැන් බලාපන් මම උඹලගේ තාත්තව කසාඳ බැඳලා වසර විසි අටක් වෙනවා උඹව හම්බවුනෙත් අර අර අල්ලපු ගෙදර ජාකෝලිස් මුදලාලිට දාව. අදටත් මම උඹලගේ තාත්තට රහස එලි කලේ නැහැනේ  යනුවෙනි. අහම්බෙන් වගේ මේ කතාව මනාලියගේ තාත්තාට ඇසුනි. පසුව මනාලියගේ තාත්තා පැවසුවේ  'මමත් යනවා. හන්දියට ප්ලේන්ටියක් බොන්න යනුවෙනි.'

245. මගේ යහළුවෙකුගේ ගෙදරට ගෑණු කෙනෙක් මර ලතෝනි දීගෙන දුවගෙන ආවලු. බැලින්නම් එයාගේ මිනිහා වෙඩිතියන්න එනවා කියලාලු.මගේ යාළුවයි බිරිදයි දෙන්න අර පිරිමි මනුස්සයව ආපහු හරවල ඇරලා.  ප්‍රශ්නේ මොකක්ද කියල ඇහුවලු. ඒජන්සියෙන් බිරිඳව රට යවන එක පරක්කු වෙලා, මිනිහට කේන්ති ගිහින්.

246. ඔන්න එක පාළු දිවයිනක යාලුවෝ තුන් දෙනෙක් හිටියලු.මේ තුන්දෙනා බොහොම කාන්සියෙන් පාලුවෙන් හිටියේ.ඔහොම ඉන්න කොට එක යාලුවෙක් දැක්කලු මුහුදේ පාවෙන කුප්පියක්.කුප්පිය ඇරියහම ඒකේ ඉඳල එලියට ආවලු බුතයෙක්.බුතයා කිව්වලු ඕගොල්ලෝ මාර උදව්වක් කලේ ඕගොල්ලන්ට ඕන දෙයක් ඉල්ලන්න කියලා.එක යාලුවෙක් කිව්වලු අනේ මාව ලස්සන ගෙයක් එක්ක ලස්සන නෝනා කෙනෙක් එක්ක ඉන්න දෙන්න කියලා.ටක් ගාලා එයා හිතපු දේ හරි ගියාලු.ඔන්න දෙවෙනි යාළුවා කිව්වලු එයාට එයාගේ පවුලේ අයත් එක්ක සතුටින් ඉන්න වරමක් දෙන්න කියලා.ඒකත් හරි ගියාලු. ඔන්න දැන් තුන්වෙනි යාළුවා නින්දෙන් වගේ නැගිටලා කියනවලු අනේ අර දෙන්න නැතුව මට ඉන්න බැහැ ඒ දෙන්නා ගෙනැල්ලා දෙන්න කියලා. පටාර් ගාලා වරමත් හරි ගියාලු.

247. මීටර් 20 ක් දුර ඒ පාරේ ගිහින් වමට හැරිලා, දකුණට හැරිලා, ආපසු හැරිලා, වමට හැරිලා මීටර් 20 ක් විතර පිටුපසට එන්න.

248. ඒ ඔයත් එක්ක ගිය අනිත් තරුණ ගැනු කෙනා කවුද? මගේ අම්මගේ නංගිගේ මහත්තයාගේ පුතාගේ අම්මාගේ අක්කාගේ පුතා බඳින්න එක්කෙනා.

249. යාළුවො තුන් දෙනෙක් තරු පහේ හෝටලයකට ගිහින් හොඳට කෑවා. ඉල්ලකන් 6 බිලක් ඉදිරිපත් උනා. යාළුවො තුන් දෙනාම බිල ගෙවන්න හරි පොරේ. අනිත් එක්කෙනාට ගෙවන්න දෙන්නෙම නැහැ. වේටර්ට

කරගන්න දෙයක් දන්නේ නැති තැන ගිහිල්ලා මැනේජර්ට කිවුවා. මිනිහා මෙහෙම යෝජනා කළා - 'ඕගොල්ල මේ හෝටලේ වටේ රවුමක් දුවලා එන්න, ඉස්සෙල්ලම එන එක්කෙනා තමයි බිල ගෙවන්න ඕන'. යාළුවො 3 දෙනා දිව්වා. ආපහු එනකම් මැනේජර් තාම බලාගෙන ඉන්නවා.

250. චීනෙක් අපේ මැන් කෙනෙකුට පල් එක දානවා. මිනිහා කියනවා ලෝකේ කොතැනක භූමිය තුල ගියත් කිමි 250 ඇතුලත චීන හෝටලයක් තියෙනවා එහෙම නැත්නම් මිනිහා රුපියල් 10,000 ක් දෙනවා කියලා. අපේ යහළුවා ඇහුවේ ඔයාගේ වපසරියට සහරා කාන්තාරයත් අයත් වෙනවද කියලා. මිනිහා රුපියල් 10,000 දින්නා.

251. සැන් ෆ්රැන්සිස්කෝ වල ඉස්පිරිතාලේ පෝලිමේ හිටියා බෙහෙත් ගන්න.පෝලිමේ කට්ටිය ඉවර වෙනකනුත් මගේ නම කිවුවේ නැහැ. පස්සේ බැරිම තැන මම එතන ඉන්න වැඩ කරන කෙනෙකුගෙන් ඇහුවා.එයා මට කිවුවා කීපාරක් කතා කෙරුවද කමක් නැහැ දැන් එන්න කියලා. මම කිවුවා කොහොමද නම කතා කෙරුවේ, මගේ නම ගුණසේකර කියලා. මට ගන සීකර කියලා කීපවිටක් කතා කරලා තියෙන්නේ. හැබැයි මට ඇහුනා. මම ගණන් ගත්තේ නැහැ. මම හිතුවේ බෙහෙතක් ඉල්ලනවා හරි නැත්නම් මෙක්සිකෝ කාරයෙකුට අඬගහනවා කියලා.

252. තරුණයෙක් වැවේ නා නා ඉන්නවලු. ඔන්න ඔය වෙලාවේම තරුණියක් දියබුන් පාරක් එහෙම ගහල නාගන්න ඕනේ කියල වැවට ගියාලු. තරුණයා මම ගොඩට

යන්න ඕන කියලා සරමත් ඇදගෙන ගොඩට යන්න හදනකොට,සරම ගන්න බලද්දි සරම නැහැල්ලු. තරුණිය ලග ලගම එනවලු. ඉතින් සරම දිය යටවත් තියනවද කියල අත ගාල බලනකොට නිකම් බේසමක් වගෙ දෙයක් අහු උනාලු. තරුණයා ඉක්මනට බේසමෙන් අවශ්‍ය ස්ථාන වහගෙන ගොඩට ඇවිත් තරුණියගෙන් ඇහුවලු ඔන්න ඔයා එන හින්දා මම ගොඩට අවා කියලා. තරුණිය ලජ්ජාවෙන් අනිත් පැත්ත බලාගෙන කිව්වලු 'අය්යේ ඔයා හිතාගෙන ඉන්නෙ ඔය බේසමට අඩියක් තියනවද  කියලා.'

253. දැන් කාලේ බැංකු වැටෙන විදියට සල්ලි බැංකුවේ දමන්න එපා. කුස්සියේ කලු පාට දැලි වලන් ගොඩේ යටම තියෙන වලඳ ඇතුලෙන් හංගල තියන්න. කාටවත් අහුවෙන්නේ නැහැ.

254. බිරින්දෑ වරු පිරි බස් රථයක් සංචාරක ගමනක් යද්දී අනතුරට ලක්වී සියළු දෙනා මිය යනවා. සැම බිරිඳකගේම ස්වාමියෙක් සතියක් පුරා නොනැවතී ඇන්ඩුවත් එක් ස්වාමියෙක් නොනැවතී සති 2ක් අඬනවා. ඇයි කියා අහනකොට ඔහු කියනවා 'මගේ බිරිඳට ඒ බස් එක මිස් උනා' කියලා.

255. හොඳටම පින් කරලා කාන්තාවක් දැන් දිව්‍ය ලෝකයට ඇතුල් වෙන්න දිව්‍ය ලෝකයේ ගේට්ටුව ළඟ ඉන්නවා.දේව දූතයා මෙයාව සම්මුඛ පරීක්ෂණයකට ලක් කරනවා. එකපාරම දිව්‍ය ලෝකය ඇතුලෙන් කවුද හයියෙන් වේදනාවෙන් බෙරිහන් දෙනවා.මේ කාන්තාව හොඳටම

කලබල වෙලා. කාන්තාව- කවුද ඒ බෙරිහන් දුන්නේ, ඇයි? දේව දූතයා-ඒ මේ දැන් ඇතුල් වුන කෙනෙක් ගේ උරහිසේයි, අත් වලයි හිල් විදිනවා දේව පිහාටු හයි කරන්න.බය වෙන්න එපා,ටික වේලාවයි රිදෙන්නේ. ආපහු පාරක් ඊටත් වඩා හයියෙන් තව එකෙක් කෑගහනවා. කාන්තාව- කවුද ඒ පාර කෑ ගහන්නේ? දේව දූතයා- ආ ඒ තව එක්කෙනෙක්ගේ ඔලුවේ හිල් විදිනවා දේව ප්‍රේම් එක හයි කරන්න. දැන් මේ කාන්තාව හොඳටම බය වෙලා ආපහු හැරිලා යන්න යනවා අපාය මට හොඳයි කියලා. දේවදූතයා- අපෝ අපායට නම් යන්න එපා, අපාය හොඳ තැනක් නෙමෙයි.යම පල්ලෝ ඔයාව දූෂණය කරයි. අතවර කරයි, හිරිහැර කරයි, එහෙනම් ආපහු මනුලොවට යන්න කියලා . මේ කාන්තාව කියනවා වහාම විසා දීලා මට ෆ්ලයිට් එකක් බූක් කරන්න අපායේ කෙළවරටම, මනුලොවදී මිනිස්සු කරපු දූෂණ, අතවර, හිරිහැර ඉවසපු මට ආයි ඒවා උහුලන්න නම් බැහැ, යමපල්ලන් නරයෝ තරම් නරක නැති බව මම හොඳටම දන්නවා කියලා.

256. මිනිසෙක් සහ ස්ත්‍රියක් කාමරයේ ඇඳේ නිදා සිටිද්දී යම් ශබ්ධයක් ගේ තුලින් ආවා. කාන්තාව කියනවා ‘මගේ ස්වාමියා ගෙදර ඇවිල්ලා, ඉක්මනට ජනේලෙන් පැනලා දුවන්න කියා’. මිනිසා ඇඳෙන් පැන, ජනේලෙන්ද පැන මල් ගස් අස්සෙන් බඩ ගා ගොස් මාර්ගයට අවතීර්ණ වෙනවා. පාරේ යමක් දැක ඔහුට කරුණු අවබෝධ වෙනවා. නැවත ගෙදරට යන ඔහු ‘ඒයි, මම ඔගේ ස්වාමියා’. මිනිසා දෙස නොසරුප් ලෙස බලන බිරිඳ ‘එහෙනම් මොකද ඔබ දිවුවේ?’

257. සල්වැසි නිවසක තරුණයෙකු පොලිසියෙන් පැමිණ රැගෙන යාමට උත්සහකරනු දුටු අසල්වැසි උගත් මහත්මා 'ඇයි මේ ළමයව ගෙනියන්නේ මොකද්ද මෙයා කරපු වරද'' ආදී වශයෙන් ප්‍රශ්න කීපයක් ඉංග්‍රීසි භාෂාවෙන් ඇසීය. තරුණයා දෙසට හැරුණු ඉංග්‍රීසි නොදත් පොලිස් නිලධාරියා මෙසේ කීය 'මේ මහත්තයා  මනුස්සකමට කතාකරන හින්ද උඹට යන්ඩ දෙනවා'. දැන් ඒ පැත්තේ මිනිස්සු ඉංගිරිසි භාෂාවට කියන්නේ මනුස්ස කම කියලලු.

258. යාළුවො දෙන්නෙක් බැංකුවකට ගිහින් එක යාළුවෙක් කාර්ඩ් එකෙන් සල්ලි ගන්න රහස් අංකය ගැහුවලු.ඒක දැක්ක අනිත් යාළුවා කිව්වලු උඹේ පාස්වර්ඩ් එක තරු හතරක් නේ උඹ කොච්චර වැහුවත් මම ඒක දැක්කානේ  කියලා. ඊට පස්සෙ සල්ලි ගත් යාළුවා කිව්වලු උඹට පිස්සුද බං,ඒ පාස්වර්ඩ් මේකෙ ටයිප් වෙන හැටි, මගෙ පාස්වර්ඩ් එක පනස් පහයි විසි තුන නේ  කියලා.

259. සුපර්  මාර්කට් එකේ අතිශය රූමත් වෙලඳ සේවිකාවකට ලංවූ පිරිමියෙක් 'මගේ නෝනාව හොයාගන්න නැහැ, ඔයා මාත් එක්කා විනාඩි 2-3ක් කථා කරනවද? ඇයි ඉතින් මම ඔබ එක්ක කථා කරන්නේ?  මම අතිශය රූමත්කාන්තාවකට කථා කරන ඕනෑම මොහොතක එයා නැති තැනකින් උනත් එලියට ඇදී එනවා.

260. ඔන්න අයියෙකුයි ,මල්ලියෙකුයි පවුලේ ඉඩමක ගස් වැව්වලු.හැම ජාතියකම රූස්ස ගස් ඒ ඉඩමේ වැවිලා. දවසක් මල්ලිට ඩෝං ගිහින් අයියත් සමග කියත් සමග මිනිස්සු

රොත්තක් යැව්වලු ගස්ටික කපලා පටවන්න. අයියගේ අවවාදය වුණේ ඕනෑම ගහක් කපාගෙන යන්න හැබැයි මේ වර්ගයේ ගස් නොකපා කියා ඔහු ගස් දෙකක නම් කිවුවලු. මේ මිනිසුන් දූවගෙන යනවලු ගහක් ළගට. බලනකොට ඒ කිවුව ජාතියේ ගහක්ලු. ඊළග එකටත් දුවනවලු ..ඒකත් ඒ ගහක්ලු.මෙහෙම ගස් දිහා බලාගෙන කට්ටිය හවස් වෙනකම් දුවලා කපන්න ගහක් නැතුව ආපසු ගියාලු.අයියා කියපු  ගස් දෙක -  කෙලින් ගස් සහ ඇද ගස්.

261. ඕගොල්ලන්ගේ එයා ලයින් එකට දීලා තියෙන කෝඩ් එක UL, ඇයි ඒ? 'යුශුඅර්ලි ලේට්'

262. හොඳ පදමට බීපු මල්ලියෙක් ගමන් ගන්නා ගුවන් යානයේ දොරක් අරින්න ගිහින් මිනිහාව ෆ්ලයිට් ඇටෙන්ඩන්ට්ලා අත් අඩංගුවට අරගෙන ආසනයකට බඳ පටි වලින් ගැට ගහලා තිබ්බා . කපටි කමින් අනුන මල්ලි සුදු තොප්පියක් දාපු දිගු රැවුලක් සහිත දුඹුරු පැහැවන් මිනිහෙකුව පෙන්නලා කීවාලු, අනේ සමාවෙන්න අරයා ගැන මට සැක හින්දා, දොර හොඳට ලොක් වෙලා තියෙනවද බලන්නයි  මම දොර ඇරලා වහන්න හැදුවේ කියලා. ප්ලේන් එකෙන් නිදහස් කරලා මිනිහාව එවලා තියෙන්නේ වීරයෙක් කරලා.

263. 'මම  බොහොම විවෘත පුද්ගලයෙක්' ; සර් එහෙම කිව්වේ කලිසමේ සිප් එක ගැන හින්දා වෙන්න ඇති?

264. මළ මිනියේ ෆොටෝ ගන්නකොටත් 'මේ පැත්ත බලලා හිනාවෙන්න' යයි කියන ඡායාරූප ශිල්පියෝ ඉන්නවා. මල්ශාලාව අයිතිකාරු ගෝලයාට - 'හෙට තියෙන මළ ගෙදර ගෙනියන්න අද විකුනපු මල්වඩම කනත්තෙන් අරගෙන එන්න ඕනා. මුරකාරයා වට පිටාවේ නැත්නම් අද කපපු මිනීවල හාරලා මිනියේ සූට් එක අරං වරෙන්, ඒක වටිනා 'දොන් බග්දාදී' වර්ගයේ අධි මිල සූට් එකක්'. 'හා මුදලාලි, ඔයා රීසයිකල් වලට තැනක් දෙන බව මේ ගමම දන්නවා'.

265. දවසක් වනමෝහිනීව මහා රෑ කනත්තේදී හම්බවෙච්ච මිනිහෙක්ගෙන් වනමොහිනි සුපුරුදු විදියට කියාලා තියෙනවා රෙද්ද ඇඳගන්න මේ ළමයව පොඩ්ඩක් වඩාගන්න කියලා. මිනිහා කිව්වලු මේ මාව ඕවට අල්ලන්න එන්න එපා ළමයාගේ තාත්තා මහසෝනානේ කියලා. බයවෙලා දුවලා තියෙන්නේ වනමොහිනි.

266. යහපත් මිනිහෙක් වනමොහිනිට කිව්වලු ළමයාව වඩාගන්නම්, ඔයා රෙද්ද ඇඳ ගන්න අර සොහොනට මුවා වෙලා කියලා, වනමෝහිනි ළමයාත් අරන් අන්තර්ධාන වෙලා.

267. මම අද පැමිණිල්ල දාන්න පොලිසියට ගියාම පැමිණිල්ල ලියන රාලහාමි කිවුවා 'ඔහොම බොරුවකට අහුවෙන්න ඔයා මොලේ උඩ වාඩිවෙන කෙනෙක් වෙන්න ඕන' කියලා. 'ඒ කියන්නෙ රාලහාමිට තේරිලා තියෙනවා

ඔයාගේ මොලේ තියෙන්නේ වෙන අයගේ ඒක තියෙන තැන නොවෙයි කියලා.'

268. ඔන්න දෙන්නෙක් කානිවල් එකකට ගියාලු. හැම අවුරුද්දේම තියෙන ඔය කානිවල් එකේ මිනිස්සුන්ට නැගලා රවුමක් යන්න පුලුවන් හෙලිකොප්ටරයක් තියෙනවාලු. ඕකේ යන්න මේ මහත්තයාට කාලෙක ඉඳන් බොහොම ආසාවක් තිබුණලු. ඒත් නෝනා හැමදාම, අනේ ඕකට ගොඩක් සල්ලි වියදම් වෙනවනේ කියලා වැඩේ නවත්වනවාලු. මේ දෙන්නා ඔහොම කතාවෙන එක ඇහිලා ගුවන් නියමුවා කීවලු, හරි මම ඔය දෙන්නාම නොමිලේම රවුමක් එක්ක යන්නම්, හැබැයි එක කොන්දේසියක් තියෙනවා කියලා. ගමන ගිහිල්ලා එනකම් එක වචනයක් හරි කතා කලොත් ඒ එක වචනයකට ගමන් ගාස්තුව බැගින් ගෙවන්න ඕන කියලා. දෙන්නම හා කියලා දැන් යනවලු. ගුවන් නියමුවා මේ දෙන්නාව කතා කරවන්න ඕන කියලා හිතලා දන්න කරණම් ඔක්කෝම දැම්මලු. ඒත් කිසි කතාවක් පිටිපස්සෙන් ඇහෙන්න් නැතිලු. ඊට පස්සේ කතා කරලා ඇහුවලු, හරි ඔය දෙන්නා දිනුම්, ඒත් කොහොමද එක වචනයක්වත් කතා නොකර හිටියේ කියලා. ඒ පාර මහත්තයා කියනවලු සල්ලි වටිනවනේ පය්ලට් ඔක්කොටම වඩා, ඒකයි මම නෝනා වැටිලවත් කිව්වේ නැත්තේ කියලා. නෝනා ප්ලේන් එකෙන් බිමට වැටුනට කිසි සද්දයක් බද්දයක් නැතිව කට තද කරගෙන උඩ බලාගෙනම ඉන්නවලු. බලන් ඉන්න මිනිස්සුන්ටත් හරි පුදුමයිලු. ඔන්න ටික වෙලාවකින් ඇතින් ප්ලේන් එක බිමට බාලා එන්ජිම නතර වුනාට පස්සේ, නැවතුනාට පස්සේ, නෝනා කෑ

ගහන්න ගත්තලු 'බුදු අම්මෝ, මගේ කොන්ද මාව බේරගනියෝ' කියලා’.

269. ඔයාට සීනි අමාරුව නැනේ, කාටද අනේ දැන් සීනි අමාරුව නැත්තේ කිලෝ එකක් කීයද දැන්?

270. තම සැමියා නින්දෙන් ගොරවනවා කියා බිරිඳක් දික්කසාද ඉල්ලා නඩු දැම්මා. ගරු විනිශ්‍යකාරතුමා අයදුම්පත නිෂ්ප්‍රභා කළා. හේතුව, බිරිඳ අවුරුදු 5ක් ගෙරවීම ඉවසා සිට නඩු දැමීමයි, පළමු දවසේම නඩුව දැම්මනම දික්කසාදය දෙන බව ගරු විනිශ්‍යකාරතුමා කිව්වා.

271. ගරු විනිශ්‍යකාරතුමා - යුෂ්මතාට නීතිඥයවරක් ඉන්නවද? චූදිතයා - නැහැ ස්වාමිනි. ගරු විනිශ්‍යකාරතුමා - ඇයි ඒ? චූදිතයා -මගේ යාලුවෙක් ජූරියේ ඉන්නවා.

272. දක්ෂ යයි කියාගන්න්නා, නමුත්, පන්දමට ටීම් එකට ගිය ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳගෙන් ක්‍රීඩාගාරය වෙත කෝල් එකක් ලැබුනේ තම සැමියාට කථා කරන්න අවශ්‍යයයි කියායි. ‘එයා මේ දැන් බැට් කරන්න පිටියට ගියා, පස්සේ ගන්න’ කියා ක්‍රීඩාගාරයේ ටෙලිෆෝන් ක්‍රියාකරු කිව්වා. ‘නැහැ, කමක් නැහැ මම අල්ලාගෙන ඉන්නනම්, මිනිහා ඉක්මනට පෙවිලියන් එකට ඒවී’ කියා බිරිඳ පිළිතුරු දුන්නා.

273. පඩි වැඩි කරන්න කියලා ලොක්කාගෙන් ඉල්ලුවහම ලොක්කා මොකද කිවේ? ලොක්කා එළුවෙක් වගේ හිලෑ උනානේ. ඇයි එයා මොකද කිවේ? 'බෑ' කිවා.

274. රුපියල් කොටි 2ක් අලාභ ඉල්ලා එන්තරවාසියක් යැවූ නිතින්ගාාවරයෙක් එහි අවසානයට ලීවා රුපියල් ලක්ෂ 2ක චෙක් පතක් ඔබගේ සේවාදායකයට දීමට මේ සමඟ එවීමට මට උපදෙස් ලැබී ඇත කියා. එවැනි චෙක් පතක් අමුණා නොතිබුණු බව හැරෙන තැපෑලෙන් ඔවුන් ඔහුට දැන්නුවා. 'හරි, ඒ කියන්නේ මගේ ලිපිය ඔබට ලැබුනානේ, ලිපියේ ප්‍රකාර කෝටි දෙක සති දෙකකින් නොගෙව්වොත් මා ඔබලාව උසාවි ගෙන යනවා' කියා ඔහු ප්‍රති උත්තර එව්වා.

275. නිරුවතින් බැංකුවට කඩාවැදුණු දාමරිකයා විශාල මුදලක් රැගෙන පලාගියේය. රහස් පොලිස් පරීක්ෂණ වලදී හෙලිවුයේ කාන්තා ගනුදෙනු කාරිනියන් බොහෝ දෙනෙකුට ඔහුගේ දේහ ලක්ෂණ මතක තිබූ නමුත් කිසිවකුටත් ඔහුගේ මුහුණේ හැඩරුව මතක නොතිබුණු බවයි.

276. දවසක් පාසලේදී ගුරුතුමෙක් උස් හඩින් ගුත්තිලය ලියුවේ කවුද ළමයිනේ කියලා ඇසුවාම, මම නම් නෙමේ සර් කියලා කිව්වලු ළමයෙක්. සිනා ගිය ගුරුතුමා සවස ගෙදර ගිහින් නෝනට කීව්වාලු සිද්ධිය. වෙන්න බැහැ ඒකාම තමයි ලියන්නේ ඇත්තේ කීව්වාලු නෝනා.

277. මීට කලකට පෙර පළාත් සභා පිහිටවපු අලුත එක්තරා පළාත් සභා මන්ත්‍රී වරයෙකුට නිල දුරකතනයක් දෙන්න රජයේ දුරකථන සමාගමෙන් ගියාලු. ගිහින් කිව්වලු අපි ආවේ ඔබතුමාට නිල දුරකථනයක් සවිකරන්ඩ කියල. ඒ පාර අපේ පළාත් සබා මන්ත්‍රී තුමා කියනවලු ,මේ නිල කතා කරන්න එපා,කොළ දුරකථනයක් ඕනා නම් හයිකරල යන්න නිල නම් මේ පලාතෙවත් නැහැකියල. ඒ පාර අපු කට්ටිය දුරකතනයේ කොලපාට පින්තාරු කරලා හයිකරලා දීලා.

278. ඔන්න දවසක් කොලුවා කොලුවාගේ තාත්තාගෙන් අහනවලු තාත්තේ, තාත්තගේ ලග්නේ මොකක්ද? තාත්තා කිවුවලු. මට ලග්න දෙකක් තියෙනවා පුතේ. උඹලගේ අම්මා බදින්න ඉස්සෙල්ලා මගේ ලග්නේ සිංහ, දැන් මගේ ලග්නේ කුම්භ.

279. ගිය මාසේ මම ඔයාට කහට පැල්ලම් අරින බේතක් වික්කා. තවත් එයින් බෝතලයක් ද ඕනෑ? නෑ, ඒ බේත් පැල්ලම අරින වෙන බේතක් නැද්ද?

280. චීනයේ: ප්‍රවාහන ඇමති - පීප් පීප්; තැපැල් ඇමති - ලියුන් ලියුන්; සෞඛ්‍ය ඇමති - ආච් ආච්; ආහාර ඇමති - චච් චච්; ආරක්ෂක ඇමති -ඩින් ඩෝන්; රජයේ වැඩ ඇමති - දඩින් බිඩින්; මුදල් ඇමති - සිලින් සිලින්; සුරතල් සතුන් ඇමති - මියාව් මියාව්.

281. හති දමමින් රත්තරන් කුසලානයක් රැගෙන ගෙදර දිව ආ සැමියා ඉක්මනට දොර වහන්නැයි බිරිඳගෙන් ඉල්ලුවා. බිරිඳ - කොහෙන්ද මේ කප් එක, කාගේද? සැමියා - රේස් එකේ දැනට මමයි පළවෙනියා. බිරිඳ - කවුද 2වෙනියා, කවුද 3වෙනියා? සැමියා - පොලිස් කාරයා සහ එම කප් එකේ නියම අයිතිකරු, ක්‍රීඩකයා

282. එක තාත්තෙක් ලොකු මුදලක් දීල ගෙනාවලු පොඩි ගැජට් එකක්. ඒකෙන් බොරු කිව්වහම කම්බුලට ගහනවා. නම රෝසි. රෑ කෑම එහෙම කාල තාත්තා මේක පරීෂා කරන්න ගෙනාවලු. .පුතාගෙන් ඇහුවලු අද හවස මොකද කලේ කියලා. පුතා කිව්වලු හෝම් වර්ක් කලා කියලා. රෝසි පුතාගේ කම්මුලට ගැහුවලු. ඒපාර පුතා කිව්වලු නෑ නෑ මම යාළුවොත් එක්ක චිත්‍රපටියක් බැලුවා කියලා. තාත්ත ඇහුවලු මොකද්ද බලපු චිත්‍රපටිය කියලා. පුතා කිව්වලු වෝ ෆිල්ම් එකක් කියලා. රෝසි ආයිත් පුතාගේ කම්මුලට ගැහුවලු. ඒ පාර පුතා කිව්වලු නෑ නෑ අපි බැලුවේ නිල් චිත්‍රපටියක් කියලා. ඒක අහල තාත්තා කිව්වලු මම ඔය වයසේදී නිල් චිත්‍රපටි කියන්නේ මොනවද කියලවත් මම දන්නේ නැහැ කියලා. රෝසි චටාස් ගාලා තාත්තගේ කම්මුලට ගැහුවලු. ඒ පාර අම්මා කිව්වලු තාත්තගෙම පුතා තමයි කියල. රෝසි අම්මගේ කම්මුලට ගැහුවලු. දැන් රෝසිගේ බැටරි අයින් කරලා පැත්තකට කරලා දාලා.

283. ඔයා මොකද අර අහවල් බ්‍රාන්ච් එකේ සල්ලි දාන්නේ හැම සතියෙම, හොර හතුරෝ ඉන්නවද? නෑ මහත්තයා ඉන්නවා එයාගෙන් බේරගන්න.

284. විවාහක පිරිමින් මහත් වීමටත් අවිවාහක පිරිමින් කෙට්ටුව් වීමටත් රහස කීම? අවිවාහක පිරිමින් ශිතකරණය වෙත යති. ඔවුහු එහි කිසිවක් නොදකිති. ඉන්පසු නින්දට යති. විවාහක පිරිමි නින්දට යති. තමන්ට අවශ්‍ය කිසිත් නොමැති බව දකිති. ඔවුහු ශීතකරණය වෙත යති.

285. මම නොකරපු වරදකට මිස් මට දඬුවම් කරනවා. ඇයි ඔයා එහෙම කියන්නේ? ඊයේ මට ගෙදරදී කරන්න කියලා දීපු වැඩ කලේ නැති නිසානේ ඔයා අද මට දඬුවම් දෙන්නේ.

286. දවසක් පුද්ගලික බස් එකක අක්කා කෙනක් කෑ ගැහුවලු අන්න අන්න අර මිනිහ මගේ පර්ස් එක අරන් පැන්නා කියල. බස් එකේ කාරුණික අය දනිපනිගාල හොරා අල්ලලා ලඟම තිබුන පෝලිසියට බාර දීල ගියාලු.පැමිණිල්ල විබාග කරනකොට රාලහාමි ඇහුවලු කොහෙද ඔය පසුම්බිය තිබුනේ කියල. කුමාරිහාමි අක්කා කීවාලු 'හැට්ටෙ අස්සෙ පර්ස් එක දාගෙන ඔසරි පොටෙන් වහගෙන' කිව්වලු. මේ මිනිහ මගේ ළඟ වාඩි වෙලා නිදිවගේ ඉන්න ගමන් හැට්ටෙ අස්සට අත දානවා දැනුනා කියලා. රාළහාමි කිව්වලු ඉතින් ඒ වෙලාවේනේ කනට ගහල මුගේ අතත් කඩලා දාන්න දාන්න තිබුනේ. මොකද සද්ද නැත්තේ, කතා කරනවා කියල රාළහාමි සැරකලාලු. එතකොට මේ අක්කා කියනවලු කව්ද රාළහාමි හිතුවේ එතෙන්ට අත දැම්මේ පර්ස් එක ගන්න කියල, මම හිතුවේ මෙයා ආදරේට මාව බඳියි කියාලා. මට විශ්වාස කරන්න බැහැ ඔය කථාව කියලා රාලහාමි කිවා. ගැනී දේවාලේ

කපුවාව ගෙන්නුවාම මිනිහා කිවුවා ඔවු එදා උදෙත් මේ නෝනා ඇවිල්ලා මනමාලයෙක් හොයලා දෙන්න කියලා බාරයක් උනා කියලා. රාලහාමි අක්කාට ඔයතරම් මෝඩ වෙන්න එපා කියාලා අවවාද කරලා ඇරියා.

287. මොකද බස් එකේ යනකොට ගෙදරදී පර්ස් එකට කුම්බලා කරවලයෙක් අතුල්ලා ගන්නේ. එතකොට කවදාවත් පර්ස් එක හොරෙක් ගන්නේ නැහැ, බස් එකේ මන් ගාව කවුරුවත් ඉඳ ගන්නෙත් නැහැ මුළු සීට් එකම මට.

288. පළාතේම ඕපාදූප එක් රැස් කරන අල්මේදා නෝනා ගෙදර එනවා දුටු සම්පත් වහාම කාමරයට ගොස් දොර වසා ගත්තා. පැය 3ක් ගෙවුනත් අල්මේදා නෝනා තවමත් ගෙයින් නොගොස් සිය බිරිඳ සමඟ ඇතුලේ කාමරයේ කථා කරමින් සිටීම සම්පත්ට ඉතා නොරිස්සුම් සහගත වුනා. ‘අර ඕපාදූප මල්ල තාමත් කාමරේද, ගියේ නැද්ද’ කියා ඔහු ශබ්ධ නගා තම බිරිඳගෙන් ඇසුවේ අල්මේදා නොනාටත් ඇහෙන්න. මේ වනවිට සම්පත්ගේ බිරිඳ සමඟ කථා කරමින් සිටි අල්මේදා මහත්මිය, ‘ඔව් අනේ එයා ගිහින්, මේ මිසිස් අල්මේදා නේ දැන් ඇවිත් ඉන්නේ’ කියා කිවුවා.

289. ‘මේ, අපේ ගෙදරට අහස් කූරක් බැරිවෙලාවත් ආවොත් නිවන්නෙ කොහොමද කියල ඉගෙන ගෙන ඉන්න එක හොඳයි නේද’? ඉන්න හාමිනේ මම අහස් ගුණ්ඩු මිටියක් ගෙනැල්ල ගේ මැද සාලෙ තියලා පත්තු කරලා බලන්නම් කොහොමද නිවන්නේ කියලා.

290. දක්ෂ වැදගත් දේශකයා දේශනය පවත්වන අතරතුර මෙසේ පැවසීය ‘මගේ ජිවිතයේ මා ගතකළ සොඳුරුම යුගය මගේ බිරිඳ නොවන කාන්තාවකගේ උරතලයේ හිස තබා ගතකල කාලයයි’ ප්‍රේක්ෂකාගාරය විශ්මයට පත් විය. කම්පනයටත් නිශ්ශබ්දතාවයටත් පත් විය. ඔහු ඊළග වැකිය පැවසීය. ‘ඒ තමයි මගේ අම්මා’ මේක අහගෙන හිටපු අපේ මන්ත්‍රීතුමා ගෙදරගිහිල්ලා අර පළවෙනි වාක්‍යය කිව්වා.ඔහුගේ බිරිද සුප් එකක් පිළියෙළ කරමින් සිටියා. මොහොතකින් ගිලන් රථයක් පැමිණෙන හඩ ඇසුණු අතර දරුණු පිළිස්සුම් තුවාල ලැබූ මන්ත්‍රීතුමා රෝහල්ගත කෙරුණා.

291. අම්මා - පුතා අද රෑට දඟ කලොත් කන්න දෙන්නේ නැහැ. පුතා - අම්මා අද රෑට උයන ජාතිය මට දැන්ම කියන්න.

292. චිත්‍රපටයේ ජවනිකාවක සැමියා බිරිඳගේ කම්මුලට ගසයි. ප්‍රේක්ෂකයෝ තුෂ්නිම්භූතව බලා සිටියි. මුළු ශාලාවම නිශ්ෂබ්ධයි. එක් ළමයෙක් උස් හඬින් තම මවට - ‘ ඇයි අම්මේ, අම්මා තාත්තාට ගහනවා වගේ එයා ඒ මිනිහාගේ මුහුනටයි, ඔලුවටයි ආපහු නොගහන්නේ?’

293. බස් එකේ දිගටම කිඹුහුන් යවන දරුවෙකුගෙන් වැඩිහිටියෙක් අහනවා ‘ළමයා ඔයාට ලේන්සුවක් නැද්ද?’. ළමයා කියනවා ‘තියෙනවා හැබැයි මම පිට අයට දෙන්නේ නැහැ’ කියා.

294. විවාහ පෙරහුරුවේදී මනමාලයා විවාහ රෙජිස්ට්‍රාර්ට කියනවා ‘ඔබ මේ තැනැත්තියව හොඳින් බලාගන්නවා නේද’ කියන ප්‍රශ්නේ හෙට මඟුලේදී මගෙන් අහන්න එපා කියාලා, රෙජිස්ට්‍රාර්ගේ සාක්කුවට රුපියල් 5000 නෝට්ටුවක් දානවා. මඟුල දවසේ රෙජිස්ට්‍රාර් සියළු දෙනා ඉදිරියේ මනමාලයාගෙන් අහනවා ‘ඔබ මේ තැනැත්තිය කියන සෑම දේම ඒ විදියටම කරන බවටත්, ඇයට සදා අවනතවී කීකරුව සිටීමටත්, ඇට සෑම දවසකම ආහාර වේල් තුනම ඉතා හොඳින් රසවත්ව උයා සපයන බවටත් මේ සෙනග ඉදිරියේ පොරොන්දු වෙනවා නේද’ කියා. සෙනග මධ්‍යයේ මනාලයා සිහින් හඬින් ‘ඔවු’ කියන ගමන් රෙජිස්ට්‍රාර්ට කිට්ටුවී අහනවා ‘ඊයේ මම ඔබට රුපියල් 5000ක් දුන්නා, අප අතර ගිවිසුමක් තියෙනවා නේද’ කියා. එවිට රෙජිස්ට්‍රාර් මනාලයාට හොරෙන් මුමුණනවා - ‘ඇය ඔබට වඩා හොඳ ගිවුසුමකට එළඹියා’.

295. දවසක් මුහුණේ කුරුලෑ තියෙන ගැහැනු ළමයෙක් ඇඳුම් ගන්න සාප්පුවකට ගියා. එකක් අරගෙන ආවා.ඒක ලොකු වැඩියි.ආපහු ගිහින් ඒක දීලා ටිකක් පොඩි එකක් ගෙනාවා.මේකත් ලොකු වැඩියි. මේ විදිහට 5 පාරක් විතර මාරු කළා.අන්තිමට කඩකාරයා තියෙන පොඩිම එක දුන්නා.මේකත් ලොකු වැඩියි කියලා මෙයා රිටන් කරන්න ගියා. පස්සේ මුදලාලි මෙයාට ක්‍රීම් එකක් තියෙන ටියුබ් එකක් දුන්නා.දීලා කියනවා නෝනා මේක නම් හරියටම හරි යයි කියලා. මේ කෙල්ල අහනවා ‘මේ මොකද මේ ක්‍රීම්

එකක්.මේක කොහොමද හරියන්නේ?' එතකොට මේ කඩකාරයා කියනවා 'නෝනා ඔයාට හරියන දේවල් මේ සාප්පුව් නැහැ මේ ක්‍රීම් එක හැර කියලා.

296. ගුරුවරයා - ' අපිට වැඩිය ළඟ කැනඩාවද, හඳද. ශිෂ්‍යයා - 'හඳ. ගුරුවරයා - ' ඇයි? ශිෂ්‍යයා - අපිට හඳ පේනවා, කැනඩාව පෙන්නේ නැහැ.

297. එක්තරා බිරිදක් සිය සැමියාට ආදරය ප්‍රකාශ කිරීම සඳහා මෙසේ කෙටි පණිවිඩ යැවීය. ඔබ මේ වෙලේ නිදාගෙන සිටී නම් ඔබ ගේ සිහින මට එවන්න, ඔබ සිනාසෙන්නේ නම් සිනහවෙන් බිදක් මට එවන්න , ඔබ ආහාර ගන්නේ නම් කටක් මට එවන්න, බොන්නේ නම් උගුරක් මට එවන්න, ඔබ හඬන්නේ නම් ඔබේ කඳුළු මට එවන්න.සැනෙකින් පිළිතුරු කෙටි පණිවිඩය ලැබුණි. මා දැන් සිටින්නේ බාත් රූම් එකේ කෙළ කාරමින්.

298. බිරිඳ - අද මේ ඩ්‍රයිවර්ව අස් කරලා දාන්නන ඕන. සැමියා - ඇයි? බිරිඳ -අද තුන් පාරක් කාර් එක බස් වල හප්පන්න හැදුවා, මම නුලෙන් බේරුනේ. සැමියා - අපි තව එක චාන්ස් එකක් මිනිහාට දීලා බලමු.

299. තාත්තා - පුංචි පුතා අඬන්න එපා, අම්මා ඔයාට ගහන්නේ ආදරේටනේ. පුතා - එහෙනම් මමත් අම්මාට ගහන්නම්, ඇයි, මාත් අම්මාට ආදරෙයිනෙ.

300. තාත්තේ තාත්තා පුංචි කාලේ තාත්තාට සීයා ගැහුවද? ඔවු. සීයාගෙ තාත්තා සීයාට ගහලා තියෙනවද? ඔවු. අනේ, තාත්තේ දැන්වත් මේ කැත පුරුද්ද අපේ පරම්පරාවෙන් අයින් කලොත් හොඳ නැද්ද?

301. තරමක් නගරබද පළාතක පිරිමි පාසලකට ගුරු පත්වීමක් ලද නවක ගුරුවරයෙක් සිය මංගල පන්ති වාරයට යාමට පෙර වැසිකිළියටද ගොස් වෙලාව ප්‍රමාද වී ඇති නිසා කඩිනමින් පන්තියට ගොඩ විය. ආචාර කිරීමෙන් අනතුරුව බෝඩ් ලෑල්ලේ යමක් ලියා පන්තිය දෙසට හැරුණු විට 12 වන පන්තියේ වූ ඒ ළමෝ සිනාසුනහ. තමා නවක නිසා එසේ සිනාසෙන්නේ යැයි සිතූ ඔහු 'මොකද හිනාවෙන්නේ' යයි ළමුන්ගෙන් ඇසිය. එවිට සිනහව තවත් වැඩිවිය. කෝපයට පත් ඔහු 'මම නවක හින්දද ඔහොම හිනා වෙන්නේ' යයි මහ හඬ නැගීය. එවිට ළමෝ කොක්හඩලා සිනාසුනහ. ශබ්දය ඇසී අසළ පන්ති කාමරයේ සිටි ගුරුතුමා එබිකම් කර, නවක ගුරුවරයා සමීපයට ගොස් ඔහුගේ කනට කර 'ඔය කලිසමේ සිප් එක දාගන්නකෝ' යැයි කිවේ තමන් තුලින්ද එන සිනහව තද කර ගනිමිනි.

302. රේල් ගේට්ටු මුරකරු සම්මුඛ පරීක්ෂණයට ගොස් සිටි මිනිසෙක්ගෙන් පරීක්ෂණ මණ්ඩලය ඇසුවා, කෝච්චි 2ක් එක පීල්ලේ විරුද්ධ පැති වලට ගමන් කරනවා නම් ඔබ ගේට්ටු මුරකරු විධියට මොකද කරන්නේ කියා. ඉක්මනට ලීවර් එක ඇදලා රේල් පාරවල් දෙක ඈත් කරනවා කියා ඔහු කිවා. හරි, ලීවරය වැඩ නොකලොත්? මම රතු කොඩිය අරං වනනවා. ඒක නම් මේ දේ සිද්ධ වුනේ? එහෙනම් භූමිතෙල්

ලාම්පුව අරං වනනවා. භූමිතෙල් ලාම්පුවේ ඉවර නම්? දුවලා ගිහිං භූමිතෙල් වක්කරගෙන එනවා. ස්ටෙසමේ භූමිතෙල් නැත්නම්? ඉක්මනට මගේ පුතාට කථා කරනවා. ඒ මොකටද? මම පුතාට කියනවා, පුතේ, හොඳට බලාගන්න, මේවාගේ කෝච්චි 2ක් එකට හැප්පෙනවා ඔයාට ආයි ලේසියෙන් බලා ගන්න වෙන්නේ නැහැ කියලා.

303. ළමයි හය දෙනෙකුගේ පියෙක් සිය බිරිඳට 'ළමයි හය දෙනාගේ අම්මා' කියා ආමන්ත්‍රණය කරනවා, ඇගේ නම කියන්නේ නැතුව. මුලදී මෙය ගණන් නොගත් බිරිඳ පසුව නිතරම සැමියා මේ නයින් තමන් ඇමතීම අසතුටු බව කිවත් ඔහු එය නතර කලේ නැහැ. දිනක් මේ දෙදෙනා ප්‍රිය සම්භාෂණයකට ගොස් සැමියා සිය බිරිඳට, විහිලුවට මෙන් සෙසු අය ඉදිරියේ 'ළමයි හය දෙනාගේ අම්මේ අපි දැන් ගෙදර යන්' කියා කියනවා. එවිට බිරිඳ හයියෙන් කියනවා 'ඔවු මම ලෑස්තියි, ළමයි හතර දෙනාගේ තාත්තේ කියා'.

304. ලලිත්, ඔයා මගේ නෝනගේ කොන්ඩේ එල්ලිලා මොනවාද ඔය කරන්නේ, උකුණෝ බෝකරගන්න නම් එපා හොදේ.

305. 1වන නිවැසියා - ළඟදි අපිට හොඳ මිනිස්සු ආශ්‍රය කරන්න ලැබේවි. 2 වන නිවැසියා -ඇයි? 1වන නිවැසියා - අපි වෙන පලාතක පදිංචියට යනවා. 2වන නිවැසියා -අපිටත් හොඳ මිනිස්සු ආශ්‍රය කරන්න ලැබේවි. 1 වන නිවැසියා -ඒ කොහොමද. 2 වන නිවැසියා - අපි මෙහෙම ඉන්නවා.

306. යදින මනුසයෙක් කාර් එකක යන නෝනා කෙනෙක් කලර් ලයිට් එකක් නැවැතුවම අතපාලා තියෙනවා ,නෝනා පසුම්බිය බැලුවාලු මාරු සල්ලි නැතිලු , නෝනා කිවලු අනේ කාඩ් එක විතරයි තියෙන්නේ අතේ සල්ලි නැත කියලා, ඒ පාර යදින්නා  කියනවලු ඒකට කමක් නැහැ නෝනේ මන් ගාව මොබයිල් එෆ්ටිපොස් මැෂින් එකක් තියෙනවා දෙන්න කැමතියි ගාන කියන්නකෝ මම ගන්නම් කියලා.

307. හොරෙකු නිවසකට ඇතුළු විය,  ගිනි අවිය පෙන්වා මෙසේ කීය . 'ඔබේ සියලුම මුදල් මේ මේසය මත තබන්න'. ගෙහිමියා මෙසේ කීය. මම අහවල් දේශපාලන පක්ෂේ ඇමතිවරයෙක් ''.  සොරා නැවත මෙසේ කීය. 'ඔබ ළඟ තිබෙන අපේ සියලුම මුදල් වහාම මේ මේසය මත තබනු'.

308. විවාහක යුවලක් ආලිංග නැටුම්  නටන්න ගියා. එතන නර්තන පොලවේ මිනිසෙක් නා නා විධියේ නැටුම් නටනවා - බ්රේක් ඩාන්ස්, මූන් වෝකින්, චා චා, වොල්ට්ස්, ඩිස්කෝ ආදී නා නා ප්‍රකාර නැටුම්. සැමියා දෙස බලා බිරිඳ කියනවා 'අර මනුස්සයා දැක්කද, මීට වසර 20ට උඩදී එයා මට විවාහ යෝජනා කළා, මං එයාව ප්‍රතික්ෂේප කළා'. සැමියා කිවා 'ඒ මිනිහා තාම ඒ ප්‍රීතිය සමරනවා  වගේ'.

309. මුද්දර හොරකම් කරපු පියන්ව නීතින්ඥයවරයා කථා කර නඩුවෙන් බේරා ගත්තා. නීතින්ඥයවරයා තම ගාස්තුව

ඉල්ලුවා. සල්ලි නම් ගෙවන්න නැහැ සර්, මුද්දරවලින් ගෙවන්නම් කියා පියන් කිවා.

310. දවසක් මගේ නිවස අසල ඩිස්පෙන්සරියට මාමා කෙනෙක් පණ එපා කියල දුවගෙන ආවා කලිසම පිටින්. පිටිපස්සෙනුත් නැන්දා කෙනෙක් දුවගෙන ආවා. තවත් කීප දෙනෙක් රංචුව පිටින් දුවගෙන ආවා. මමත් ඉහල මහලේ ඉදලා බලා හිටියා වෙනදේ මොකද්ද කියලා. පස්සේ දැන ගන්න ලැබුණා පණ එපා කියල දොස්තර මහත්තයා හොයාගෙන ඇවිල්ලා තියෙන්නේ. හදිසියට කලිසමේ සිප් එකට අර මාමාට පොඩි වින්නැහියක් වෙලාලු.

311. සුද්දා - ඇයි, මගේ දිහා කෙළ හල හල ඔරවා ඔරවා බලන්නේ? වනචාරියා - මම තමයි මේ ගෝත්‍රයේ ප්‍රධාන ආහාර පරීක්ෂක.

312. වෛද්‍යවරයා හමුවීමට කාන්තාවක් ගොස් තම සැමියා රෑට සිහිනෙන් කථා කිරීම ගැන බෙහෙතක් ඉල්වා සිටියා. හරි මම බෙහෙත් පෙත්තක් දෙන්නම්, එයා රෑට කථා කරන එක සම්පූර්ණයෙන්ම නවත්වයි කියා දොස්තර කිවා. නෑ ඩොක්ටර් මට ඕනා එයාට මිට වඩා පැහැදිලිව රෑට හීනෙන් කතා කරන්න පුළුවන් විදියේ බෙහෙතක්. මොකද, දැන් එයා කියන ගොඩාක් දේවල් මට තේරෙන්නේ නැහැ, පැහැදිලි නැති නිසා, කියා ඇය කීවා.

313. අලුතෙන් පාසලට ඇතුල්වූ ළමයා හඬන්න පටන් ගත්තා. ගුරුතුමා ඇසුවහම ඇය කිවා මම ආස නැහැ

මෙතනට, අම්මා කිවා මම තව අවුරුදු 12 ක් මෙතන ඉන්නා ඕන කියාලා, මට තව එක දවසක්වත් මෙතන ඉන්න බැහැ කියා. එවිට ගුරුතුමා කියනවා එහෙනම් මම කොච්චර අඩන්න ඕනද, මම අවුරුදු 60 වෙනකම් මෙතන ඉන්න ඕනනේ.

314. සුදු ඒජන්ත ගැමියාට 'එන්ටර්' කිවුවා, ගැමියාට ඇහුනා 'එන්ට' කියලා; ඉතින් ඇතුලට ගිහිල්ලා වැඩේ කරගෙන (සුද්දගේ අත්සන ගහගෙන) ආවා. එදා ඉඳන් ගමේම අය ගැමියාට කියලා වැඩ ගන්න එනවා, එයාට හොඳට ඉංග්‍රිසි පුළුවන් කියලා හිතාගෙන.

315. අල්ලපු ගෙදර ඇන්ටි ගේට්ටුව වහලා ගමනක් ගිහින් ආවේ සවස් කාලයේලු. ගේට්ටුව අරින ශබ්දය ඇසිලා පොඩි එකා දුවගෙන,දුවගෙන ගොස් ඇන්ටි බදා ගෙන කිවුවලු, ඇන්ටි නැති වෙලාවේ අපේ අම්මා පාත්තියේ හිටපු සේරම ගොළු බෙල්ලෝ එකතු කරලා විසි කලේ ඇන්ටිගේ වත්තට කියාලා. ඇන්ටි තරහෙන් වෙව්ලලා.

316. ටීචර් කෙනෙක් දවසක් කිවුවලු හෞමික අඛණ්ඩතාවය, තද වානේ කම්බි, සෛවරීභාවය වගේ සමාන වචනයක් කියන්න කියලා. කොල්ලා කිව්වලු කන්‍යාභාවය කියලා.

317. දවසක් ටීචර් ළමයින්ට හරකා තණ කනහැටි අඳින්න කිවුවලු. හැමෝම ලස්සනට චිත්‍රය ඇඳලා තිබුනලු. ඒත් එක ළමයෙක් සුදු කොලයක රවුම් හිස් කොටුවක තන කොළ

ගස් ටිකක් පමණක් ඇඳලා ඈතට පොඩියට වාහනයක් එක්ක ටීචර්ට දුන්නලු. ඊට පසු ටීචර් ඇහුවලු කෝ ළමයෝ හරකා කියලා. හරකා තණකොළ කනකොට කවුද මස් කඩයට ලොරියක නග්ගගන ගිහිල්ලා කියලා ළමයා උත්තර දුන්නලු.

318. ඔන්න අපේ මනුස්සයෙක් අපායේ ගියාලු. යම රජ්ජුරුවෝ මෙයාට කිව්වලු කැමති දඩුවමක් තෝරාගන්න කියල. ඉතින් යම පල්ලෝ මෙයාව එක්කරගෙන ගියාලු පෙන්නන්න. තැනක කටුඉඹුලේ යනවලු .තැනක ලෝදිය බොනවලු, තැනක කියතෙන් ඉරනවලු, තව තැනක උලකින් හිල්කරනවලු. ඔහොම බලාගෙන යනකොට එකතැනක මිනිහෙක් අසූචි වලක දුම්වැටියක් පානයකරමින් ඉන්නවලු. දැක්කගමන් අපේ මිනිහ ඒ දඩුවම තොරගත්තලු. දැන් අපේ මිනිහ වලට බැහැල දුම්වැටිය දල්වාගෙන ඉන්නවලු. මෙන්න යමපල්ලෙක් ඇවිත් කිව්වලු විවේක කාලය ඉවරයි දැන් ඔලුවෙන් හිටගන්න කියල.

319. සුද්දෙක් වැනල් රෝහලේ කවුන්ටරයකින් දොස්තරකෙනෙක්ව ඉල්ලනවා 'අයි වෝන්ට් අ ඩොක්ටර් ටු ඩයි'. කවුන්ටරයේ සේවිකාව දුවලා ඇතුලට ගොස් වහාම නර්ස් කෙනෙක් එක්ක එනවා 'සිස්ටර් මෙයාට මැරෙන්න ඩොක්ටර් කෙනෙක් ඕනලු'. නර්ස් සුද්දට කථා කලාමලු තේරුනේ මිනිහා කියලා තියෙන්නේ දොස්තර කෙනෙක්ව අද (today) බලන්න ඕන කියලා.

320. ‘අපේ බල්ලා හරි ෂෝක් බල්ලා, ඌ පාන්දරම ගිහිල්ලා පත්තර අරං එනවා’. ‘ඔයිට වැඩිය හොඳ බල්ලෝ ඉන්නවා, කඩේටම ගිහින් අරං එන’. ‘නෑ මූ අරං එන්නේ උදේට පත්තර කාරයා අල්ලපු ගෙවල් වලට දාලා යන පත්තර’.

321. දවසක් මගේ යාලුවෙක් ලයිසන් නැතුව යතුරුපැදියක යන ගමන් මට ලිෆ්ට් එකක් දුන්නා. මම දන්නේ නැහැ ලයිසන් නැති කතාව. ටික දුරක් යනකොට පොලිසියෙන් නවත්වන්න නියෝග කලාම යාළුවා කරපු වැඩේ නොනවත්වා පලා ගියා. නවත්තන්න කියලා මම මොන තරම් කිව්වත් නැවැත්තුවේ නැහැ. පොලිසියත් පස්සෙන්ම ආවා. අතුරු පාරවල් වලත් ගිහින් බැරිම තැන තාප්පයක් ළඟ නතර වෙලා යාලුවා කිවුවා තාප්පෙන් පනිමු කියලා පැන්නා. මාත් පැන්නා, මම වැටුනේ වහලයක් උඩට. වහලේ කඩාගෙන කාමරයක් ඇතුලට වැටුනා. කාමරේ හිටියේ තරුණියක්. එයා කෑ ගහගෙන එලියට දිව්වා. මේ වෙලාවට මන්නයක් අරගෙන කාමරේට ආවේ අර තරුණියගේ සහෝදරයා. මිනිහා මන්නේ බෙල්ලට තියලා මාව පොලිසියට එක්කරගෙන ගියා. පොලීසියෙන් මාව ලෝකප් කරලා පිටු 4ක චෝදනා පත්‍රයක් ඉදිරිපත් කළා උසාවියට. සුමාන හතරක් රිමාන්ඩ් එකේ ඉඳලා එලියට ආවේ ඇප අරං.

322. සුද්දෙකුයි, ජර්මන් කාරයෙකුයි කෝච්චියේ යනවා එක සීට් එකේ ළඟ ඉඳගෙන. ඉස්සරහ සීට් එකේ මේ ගොල්ලන්ගේ ආසනයට මුහුණලා ඉඳගෙන හිටියේ ආච්චි

කෙනෙකුයි තරුණියකුයි. කෝච්චිය බිංගෙයක් මැදින් ගියා ලයිට් නැතුව කළුවරේ. චටාස් ගාලා තද කම්මුල් පාරක සද්දයක් ඇහුනා. ඊට පස්සේ සියල්ල නිශ්ශබ්දයි. ආච්චි හිතනවා 'මුන් දෙන්නගෙන් එකෙක් කෙල්ලව ඉඹින්න ගිහින් හොඳ කම්මුල් පාරක් කන්න ඇති' කියලා. තරුණිය හිතනවා 'මුන් දෙන්නගෙන් එකෙක් මාව කියලා ආච්චිව ඉඹින්න ගිහින් හොඳට කෑවා' කියලා. සුද්දා හිතනවා 'මේ ජර්මන් කාරයා කෙල්ලව ඉඹින්න ගිහින් කෙල්ල උෟට ගහපු පාර අහක හිටපු මටයි වැදුනේ' කියලා. ජර්මන් කාරයා හිතනවා 'හිටපන්කෝ ආයෙත් බිංගෙයක් එනකල් සුද්දෝ, දෙන්නම් උඹෙ අනික් කම්මුලත් ඇදවෙලා යන්නම' කියලා.

323. රජතුමා - මාගේ මේ අග්‍ර පුරෝහිත බමුණාට මෝඩයා කියා කීම නිසා මම නුඹට 12 මසක සිර දඬුවමක් දෙනවා. මාස 3ක් රජ වාසලට අපහාස කිරීම. මාස 9ක් රාජ්‍ය රහස් හෙළිකිරීම.

324. පරණ මිනීවළවල් සොයා යන ගවේෂකයෙකුට හමු උනා අති පැරණි සොහොන් කොතක්. එය මැද තිබුනා පරණ පිත්තල පහනක්. මිනිහා පහන මදින කොට භූතයෙක් පෙනී සිටියා. නුඹ මේ ලෝකයේ වැඩියෙන්ම අකැමැති පුද්ගලයා කවුද? කවුද ඉතින් මගේ බොසා මිසක්. මා ගාව මහා බලසම්පන්න වර 3ක් තියෙනවා, නුඹට ඒවා දෙන්න පුළුවන් හැබැයි නුඹට දෙන වර මෙන් 3 ගුණයක් නුඹ අකමැතිම පුද්ගලයාට ලැබෙනවා. නුඹට වර අවශ්‍යද? එසේය ස්වාමිනි, 1වැනි වරයට මට රුපියල් බිලියනයක්

ඕන. හරි මෙන්න බිලියනය, හැබැයි නුඹේ බොසාට බිලියන 2ක් ලැබෙනවා. 2වැනි වරයට මට විශාල ඇති සුඛෝපභෝගී නිවසක් ලබා දෙන්න. හරි මෙන්න දුන්නා, නුඹේ  බොසාට මෙවැනි ගෙවල් 2ක් ලැබෙනවා. 3වැනි වරයට මට මාව බාගෙට මැරෙන කෝට්ටු පාරවල් දෙන්න, බොසාට ඒ වගේ දෙගුණයක් ලැබෙනවනේ.

325. බස් එකේදී කාන්තාවකගේ  උරහිසේ නිදා ගන්න ගිය මිනිහෙකුට හොඳ කනේ පාරක් ලැබුනා. පස්සේ පොලිසියට භාර දුන්නා. උරහිසේ නිදියාම තහනම් කියලා බෝඩ් එකක් ගහලා තිබුනේ නැහැනේ ස්වාමිනි කියලා මිනිහාගේ ලෝයර් උසාවියේදී  කියනවා.

326. බස් එකේ මේ ආසන කාන්තා පක්ෂයට පමණයි කියලා ගහලා තිබුනා. පිරිමියාගේ මානව හිමිකම් බිඳලා කියලා මිනිහා ජෙනිවා ගිහිල්ලා වන්දි ඉල්ලනවා කියලා ඇතුලේ බස් එක ඇතුලේ මහා හඬින් කෑ ගහනවා. එක කාන්තාවක් නැගිටලා ආසනේ දුන්නා.

327. ඉස්සර කාලේ සංචාරක වෙළෙන්දෝ වගයක් එක රටකට ඇවිත් ඒ රටේ ඉන්න බොහොම අහංකාර රජතුමාව හමු වුනාලු. ඔවුන් පියාඹන අශ්වයන් ගෙනත් දෙන්න තමන්ට පුළුවන් බව රජුට දැනුම් දුන්නලු. රජ්ජුරුවෝ පියාඹන අශ්වයින් ගෙන ඒමට රන්කාසි දහස් ගණනක් වෙළෙන්දන්ට දුන්නා. ඒවත් අරන් උන් ගියා ගියාමයි ආපහු ආවේ නැහැ. මේක දැනගත් පුරෝහිත රජුට කිව්වා ලෝකයේ ලොකුම මෝඩයන්ගේ ලැයිස්තුවක් හැදුවොත්

ඒකේ අංක එකට එයා රජුගේ නම දානවා කියලා. රජු කිව්වා හොඳයි බැරි වෙලාවත් වෙළෙන්දෝ ආපහු ආවොත් මොකද කියලා. පුරෝහිත කියනව, 'එහෙනම් මම ඔබ වහන්සේගේ නම කපලා උන්ගේ නම් ටික මුලින්ම ලියනවා' කියලා.

328. මේ ඊයේ පෙරේද දවසක වතුර හිඳුනු වලක ඉබ්බෙක් හිටියලු. මාලුකන්න කොක්කු දෙන්නෙකුත් ආවලු. ඉබ්බා කිව්වලු අනේ යාලුවනේ මාව වතුර තියන විලකට ගෙනියන්න කියලා. ඒ පාර කොක්කු කිව්වලු අපෝ අපෝ අපිට නම් බැහැ ඔයාලගේ මුත්තා කෙනෙක් එහෙම ගෙනිහිල්ල කට වරද්දගෙන වැටිලා මරුනා අපිට නම් බැහැ ආයේ ඒවගේ වැඩ කරන්න කියලා. ඒ පාර ඉබ්බා කිව්වලු මම එහෙම අපේ මුත්තා වගේ මෝඩ නැහැ, මම කටවහගෙන ඉන්නම් මාව ගෙනියන්න කියලා. එහෙනම් හා කියල කොක්කු දෙන්නා කෝටුවක් ගෙනල්ලා කොටුවේ කොන් දෙක තම කටවල් වලින් අල්ලාගෙන ඉබ්බාව අරන් අහසට නැග්ගලු, දැන් යනවලු. වෙලේ කොල්ලෝ වගයක් ක්‍රිකට් ගහනවලු. මේක දැකපු කොල්ලෝ 'මෙන්න කොක්කු දෙන්නෙක් ඉබ්බෙකුට මුට්ටිය අල්ලනවෝ කියලා කෑගැහුවලු'. කොක්කුන්ට තරහ ගිහින් කිව්වලු 'කවදද බොලව් කොක්කු ඉබ්බන්ට මුට්ටිය ඇල්ලුවේ කියලා'. මෙන්න දැන් කෝටුව කටේ තියාගෙන ඉබ්බා වැටෙනවලු. කොක්කු දෙන්නා ඉක්මනට පහලට පියාඹලා කොන්දෙක කටවල් වලින් අල්ලා ගත්තලු. ඉබ්බා කිව්වලු, 'තැන්ක් යූ මචං' කියලා.

329. මිණිපිරිය, කිරිඅම්මාට මෙසේ කිව්වලු . කුඩා කාලයේ පටන් කිරි අම්මා මාව හදා වඩා ගත්තට ගොඩක් පින්.මමත් බබෙක් හදාගත්ත වහාම කිරි අම්මාව එක්ක ගිහින් හොඳට සලකනවා. මගේ බබාවත් දැන් ඔයා මාව නිදි කරවනාවා වගේම නිදිකරවන්නකෝ කියලා. කිරිඅම්මා ජොබ් එක බාරගත්තා.

330. සේනට වාසෙක්තමි ශල්‍යකර්මය කිරීමට තිබුනේ විනාඩි කිහිපයක් පමණයි, ඔහුගේ සොහොයුරා සහ නෑනා සිය දරුවාද කිහිල්ලී ගසාගෙන සේන බැලීමට රෝහල් කාමරයට දුවගෙන ආවා.'නවත්වන්න, මේක කරන්න එපා' කියා සොහොයුරා කෑ ගැසුවා. 'ඇයි' කියා සේන ඇහුවා? 'මටයි මගේ බිරිඳටයි ඉන්නවා වගේ, මේ වගේ, ලස්සන දරුවෙක් හදන්න ඔබ කැමති නැද්ද?' සේන මුකුත් කිවේ නැහැ. සොහොයුරා ආයි කියනවා 'සේන මට ඥාති පුතෙක් ඕනා, ඔයා මාව බාප්පා කෙනෙක් කරන්න ඕන'. තවදුරටත් බලාසිටිය නොහැකි වූ සේන නෑනා දෙසද කනගාටුවෙන් බලා 'අයියේ ඔයාට ඥාති පුතෙක් ඕනා?, බාප්පා කෙනෙක් වෙන්න ඕනා?' 'ඔවු' කියා සොහොයුරා කිව්වා. 'අයියේ, මෙය ගෞරවයක්, ඔබට සුභ පැතුම්, ඔයා බාප්පා කෙනෙක්, ඔයා ඔය වඩා ගෙන ඉන්නේ ඔයාගේ ඥාති පුතා'.

331. අන්න සුදු කොහෙක් පිටිපස්සේ තාප්පේ වැහලා. ඔවු මාත් දැක්කා ඌට තියෙන්නේ කහ දත් නේද?

332. ගේ ලග ලිඳේ ගෑනු අය නානව බලන්න වයසක මිනිහෙක් ගහකට නැගලා. මිනිහට හදිසියේ ගහෙන් බහින්න බැරි වෙලා මොකද ගෑනු අය හැම තිස්සෙම නාන්න එන නිසා. අන්තිමට මිනිහට ගහ උඩ නින්ද ගිහින්.

333. දිනක් මිතුරෙක් බයිකලයේ ලයිට් නැතුව ගිහින් පොලිසියට අහුවෙලා. බලනකොට ලයිසනුත් නැහැ. දැන් රාලහාමි ඇහුවාලු, කියනවා නම. ඥානපාල කිවුවාලු. ඊලගට ටිකක් සැරෙන් මෙහෙම ඇහුවාලු. ගම කොහෙද? කොම්පඤ්ඤවීදිය. රස්සාව - මංඤ්ඤක්කා විකිණීම. දැන් රාලහමිට මේවා ලියා ගන්න බැහැල්ලු. පස්සේ මෙහෙම කිවුවාලු. යනවා යනවා තමුසෙලා එනවා මෙතන පවු දෙන්න අපිට තියෙන කරදර මදිවාට කියා.

334. හෙල්මට් නැතිව ගිහින් අහු උනාලු. ඇහුවලු මොකක්ද රැකියාව කියලා? මිනිහා කිව්වලු, ස්පාඤ්ඤයට පිපිඤ්ඤා පටවනවා කියලා. ලිවීමට දුර්වල රාලහාමි කිව්වලු පලයන් ආයෙ අහුවෙන්න එපා කියල.

335. අපේ අයියා කෙනෙක් පිල්ම් එකක් ගැහුවා - ඒකේ නම - සහෝදර අක්කා

336. ‘ඔයා දවසක් පොලිස් කුඩුවේ හිටියා කියන්නේ?’. ’ඔවු අනේ’. ‘ඒ මොකද’?. ‘විශ්ව විද්‍යාලේ සිංහල සාහිත්‍යට ඒ දවස්වල කලේ ‘ගම්පෙරලිය’ පොත, ඉතින් ඕක උඩින්ම තියාගෙන මා ගමන් කලේ. ගම් පෙරලන අය තමා ඊළගට

රටත් පෙරලන්නේ කියලා කැම්පස් ගාඩ් රූම් එකේ රාලහාමි මාව අල්ලාගෙන පොලිසියට ගෙනිච්චා'.

337. ඔන්න දවසක් ලොරියක් හයි ස්පීඩ් ආවලු. පොලිස් නිලධාරී මහත්තයා නතර කරන්ඩ අත දුන්නලු ඒත් නතර කලේ නැහැල්ලු. කඩාගෙන ගියාලු. ඒපාර පොලිස් නිලධාරී මහත්තයා එතන හිටපු රාළහාමිලා දෙන්නට කිව්වලු පන්නලා ගිහින් වාහනේ නොම්මරේ ලියාගෙන එන්න කියල. රාළහාමිලා දෙන්න ට්‍රැෆික් බයික් එකේ ගිහින් ලියාගෙන ආවලු. ඇවිත් කිව්වලු එහෙම කොහොමද අපෙන් බේරිලා යන්නේ අපි ලියාගෙන ආවා, මෙන්න නොම්මරේ: KMPH48 කියලා.

338. අපේ පැත්තේ මනුස්සයෙක් හිටියා, එයාට විභාග ගැන දැනුමක් නැහැ. ඒත් හැමෝගෙන්ම ප්‍රතිපල අහනවා. මගෙනුත් ඇහුවා (ඒ කාලේ වැඩ 4 යි උසස්පෙළට). මම කිව්වා ජේ 2යි එල් 2යි කියලා. මට කිව්වා ඊලඟ පාර උනන්දු වෙන්න කියලා.

339. දොස්තර කොන්දොස්තර මල්ලිගේ දත් ඇන්ද නෙරා තියෙනවා නේද කිවුවාහම, මිනිහාට කේන්ති ගිහිලා කියලා තියෙනවා 'ඔයා නිකම්ම දොස්තර, මම කොන් දෙකේම දොස්තර' කියලා.

340. හොඳටම වෙරි උන මිනිසෙක් බාර් එකේදී මහා හඩින් තව මිනිසෙකුට කියනවා 'මට තමුසෙගේ අම්මත්

එක්ක නරක සම්බන්ධයක් තියෙන්නේ.' බාර් එකේ මිනිස්සු අනිත් මිනිසාගේ ප්‍රතිචාරය දෙස බලාසිටියා. 'තාත්තේ ඔයාට දැන් හොඳටම වැඩියිනේ ගෙදර යන්න.'

341. දත් ඉදිරියට ආපු අපේ අක්කාගේ උපාධි ෆොටෝ එක ප්‍රේම් කලේ නැත්තේ ඇයි කියලා ඇහුවහම එයාගේ හස්බන්ඩ් දීපු උත්තරේට අක්කා ලොකු හා හෝවක් දා ගෙන. හස්බන්ඩ් කියනවා මම ගිහිල්ලා කීප වාරයක් දුන්නා, ප්‍රේම් කරන්න, කවුරුවත් බාර ගන්නේ නෑ. ප්‍රේම් කරපු ගමන් වීදුරුව බිඳෙනවා කියලා ඒ අය කියනවානේ.

342. නව අවුරුදු උදාව වෙනුවෙන් විවාහක යුවල් බොහොමයක් තමන් නිති පතා කාලය ගතකරන රාත්‍රී සමාජ ශාලාව වෙත ගොස් තිබුනා. රෑ 12 කණිසම ළං වෙද්දී, ස්ත්‍රියක් සමාජ ශාලාවේ බාර් එක ළඟ සිට කෑ ගසා 'මා ඉල්ලනවා මෙතැන සිටින සෑම ස්වාමි පුරුෂයෙක්ගෙන්ම මේ ගෙවුණු වසරේ ඔබගේ ජිවිතය පලදායි කිරීමට ඔබට සහාය වූ පුද්ගලයා ළඟට වඩාත් කිට්ටු වී ඉන්න කියා'. 12 කණිසම වදිනකොට බාර් එකේ අරක්කු කිරා වීදුරුවලට වත් කරන බාර් කීපර් වටා මිනිස්සු තෙරපෙමින්, පොදී ගැසෙමින් ඒකරාශි වෙනවා දක්නට ලැබුනා.

343. නුගේගොඩ - කොටහේන බස් එකේ නිතර යන ගැහැණු ළමයෙකුගෙන් එයාගේ අම්මා අහපු කතාවක්: බොරැල්ලට ඇඳුම් ගන්න ගිහින් ගෙදර යන්න තිබුන ඔබ ඇයි බොරැල්ලෙන් නැතුව කොටහෙනෙන් බැස්සේ? නෑ

මේ, මම ජංගම දුරකතනෙනේ හිටියේ, දන්නේනම නැහැ බස් එක කොටහේනටම ගිහින්.

344. දවසක් එක සංචාරකයෙක් (මහාචාර්යවරයෙක්) බෝට්ටු පදවන්නගෙන් ඇසුවලු ඩූ යූ නෝ සයිකොලොජි කියලා. බෝට්ටු පදවන්නා කිව්වලු නැහැ කියලා. ඊට පස්සේ මහාචාර්යවරයා එයා දන්න අරලොජි මේලොජි ඔක්කොම ඇහුවලු.බෝට්ටු පදවන්නා සමාවෙන්න මම දන්නේ නැහැ කියල හැම දෙයටම කිව්වලු.කේන්ති ගිය සංචාරකයා කිව්වලු තමුසේ මහා බූරුවෙක් පොතක් පතක් කියවන්නේ නැද්ද කියලා. ඔන්න දැන් බෝට්ටුව ගඟ මැදට එනකොට පෙරලුනලු. පීනන්න දන්නා බෝට්ටුකරු ඇහුවලු ඩූ යූ නෝ ස්විම්ලොජි කියලා. මහාචාර්ය වරයා කිව්වලු නැහැ කියලා.එතකොට බෝට්ටුකරු කියනවලු ඔහේ මහාචාර්යවරයෙක් වුනාට පීනන්න දන්නෙත් නැහැ, බිකෝස් ඔෆ් යුවර් බෑඩ් මවුත්ලොජි, අයි විල් නොට් හෙල්ප්ලොජි, ක්‍රොකඩයිල්ලොජි විල් ඊට් යුවර් බැක්ලොජි කියලා.

345. පුතේ හෘදය සහ මොලය පිළිබඳ දොස්තර වරයෙකු වෙන්න එපා; දත් දොස්තර වරයෙකු වෙන්න මිනිසෙකුට දත් 32 ඇති අතර හෘදය සහ මොලය ඇත්තේ එකක් බැගිනි.

346. පියා පුතාට ගණන් උගන්වනවා. පුතේ 9යි 5යි කීයද? පුතා කියනවා 13යි කියා. පියාගේ මුහුණ ඇඹුල් වෙනවා. අම්මා ප්‍රීතියෙන් කියනවා, නරක නැහැනේ අපේ කොල්ලා. එකයි නේ එහා මෙහා උනේ කියලා.

347. වළ පයයි, ගොඩ පයයි ඉන්න අන්කල් කෙනෙක් විවාහ උනා නාඹර තරුණියක් එක්ක. යාලුවෝ විහුළු කරනකොට මිනිහා කියනවා පරණ මොරිස් මයිනර් තාම දුවනවලු ලන්ඩන් වල, ඒවාට එහේ ෆුල් ඩිමාන්ඩ් ලු.

348. සිය බිරිඳ සේරා අවසන් හුස්ම හෙලන මොහොතේ පීටර් ඇගේ ඇඳ මත්තේ සිටියා. 'මා ආදරණීය පීටර්, මිය යාමට මොහොතක් මත්තෙන් සිටින මට ඔබට කීමට දෙයක් තියෙනවා; ඔබගේ රුපියල් ලක්ෂ 10 සේප්පුවෙන් හොරකම් කලේ මමයි, ඔබගේ හොඳම මිතුරු ජෝන් සමඟ මගේ අයථා සම්බන්ධයක් මට තිබුනා, එපමනක් නොවේ ඔබේ හොර අඹුව මේ නගරයෙන් පලවා හරියෙත් මමයි. තවද, ඔබව ආදායම් බදු කාර්යාලයට අල්ලා දුන්නෙත් මමයි.' 'ඒවා ගැන හිතන්න එපා, ආදර බිරිඳ, ඔබට ඔය වස දුන්නේ කවුරුන් කියලද ඔබ හිතන්නේ?' කියා පීටර් කියනවා.

349. අලුත් බෑනා ගැන ඩන්කන් මහතා සිටියේ ඉතා නොකැමැත්තෙන්. එයාට බොන්න බැහැ, කාඩ් ගහන්න බැහැ, කියා ඔහු නිතර අඩාපාලි කිව්වා. දවසක් හොඳම යාලුවා වන ෆර්නැන්ඩෝට කියනවා 'මං දන්නේ නැහැ මොන මිනිහෙක්ද කියලා, එහෙමද බෑනලා ඉන්නා ඕනා. එයාට බොන්න බෑ, ඒත් බොනවා. කාඩ් ගහන්න බෑ ඒත් කාඩ් ගහනවා' කියා.

350. ඔන්න අපේ කෙනෙක් අරාබි රස්සාවකට අරාබි ආවා. හරියට අරාබි දන්නේ නැති මුල් කාලේ දවසක් නගරයේ ඇවිදින කොට තද බල බඩේ අමාරුවක් දැනුණා. ඉතින් කඩේකට ගිහින් වැසිකිළි යන්න ඕනෑ කියලා කියන්න උත්සාහ කළා. ඒත් කඩේ අරාබියාට තේරුණේ නැහැ. බැරිම තැන තමන්ගේ පසු පසට ඇගිල්ල දික්කරලා හස්ත සංඥාගයාවෙන් පෙන්වන්න උත්සාහ කළා. ඒ පාර අරාබියා අපේ යාළුවව කඩේ ඇතුළට අඬගහගෙන ගියා. හදිසියට කලිසමත් බුරුල් කරගෙන යාලුවා වට පිට බලනවා වැසිකිළිය කෝ කියලා. එතකොට යාලුවා දැක්කේ. අරාබියා අන්ඩවෙයා වගයක් ගෙනත් විකුනන්න පෙන්වනවලු.

351. ‘ළමයි උගත් කම තිබුනට මදි’. ‘එහෙනම් උගත්කම මදිකමක් නොවේද සර්?’

352. එක්තරා බීම හලක මෙසේ ලියා තිබුනා - ‘ඔබ බොන්නේ ප්‍රශ්ණ අමතක කිරීම සඳහා නම් කරුණාකර මත්පැන් වල බිල කලින් ගෙවන්න.’

353. මේක වුණේ ඔය හැමෝම අතේ මොබයිල් පෝන් නැති කාලේ. දවසක් කොල්ලා කෙල්ලට පිල්ම් එකක් බලන්න එන්න කියලා ලියුමක් ඇරියා. මේ කියන දවසේ කොල්ලා  ජැන්ඩියට ඇඳලා කුරුල්ලා වගේ බලා හිටියා හෝල් එකට හැරෙන තැන. ඉන්නකොට ආවේ නැද්ද කෙල්ලගේ අම්මා. ඇවිත් කිව්වා අනේ පුතේ මගේ කෙල්ල තවම ඉගෙනගන්න එකීනේ. ඒකිට මේවාට එන්න වෙලාවක් නැනේ. ඔන්න ඉතින් මම ආවා ඒ වෙනුවට.

පුතාට තනියම යන්න බැරිනම් යමු ඔය කියන එක බලන්න කියලා. කොල්ලා පන කඩාගෙන දිව්වා. කෙල්ලට ඇරපු ලියුම අම්මට අහුවෙලා. කෙල්ලට නොකියා අම්මා ඇවිත්. ලව් ස්ටෝරිය එදාම ඉවරයි.

354. දැන් ඉන්න කුකුලොත් නැගිටින්නේ එලාම් එක තියලා බැටරි බැහැපු එලාම් තියපු කුකුලෝ දවල් වෙලා නැගිටලා උදේ 8.30ට විතර හඩලනවා.

355. තමුසේ කොච්චර කල්ද දැන් මෙතන වේටර්? තවම සුමානයයි සර්. එහෙනම් මම කෑම ඕඩර් කලේ තමුසෙගෙන් වෙන්න බැහැ.

356. රේමානිස් පාන්දර අවදීවෙලා උඩවත්ත නමැති ගමේ ඉඳලා තම රැකියාව සඳහා දෙහිගහලන්ද නගරයට යන්නේ පයින්මයි.ඒ දවස්වල බස් හුගක් අඩුයි. ඒයාගේ පුරුද්දක් තිබුනා යන ගමන් සුරුට්ටුවක් පත්තුකර එය උරමින් යෑමට.මෙදිනද ගමනෙන් භාගයක් ගිය ඔහු තම සුරුට්ටුව පත්තුකලත් සුලග නිසා ඒය පත්තුකිරීමට අපහසු විය. ඔහු සුළඟ නිසා ගමන් කරපු දිසාවට නොව විරුද්ධ දිසාවට හැරී සුරුට්ටුව පත්තුකර නැවත ගමන ආරම්භ කලාලු. එයා ආපසු ඇවිදින් තියෙන්නෙ තමාගේ ගේ ලගටමයි.

357. පුතාගේ නම - ෂෝ. පුතාගේ මුල් නම - බර්නාර්ඩ්. ෂාහ් හරි ප්‍රසිද්ධ නමක්නේ. ඔවු මම දැන් අවුරුදු 13ක් විතර වෙනවා ජීවත්වෙන්න අරං.

358. මම දැක්කා කවුද කොල්ලෙක් තමුසෙගෙ දුවව ඉඹින්න හදනවා. ඉතින් එයා ඒකට ඉඩ දුන්නාද? නැහැ. එහෙනම් ඒ මගේ දුව නොවෙයි.

359. රෙදි කඩේක මුදලාලි කෙනෙක් හැමදාම රෑට කඩේ වහද්දි කියනවලු 'දැක්කා, දැක්කා එළියට වරෙන්' කියලා. ඒ මීට අවුරුදු 40ට පෙර. දැන් මිනිහා එලියට බහින්නේ CCTV ඕන් කරලා මොබයිල් ෆෝන් එකෙන් හලෝ කියලා දුවට කියනවලු කම්පියුටරෙන් සාප්පුව චෙක් කරන්න කියලා, හැබැයි අන්තිමට පරණ පුරුද්දට තාම කියනවා 'දැක්කා, දැක්කා එළියට වරෙන්' කියලා.

360. අපේ 11 පන්තියේ හිටපු කොල්ලෙක් ඉස්කෝලෙම කෙල්ලෙක් එක්ක යාලු වෙලා. සෙනසුරාදා දවසක මේ දෙන්නා ගිය බසයේ ඉස්කෝලේ විනය භාර සර්ද ගිහිලා, මේ දෙන්නව දැකලා. සඳුදා උදේ සර් අහනවා 'ආ මම දැක්ක ඔයා එදා බස් එකේ යනවා. ' ඔව් සර් මම නැදෑ ගෙදරක ගියා අපේ අක්කාත් එක්ක'. සර් කියනවා 'ආ එහෙමද, මම හිතුවේ ඒ ඔයාගේ අම්මා කියල. මොකෝ ඔයා බොහොම තදින් එයාගේ උකුල උඩ නිදාගෙන හිටිය බව මම දැක්කා' කියලා.

361. ලොකුහාමුදුරුවන්ද නිතර පොඩිතැනට උපදෙස් දෙමින් යන එන තැන් ගැන ඇසගසාගෙන හිටියා. නායක හාමුදුරුවන් නිතර පොඩිතැනට දුන් උපදෙස්. පොඩිතැන අපි දැන් ඉස්සර වගේ . නිදියනවා කියන්නේ නෑ

සැතපෙනවා කියන්න, කනවා කියන්නේ නෑ. වළඳනවා කියන්න. ඇවිදිනවා කියන්නේ නෑ සක්මන් කරනවා කියන්න. යනවා කියන්නේ නෑ වඩිනවා කියන්න. පොඩිතැනටද දැන් මෙම වාක්‍යයන් ටිකටික කටට හුරුයි. දිනක් පන්සල් වත්තේ සිට පොඩිතැන හතිදමමින් නායක හමුදුරුවන් ළගට පැමිණ බය වුණ ස්වරූපයෙන් සිටගත්තා. එවිට නායක හාමුදුරුවන් මෙසේ පොඩිතැනගෙන් විමසුවා. මොකද පොඩිතැන හතිදමමින් මොකටද බය වුනේ? එවිට පොඩිතැන පිළිතුරු දෙනවා හාමුදුරුවනේ සැතපිලා හිටපු බල්ලෙක් මාව වළඳන්න අවා. මම ඉක්මනට සක්මන් කරගෙන පන්සලට වැඩගත්තා කියා.

362. දුප්පත් පවුලක අම්මයි පුතයි ජීවත් වුනා. පුතාගේ වයස අවුරුදු අටක්පමණ ඇති. දුප්පත් අම්මා ගල්වැඩපලක ගල්කඩලයි ජීවත්වෙන්නේ. දවසක් වැඩපලට ගිය අවස්ථාවෙ වැටඩ අදින රෙදිකඩ ගෙනත් නැතිබව දැක අම්මා පුතාට කියනවා. පුතේ අර ගෙදර වැලේ වනපු රෙද්ද අරගෙන එන්න කියා. පොඩිඑකා ඉක්මනට ගෙදර ගොස් පං මල්ලට රෙද්දදමාගෙන එන අතරවාරයේදී මෙය දුටු පොලිස් රාලාහමි කෙනෙක් ළමයෝ ඔය මල්ලේ මොනවාදැයි පුශ්ණකර ඇත. පොඩි එකා ගත්කටටම අම්මගේ රෙද්ද යනුවෙන් පිළිතුරු දී ඇත. රාලහාමි නැවතත් එම පුශ්ණයම ළමයාගෙන් විමසු විට පෙර ලෙසම අම්මගේ රෙද්ද යනුවෙන් පිළිතුරුදීමත් සමගම රාලහාමි උඹ ඔය කාටද ඔහොම කතාකරන්නේ, පොඩිකමටද කතා කරන්නේ කියා පොඩි එකාට ටොක්කක් ඇන, කන මිරිකා පසුව පරික්ෂාකිරීමෙදී ඇත්තටම අම්මට අදින්න ගෙනියන රෙද්ද

නේන්නම් ඒකේ තිබිලා තියෙන්නේ කියා දැක ඔලුව අතගාලා යවලා.

363. ඔන්න එක හොර නක්ෂස්ත්‍රකරුවෙක් ළඟට මිනිහෙක් පේන අහන්න ගියා. මේ මිනිහා කකුලක් අද්දමින් එනවා කියලා එළියේ බලන් ඉන්න ගෝලයා අනිත් එන අය ගැන මොබයිල් එකෙන් විස්තර කියනවා වගේ මේ  එන අය ගැනත්  කිවුවා. හොර පේන කාරයා උජාරුවට කියනවා හැමෝටම ඇහෙන්න, ඔයාගේ කකුලේ අමාරුවක් තියෙන්නම ඕනා, ඒකට ඔපරේෂන් එකක් කරන්නම වෙනවා කියලා.  එවිට මිනිහා කියනවා නැහැ එහෙම අමාරුවක් නැහැ, මම ආපු කාරිය හරියට කියන්නකෝ කියලා. දැන්  මේ හොර නක්ෂස්ත්‍රකරු කියනවා අනිත් අයටත් ඇහන්න, ඔයාගේ කකුලේ ආබාධයක් තියෙන්නම ඕනා, නැත්නම් මම තමුසේ ආ කාරිය කියන්නේත්  නැහැ, හැබැයි මම බොරු නම් තමුසෙගෙ සල්ලි මම ආපසු දෙනවා කියලා. මිනිහ කියනවා කකුලේ අමාරුවක් නම් මං දන්නේ නැහැ, මම මෙතැන  බස් එකෙන් බහින කොට මේ රබර් සෙරෙප්පුව කැඩිලා ගියා. බලනවා කකුලබිම තියන්නේ නැතිව බොහොම අමාරුවෙන් මම යන්නේ, තමුසේගේ මිදුලේ මඩ කකුලේ වදින හින්දා කියලා.

364. එක් රජෙක් සිටියා. මෙ රජ හැමදාම තම පලතුරු උයනේ සක්මන් කරනවා. එම උයනේ පේර ගසක් තිබුනා. එහි පේරගෙඩියක් හැදී තිබුණා. මුලින්ම ගෙඩිය මා අනුභවකලයුතුය යන දැඩි අශාවක් රජට ඇතිවිය. හැමදාම උයනේ ඇවිදින විට මේ පේර ගෙඩිය බැලීමට රජ අමතක

කළේ නෑ. දිනක් උයනේ සක්මන් කරනවිට පේරගසේ එම ගෙඩිය පෙනෙන්නට නොතිබුණි. රජු අන්දමන්ද විය. පසුව සොයා බැලීමේදී එම පේර ගෙඩිය බිමට වැටීඇති බව රජ දුටුවා. නමුත් එය වැටීතිබුණේ ජරාවක් මතටයි. එම පේර ගෙඩිය ඉදිලා කහ පාටට තිබුණා. පසුව රජා හොරෙන් වටපිට බලා අර ජරාව මතට වැටුණ පේරගෙඩිය අහුලාගෙන හොදට සොදා අනුභවකළා. නමුත් රජාගේ හිතේ මෙය කවුරුවත් දුටුවාද යන ප්‍රශ්ණය ඇතිවුනා. මම ජරාගොඩේ තිබුණ පේරගෙඩිය අහුලගෙන කෑව එක කවුරු හරි ආරක්ෂකයින් දැක්කාද යන සැකය හිතේ ඇතිවිය. එදින සවස් භාගයේ නැටුම් උද්‍යානයේ රජ විවේකීව සිටිනවිට නාට්‍යාංගනාවියන් පැමින නැටුම් ඉදිරිපත්කරමින් ගීතද ගායනා කළා. එක් ගායිකාවක් රජ ඉදිරියට පැමිණ ගීයේ කොටසක් මෙසේ ගායනා කෙරුවා ‘අරක මම කියන්නද’ කියන තේරුමයි. මේ වදන ඇසුන ගමන් රජා තිගැස්සී මම පේර ගෙඩිය කාපු එක දැක්කවද්ද යන සිතුවිල්ල ඇතිවුනා. නැවතත් දෙවන වරටත් ඒ ගායිකාව රැගුමක් දක්වමින් රජා ඉදිරියට පැමිණ අරක මම කියන්නද කියමින් තම ඇගිල්ල කරකවමින් ගීතය ගායනා කළා. රජාගේ කේන්තිය තව තවත් වැඩිවුනා. ඇත්තටම මෙයා දැකලද කොහෙද නැත්නම් මගේ ඉස්සරහටම ඇවිල්ල අහන්නේ? මෙහෙම සිතනවාත් සමගම තුන්වන වරටත් එම නාට්‍යාංගනාවිය නටමින් දඹරඇගිල්ල කරකවමින් අරක මම කියන්නද? යනුවෙන් ගීතය ගයනවාත් සමගම රජා ආසනයෙන් නැගිට මහ හයියෙන් මෙසේ කෑගැසුවාලු. ඔව් මමයි රජා. මම කෑවා තමයි. ජරා ගොඩේ වැටිල තිබුණ පේර ගෙඩිය මම කෑවා තමයි. ඇයි මම බයද? මෙසේ රජා කෑසන විට රැස්ව සිටි

සියල්ලන්ම තුෂ්නීම්භූතව ඇත්තටම සිදුව ඇත්තේ කුමක්දැයි දැනගත්තා.

365. ඔන්න එක මහාචාර්යවරයෙක් හිටියා. ඔහු සමාජයෙන් ඈත්වී සිටපු කෙනෙක්. දවසක් මිනිහා හිතුවතෙකුගේ මංගල්‍යයන් ආරාධනාවන් ලබා ගියා. මෙතුමා විවාහකයෙක් නොවේ. නමුත් එහි සිටි අය එකතුව සතුටු සාමිච්චියේ සිටීමට මහාචාර්යවරයාතුල සබකෝලයක් ඇතිවුනා. වටපිටබලා එම ශාලවෙ මේසයක් අසල තනිවම වාඩිවීසිටින කාන්තාවක් දැක මෙම මහතාද ඇය අසලින්ම අසුන් ගත්තා. පළමුව සිනහවක් පෑවා. කාන්තාවද ඉතා නිහතමානිව සිනහවකින් පිළිතුරු දුන්නා. දැන් මෙම මහතා ඇගෙන් ඇහුවා - ඔයාට ළමයි ඉන්වාද කියා. ඇයද සිනාහමුසු මුහුණින් ඔව් පස් දෙනෙක් ඉන්නවා කිවා. නැවතත් නිහඩතාවයකින් පසුව ඔයා විවාහකද කියා ඇසුවා. එවිට අර කාන්තාව තරහින් මේ මහතා දිහා ඔරවා බලා තමා වාඩිවි සිටි පුටුවෙන් නැගිට වෙනත් තැනකට ගොස් අසුන්ගත්තා. දැන් මහචාර්යවරයා දැනගත්තා මම අහපු ප්‍රශ්ණයේ මොකක් හෝ වැරැද්දක් සිදුවුනා කියලා. මෙසේ සිතමින් අතර වටපිට බැලීමෙදී ඒ අසලම තවත් ඉතා ලස්සන තරුණියක් වාඩිවි සිටිනවා දුටුවා. මෙම තරුණිය වෙත ඔහු ගොස් සිනහවක් පෑවහාම ඇයද ලස්සන පිළිතුරු සිනහවක් පෑවා. වඩාත් පරික්ෂාකාරී වූ මහාචාර්යවරයා ඇගෙන් අහනවා ‘ඔබ විවාහකද’? එවිට තරුණිය සුකොමල පාමින් නෑ යනුවෙන් පිළිතුරු දුන්නා. සුලු නිහඩතාවයකින් පසුව නැවතත් මෙසේ ඇසුවා ඔයාට බබාලා ඉන්නවාද? පෙර කී කාන්තාව මෙන්ම මෙම තරුණියද මහචාර්යවරයා

දෙස ඔරවා බලා වාඩිවී සිටි පුටුවෙන් නැගිට ගස්සමින් එතනින් ඉවත්ව ගියා. 'හපෝ සමාජයත් එක්ක ඉන්නවාට වඩා මගේ හුදකලා ජීවිතය මට හොඳයි කියා' මහචාර්යවරයා නැවතත් විද්‍යාගාරයතුලටම ගියා.

366. පුතා ෆේස් බූක් ඉල්ලා පුතා අම්මාට කරදර කරනු තාත්තාට ඇසුනා, තාත්තා කිවා මම අද බුක් ෂොප් එකකට ගිහින් ෆේස් බුක් කියන පොත පුතාට ගේනවා කියා. පොත් සාප්පුවට ගොස් ෆේස් බූක් එකක් ඉල්ලුවාම වෙළඳ සහායක කොම්පුටර් එකක් ගෙනත් දී ඕක ඇතුලේ ෆේස් බූක් තියෙනවා කියා කියලා. කොම්පුටර් එක තාම ගෙදර පල් වෙනවලු, පුතාට කලින් ලැප්ටොප් එකක් අරන් දීල තිබුනා. අම්මයි පුතයි තාත්තාට නොපෙනෙන්න හිනාවෙලා.

367. සුද්දෙක් සිරාගෙන් මොකද්දෝ හන්දියක නමක් කියලා කොහෙද තියෙන්නේ කියලා අහලා. සිරා කිව්වලු නෙක්ස්ට් ජන්සන් නෝ ජන්සන් ,ටු ජන්සන් නෝ ජන්සන්, ත්‍රී ජන්සන් ඊස් ජන්සන් (තුන්වැනි හන්දිය තමයි හන්දිය කියලා ). සුද්දා තැන්ක් යු කියලා ගියාලු.

368. අපේ ටීචර් කිව්වේ මැලේ විදියෙන් බැහැලා, කොම්පඤ්ඤවීදිය වීදියට ගිහින් මාරකට්ටුවෙන් මංඤ්ඤකයි, තියබරයි ගේන්න කියලායි, චීන පටස් පත්තු කරන්නයි.

369. එක දවසක් අපේ ගෙදරට කෙනෙක් ඇවිත් අපේ නෝනගෙන් විස්තර අහල කියනවලු ස්වීප් එකක් ඇදිලා සල්ලි වගයක් තියෙනවා ගන්න, ඒකට රුපියල් 50,000 ඉස්සෙල්ල බදින්න කියලා. අපේ නෝනා කියල තියෙනවා එහෙනම් ඇදිච්ච සල්ලිවලින් අඩුකරගෙන ඉතිරි සල්ලි ටික ගෙනත් දෙන්න කියල, මෙන්න බොලේ මනුස්සය හිමිහිට මාරුවෙලා ගියාලු.

370. ගමේ කඩේකට සංකර ගෑනු ළමයෙක් ඇවිත් මුදලාලිට මෙහෙමෙ කිව්වලු ‘ මිස්ටර් මුදලාලි, මට මේ මනිස් වලින් පාන්ස් දීලා කෝක්ස් දෙන්න හැක්සොස් දෙකක් දෙන්න’ කියලා.

371. ඈත පිටිසර ගමක ගොවිරාළ කෙනෙකුගේ පුතෙක් ලන්ඩන් ගිහිල්ල දොස්තර විභාගේ පාස් වෙලා. ඉතින් මේක මුළු පළාතටම ලොකු නම්බුවක්. මේ අම්මයි තාත්තයි බොහොම සන්තෝසෙන් ගොවිතැන් කරන් ජීවත් වෙන අය. කාලෙකට පස්සේ පුතා තාත්තලා බලන්න එන දිනෙත් ආවා. පුතා එනවයි කියලා පාරවල් හදලා, ගෙවල් හැඩ වැඩ කරලා. පුතා සුදු නෝනා කෙනෙකුත් බැදලා ඔන්න ආවා. අනේ මේ අම්මයි තාත්තයි දවල් කෑමට ගෙදර ගහෙන් කොස් කඩලා කොස් තම්බලා, පොල් ගාලා, කිරි හොදි, හදල කට්ට සම්බෝලයක් හදලා මේසෙට ඇරලා තියල. සුද්දී හරිම ආසාවෙන් කොස් කන ගමන් අහනවලු ‘ඩාලින් වට් ඉස් දිස්’. පුතාට මතක නෑ කන්නේ මොනවද කියල, පුතා තාත්තාගෙන් අහනවලු ‘වට් පපා දිස්’ කියලා. තාත්තා දන්නා ඉංගිරිසියක් නෑ. ඒ පාර තාත්ත කියනවලු ‘දිස් පුතා

කොස්' කියලා අම්මගේ මුණ බැලුවාලු. ඒ පාර අම්මා ගහ පෙන්නලා කියනවලු. 'දැට් පුතා ගස් කොස්' කියලා.

372. සුදු නෝනා කෙනෙක් එයාගේ සිංහල මහත්තයට කොස් කටක් 'ෆොර් යු මයි ලව්' කියලා එයාගේ මහත්තයාගේ කටේ ඔබලා. මේක දැක්ක අම්මා ඉක්මනට එලියට ගිහිල්ල ඉන්න මයිලා කියන බල්ලාට 'ඉජෝහ්,ඉජෝහ්,ඉජෝහ්, කිව්වම කළු කොට මහත බලු තඩියෙක් ආවලු. තාත්තා සුද්දිට පෙන්න කොස් ටිකක් බිමට දාලා බල්ලාට කියනවලු 'දිස් කොස් මයිලෝ ඊට්'.

373. දවසක් කොල්ලෝ ටිකක් හවස ඉංග්‍රීසි පන්ති ගිහින් එන ගමන් බස් හෝල්ට් එක ලග නතර උනාලු. එවිටම බස් හෝල්ට් එක ලග හිටපු වයසක සීයා කෙනෙක් එකපාරටම බිම ඇදගෙන වැටුනලු .ඒක දැකපු කොල්ලෝ අහනවලු 'වට් හැපන් සීයේ කියල'. සීයාට හොදටම කේන්ති ගිහින් කියුවලු වට්ටපන් බලන්න දෙන්නේ හැරමිටියෙන් කියලා.

374. මෙයා ඉන්නේ ලන්ඩන් හන්දියේ, මම ඉන්නේ ග්ලාස්ගෝ හන්දියේ, අරයා ඉන්නේ පැරිස් හන්දියේ, මෙයා ඉන්නේ සිඩ්නි හන්දියේ.

375. උසස්වීමක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට ගිය කොස්තාපල්වරයකුගෙන් ඉහළ නිලධාරියා මෙසේ ඇසිය. 'කොම්පඤ්ඤවීදියේ මරණයක් වී ඇත. තමා කොහොමද ඒ ගැන ක්‍රියාකරන්නේ?'. එවිට කොස්තාපල් වරයා, 'සර්, මම මිනිය මැලේ විදියට අදිනවා' යැයි පැවසිය. එම පිළිතුරෙන් තුෂ්නිම්භූත වූ නිලධාරියා, 'ඇයි, මිනිය වෙන තැනකට

අදින්නේ?' යැයි ඇසිය. එවිට කොස්තාපල්වරයා පැවසුවේ, 'සර්, මට කොම්පඤ්ඤවීදිය කියලා ලියන්න දන්නේ නැති නිසා, මැලේ විදියට ඇදලා එතන මරණය සිදු වුණා කියලා' වාර්තා කරන බවයි.

376. මම ගිහිල්ල තියෙන්නේ නාගදිපෙට සහ ස්ලේව් අයිලන්ඩ් වලට, තව රජරට සහ මතුරට ගිහිලා තියෙනවා; ඊට එහා, මලදිවයිනටවත් ගිහිල්ල නැහැ.

377. ඉන්දියානු තරුණියක් උඩු රැවුලක් තියෙන ඉතාලි ජාතික තරුණයෙකු හා විවාහ වී ඉතාලියේ පදිංචියට ගියාය. ඇය ඉතාලි භාෂාව නොදන්නා බැවින් බොහෝවිට හස්ත මුද්‍රාවෙන් කථා කලාය.උදාහරණයක් ලෙස කුකුල් කකුල් මිල දී ගැනීමට උවමනා වූ විට වෙළඳ සැලට ගොස්,තමාගේ කකුල පෙන්වා කුකුල් මස් දෙසට ඇගිල්ල දිගු කරයි. මාළු ඔලුවක් අවශ්‍ය විට තමාගේ ඔලුව පෙන්වා මාළුවා පෙන්වයි. දිනක් ඇයට තීන්ත ගාන බුරුසුවක් මිලදී ගැනීමට අවශ්‍යවී උඩු රැවුල තියෙන සැමියාව වෙළඳසැල වෙත රැගෙන ගියාය.

378. කලිසම දාගත්ත මහත්තයෙක් පාරේ අයිනේ කඩයක් ළඟ නතර කරලා ලස්සන තරුණ කෙල්ලගෙන් අහනවලු නංගි මේ බතල කුඩේ කීයද? රුපියල් 80ක් දෙන්න මහත්තයෝ. අඩු නැතිද? ඔතන කිලෝ 4 තියෙනවා නේ..අඩු කරන්න අමාරුයි සර්...මේ බතල ගමේ හදාපුවාද? අනේ නෑ සර්..අපේ වත්තේ...අර ගේ පිටු පස්සේ. ...මේ

ඉඩම කොච්චර ලොකුද?.... අක්කර 2 විතර...ආණ්ඩුවෙන් වගා කොරන්න කියල ලැබිච්චා සර්...ඉතින් නංගි ඔයාලා බතල විතරද හදන්නේ?... ඉතින් මේ ඉඩම කාටද අයිති? කියමින් පිලට ගොඩ උනා. මේ දෙබස අහගෙන හිටය ආච්චි අම්මා හැරමිටිය වනවන එළියට ඇවිල්ල කියනවා මහත්තයෝ බතල ගන්න ආවනම් බතල අරන් යන්න. එනවද මෙතන හතර මායින් හොයන්න. ඒ මදිවට හිතුවද කටින් බතල හිටවන්න. කොල්ලෝ ලිහාපිය ඔය බල්ලෝ දෙන්නා හනිකට. කියන කොටම මහත්තයා එළියට පැනලා කාර් එකට පැන ගත්තේ බතලත් අමතක කරලා.

379. සියලුම මිනිසුන් මෝඩයන් යයි කීම වැරදිය. මන්ද. සමහරු අවිවාහකයන්ය.

380. යම්තම් දැලි රැවුල වැඩෙමින් තිබු ප්‍රියත් බාබර් සාප්පුවට ගොස් සෙනඟ දැක රැවුල කපන්න තව කොච්චර කල් යයිද කියා ඇසුවා. බාබර් ඔහු දෙස හොඳින් බලා තව 8 මාසයක් විතර යයි කියා කිවා.

381. සැමියා හා බිරිඳ දවසක් රණ්ඩුවෙන කොට බිරිඳ කියනවා මේ ගෙදර තියන සියලුම බඩු මගේ දැවැද්දට ගෙනාපුවා තමුන්ගේ කිසිම දෙයක් මේ ගෙදර නැහැ. ඒක නිසා මම කියන විදිහට වැඩකරනවා කියා. එදින රාත්‍රියේ නිවසට හොරෙක් ඇතුළු වී වටිනා බඩු සියල්ල එකතු කරන විට බිරිඳ අවදිවී සැමියාව අවදිකර අපේ ගෙට හොරෙක් ඇවිල්ලා සේරම ගෙනියන්න හදන්නේ කියලා කිව්වහම සැමියා කියනවා, මගේ කියා කිසිම දෙයක් නැහැනේ

හොරෙකුටවත් ගෙනියන්න කියා අනෙක් පැත්තට හැරී හොඳට නිදාගත්තලු.

382. රුපියල් දශ ලක්ෂයක් සහිතව විශ්‍රාම ගැනීමට නම් මහන්සි නොබලා වැඩ කල යුතුයි. අවංක වෙන්න, නිෂ්පල වියදම් කපා හරින්න. ධනවත් ඥාතියෙක් ඔබේ නමට රුපියල් දශ ලක්ෂයක් ඉතිරි කර මිය යා යුතුය.

383. ජපානයේ ඉගෙනුමට ගිය පුතා සිය මවට ඊමේල් පණිවුඩයක් එවනවා. 'අම්මේ අම්මට කෝල් එකක් ගන්නවත් මට සල්ලි නැහැ. සල්ලි ඉල්ලගන්න යාලුවෙක් වත් නැහැ.' අම්මා යවනවා ඊ මේල් පණිවුඩයක් - 'ඉක්මනට යාළුවන් හදා ගන්න'.

384. මීයා ගැන ලියන්න කියුවහම ලියපු රචනයක් - ඉස්සර අපේ ගෙදර රේඩියෝ එකක් තිබුනාය. ඒකේ රාත්‍රී දහය හමාරට හින්දි සින්දු අපි අහනවාය. දවසක් අපේ පූසා තරහවෙලා වගේ අහක බලාගෙන ඉන්නවා. ඒ වෙලාවේ සුදු මී පැටියෙක් වහලෙන් වැටුනාය, මීයා වනාහි නපුරු සතෙකි. මීයාට අපි කවුරුත් කැමති නැත. මීයා පාන් කන්න කැමතිය. මීයා පුසට බයය. මීයාට කකුල් හතරක් ඇත. මීයා අපේ පාසලේද දක්නට ඇත. මීයා ගැන කියනවා නම් තව ගොඩක් දේ ඇත.

385. මීයන් වඳ කිරීමේ ක්‍රම 100 ඇතුලත් පොතක් ඉස්සර තිබුනා. එය කියවා බලන්න කාටත් අතපසු විය. ගේ මුල්ලක දමා තිබු ඒ පොත මීයෙකු විසින් විකා විනාශ කළෙන්

තාමත් මීයන් නොනැසී සිටිති. ඒ පොතෙන් වැඩක් ගත්තේ මීයන්ම පමණි.

386. අම්මේ, අද ඉස්කෝලෙදි ගුරුතුමා අපට ලස්සන දරු නැලවිල්ලක් ඉගැන්නුවා. ඉතින් ඒක කියන්න කෝ පුතා. ඒක මට මතක නැහැ අම්මේ, දරු නැළවිල්ල උගන්නනකොට මට නින්ද ගියා.

387. ඔන්න එක රටක ජනාධිපතිවරයෙක් කොණ්ඩය කපාගැනීමට ඔහු දන්න බාබර් ලඟට ගියාලු. ජනාධිපතිවරයාගේ හිසේ හිසකෙස් එතරම් නොවිය. ඒ වනවිට රටේ ත්‍රස්තවාදීන් ප්‍රචණ්ඩත්වය හසුරමින් සිටියහ. දිනක් බාබර් ජනාධිපතිවරයාගේ කොණ්ඩය කපන ගමන් මෙසේ ඇසිය. සර් කොහොමද දැන් රටේ ත්‍රස්තවාදී ප්‍රශ්නය? ජනාධිපතිවරයාවරයා ටිකක් තිගැස්සී කීවේ එයට පිළියම් සොයමින් සිටින බවයි. මෙලෙස තව දවසක් බාබර් ජනාධිපතිවරයාගේ කොණ්ඩය කපන ගමන් පෙර ප්‍රශ්නයම නැවතත් ජනාධිපතිවරයාගෙන් ඇසීය. ජනාධිපතිවරයාගේ පිළිතුර පෙර පරිදිමයි. ඔන්න ටික දවසක් ගෙවෙද්දී ජනාධිපතිවරයා බාබර් වෙත පැමිණ නැවත කොණ්ඩය කපන ගමන් බාබර් අර ත්‍රස්තවාදී ප්‍රශ්නය මතු කළේය. ජනාධිපතිවරයා ටිකක් කේන්තියෙන් පෙර පිළිතුර දුන්නේ පෙර පරිදිමයි. අවසන්වරට ජනාධිපතිවරයා  කොණ්ඩය කැපූ දින රාත්‍රියේ බාබර් සොයා ජීප් රථයෙන් පැමිණි නිලධාරීන් හතරදෙනෙක් බාබර්ව රැගෙන ගොස් රිමාන්ඩ් කළහ. පසුව බාබර් අසලට පැමිණි නිලධාරියෙක් ඇත්ත කියපන් උඹටයි ත්‍රස්තවාදීන්ටයි තියෙන සම්බන්ධය

මොකක්ද යනුවෙනි. එවිට බාබර් පැවසුවේ අනේ සර් මාව හිර කරන්න ඉස්සරනේ ඔය ප්‍රශ්නය අහන්න තිබුනනේ. මම ජනාධිපතිතුමාගෙන් කොණ්ඩය කපන ගමන් ත්‍රස්තවාදී ත්‍රස්තවාදී ප්‍රශ්නය අහන වෙලාවට එතුමාගේ හිසකෙස් කෙලින් වෙනවා එතකොට කපන්න පහසුයි යනුවෙනි.

388. ජෝඩුවක් හනිමූන් ගිහිල්ල ආවලු. දෙන්නට දෙන්න කතා නැහැල්ලු. හොදම යාළුවා ඇහුවලු මොකද උනේ කියල. මනමාලයා කිව්වලු අපි දෙන්නම වයින් බීලා හිටියේ. මම පුරුද්දට ඩොලර් සීයක් කොට්ටේ උඩින් තිබ්බනේ.අපෝ ඕක ගනන් ගන්න එපා වයිෆ් හිතයි වැරදීමකින් තිබ්බා කියලා යාළුවා කිව්වා. ඒ පාර මනමාලයා කියනවා නෑ එයා මට ඩොලර් විස්සක් ඉතුරු දුන්නනේ, එකයි ප්‍රශ් නේ කියලා.

389. පියල් එක තරුණයෙකු දෙස බොහෝ වෙලා ඇසිපිය නොහෙලා බලා සිටියා. ඒ තරුණයා පියල් ලඟට ඇවිත් ඇහුවා ඇයි ඔයා එහෙම මා දිහා බලන්නේ කියා. ඔයා මගේ වයිෆ් වගේමයි. රැවුල නැත්නම් ඒ මුනමයි කියා පියල් කිවා. ඉතින් මට රැවුලක් නැහැනේ කියා තරුණයා කිවා. නෑ, මගේ නෝනාට තියෙනවනේ කියා පියල් කිවා.

390. ගමනක් යන ගමන් හදිසි අවශ්‍යතාවයක් නිසා මම පොදු වැසිකිලියකට ඇතුල් වුනා. මගේ වැඩේ කරගෙන යද්දී එහා පැත්තෙ පාටිෂන් එකේ මනුස්සයා කියනවා, ‘ආ.. කොහොමද?’, සාමාන්‍යයෙන් මෙතන කතාබහක් නොකෙරෙන තැනක් වුනත් ටිකක් ලැජ්ජාවෙන් මං උත්තර

දුන්නා, 'වරදක් නෑ'. මගේ වැඩේට ආයෙමත් බාධා කරමින් මෙයා අහනවා, 'ඉතිං, මොනවද කරන්නෙ?' (මේකෙ ඇතුලෙ වෙන මොනව කරන්නද). කොහොම හරි කේන්තිය යට ගහගෙන මං කිව්වා, 'ඔයා වගේම තමයි, ගමනක් යන ගමන්'. මට නිකම් මොකක්ද වගේ මේ මනුස්සයා මාත් එක්ක කතා කරපු හැටි. කොහොම හරි මගේ කාර්යය ඉවර වෙන්න ඔන්න මෙන්න තියෙද්දී මේ යෝධයා අහපි, 'මං ඔහෙට එන්නද?'. එළියට යන්න හදන ගමන් මං උත්තර දුන්නා, 'බෑ,.මං මෙතන ලොකු වැඩක්'.  ආයෙත් එහා පැත්තෙ මෑන් කියනවා ඇහෙනවා, 'මේ, මං ඔයාට තව ටිකකින් ගන්නම්, මේ එහා පැත්තෙ ඉන්න පිස්සා මං කියන හැම එකටම උත්තර දෙනවා '

391. ඕනෑම ප්‍රශ්නයකට දෙපැත්තක් තිබේ. ඔබේ පැත්ත, අනෙකාගේ පැත්ත සහ හරි පැත්ත.

392. ඉතා වේගයෙන් එලවාගෙන යන කාර් එකක් පොලිස් නිලධාරියෙක් සිය මෝටර් සයිකලයෙන් පස්සෙන් එලෙව්වා. තරුණයා වේගය වැඩි කළා, පැයට km 100 වෙනකන්. පසුව බැරිම තැන සිය වාහනය නැවැත්වුවා. 'මම අද දවසේ ගොඩාක් මහන්සි වෙලා මේ ගෙදර යන ගමන්, නුඹ මට හොඳ නිදහසට කරුණක් නොදුන්නොත් නොසැලකිලිමත් රිය පැදවීමේ වරදට මම නඩු දානවා'. කල්පනා කළ තරුණයා කියනවා ' මගේ නෝනා සතියකට ඉස්සෙල්ලා පොලිස් නිලධාරියෙක් එක්ක පැනලා ගියා, මං හිතුවේ ඒ පොලිස් නිලධාරියා ඔයා කියලා, මට ආපහු ඒ

ගැනිව භාර දෙන්න හදන; අනේ ඔයාම එයාව තියාගන්න'. තරුණයා දඩ කෝලන් බේරුනා.

393. පුරුෂයෙක් කසාදය අර්ථ දක්වන්නේ කෙසේද? නොමිලේ රෙදි සෝදා ගැනීමට ඇති ඉතාම වියදම් අධික මාර්ගයක්.

394. රිංග්ස් වර්ග තුනකි. එන්ගේජ්මන්ට් රිං , වෙඩින් රිං සහ ඊට පසුව එන සෆරිං.

395. පුතා - 'තාත්තා විවාහ වෙන්න කීයක් විතර යනවද ?' තාත්තා - 'මම හරියටම දන්නේ නැහැ පුතේ. ඒත් මම තාම ගෙවනවා.'

396. නිතර ගුවන් ගමන් වල යෙදෙමින් රැකියාව කරන රූමත් තරුණියක් විවාහ කර ගැනීමට අදහස් කල තරුණයෙක් තම විවාහයට පියාගෙන් අවසර පැතීය . එහෙත් පියා එකහෙලාම එම විවාහයට විරුද්ධ විය. තරුණ පුතා පියාගේ විරුද්ධත්වයට හේතුව විමසූ විට පියාගෙන් ලැබුනේ මෙවැනි පිළිතුරකි 'ඔයාගේ අම්මා පැය 24 ම ඉන්නේ බිම ඒත් මට පාලනය කරගන්න බැහැ. ඉතින් නිතර උඩ ඉන්න කෙනෙක් බිම ඉදගෙන ඔයා කොහොමද පාලනය කරන්නේ.'

397. කුඹුරු වැඩට යන්නේ නැද්ද සිරිපාල? කොයි රටේද ගුණපාල අයියේ කුඹුරු - වැඩට යන්නේ?

398. ක්‍රීඩා සංගමයට අලුතින් බැඳෙන සාමාජිකයා මාසික සංගම් රාත්‍රිය දා කතාවක් පැවැත්විය යුතුයි. අපේ යහළුවාට දුන් මාතෘකාව - 'මාගේ ලිංගික ජීවිතය'. ඒ සන්ධ්‍යාව උදා උනා, ඉතා චතුර , විචක්ෂණ සහ උපහාසාත්මක ලෙස අපේ මිතුරා කථාව පැවැත්වුවා. හැමෝම අත් පුඩි ගැසුවා. ගෙදර ආ පසු බිරිඳ ඇසුවා - මොකක්ද ඔයාට දුන් මාතෘකාව කියා. 'මුහුදේ බෝට්ටු සවාරි යාම' කියා බොරුවක් කියා මිනිහා ෂේප් උනා. බිරිඳට සිතුනා විකාර මාතෘකාවක් කියා, නමුත් මුකුත් නොකියා නින්දට ගියා. පසුදින ඇයට ස්වාමියාගේ ක්‍රීඩා කණ්ඩායමේ සාමාජිකයෙක් සුපර් මාර්කට් එකේදී හමු උනා. 'මගේ ස්වාමියා ඊයේ රෑ කථාවක් කළා, කොහොමද ඒක?' 'නියමයි. 'මාගේ ලිංගික ජීවිතය' නමැති ඒ කථාවෙන් ඊයේ සනාථ උනා ඔයාගේ මහත්තයා සැබෑ පළපුරුදු කාරයෙක් ලිංගික ක්‍රියා ගැන කියා. ඔයා ඒ අතින් හරි වාසනාවන්තයි' යයි ඔහු කිවා. පුදුමයෙන් සහ ව්‍යාකුල බැවින් සිටි භාර්යාව, 'පුදුමයි, එයා මා එක්ක ලිංගිකව හිටියේ එක සැරයයි, ඒ, එක් සැරේත් මිනිහා ලිංගිකව ලෙඩ උනා'.

399. පන්සලේ ඇබිත්තයා ගුණපාල සූදු පොලේ ඉන්න කොට පොලිසියෙන් පැනලා. මිනිහා දුවලා. මහන්සි හින්දා ලග තිබුණු පොකුණකට බැහැල සරම ගලවල ගොඩට විසි කරලා දැන් නොදන්න ගානට පොකුණේ බැහැලා නානවලු.පොලිසියත් පන්නගෙන ඇවිල්ල ගුණපාලට කතා කරාලු .ඒත් ගුණපාලට ගොඩ එන්න බැහැනේ. ඇඟේ ඇඳුමක් නැතුව. ගුණපාල නිකමට පොකුණු පතුල අතගෑවුනාලු. මෙන්න කවුදෝ විසි කරපු පරණ බේසමක්.

දැන් බේසමෙන් විලිවහ ගෙන ගුණපාල ගොඩ එන්න එනවලු .දැන් රාළහාමි කෑගහනවලු තමුසේ හිතාගෙන හිටියේ බේරිලායන්න නේ ?ඒ වගේම තමුසේ හිතාගෙන ඉන්නේ ඔය බේසමේ අඩිය තියනවා කියලා නේද ?

400. ගමක බුරුවා ගහන ගෙදරකට මහා රෑ පොලිසියන් පැන්නලු. බුරු ගගහ හිටපු මිනිස්සු සී සී කඩ දුවල පොලිසියන් බේරෙන්න උත්සහ කලාලු. පාදයේ අබාදයකින් පෙලුන ගුනේරිස් නම් පුද්ගලයෙක් ගෙහිමියාගේ නිදන කාමරයට ගිහින් ගේ හිමියාගේ බිරිඳ නිදා සිටින ඇඳේ නිදාගත්තලු උඩ ඉඳලා පහතට පොරෝ ගන. ඉන්පසු පොලිසියෙන් කාමරය පරික්ෂා කරන විට බිරිඳ බිය වී කෑ ගසා ඇත. පසුව පොලිසියට කියා තිබෙන්නේ මගේ ඇඳේ මට එහායින් නිදාගෙන හිටියේ මගේ මිනිහා කියලා හිතලා බය වෙලයි මම කෑගැහුවේ කියලා.

401. කෙවින් මහන්සිවී වැඩ කරන්නෙක්. මේ නිසා රාත්‍රිය ඔහු ගත කරන්නේ බොහෝ විට වොලිබෝල් සහ බිලියර්ඩ් ක්‍රීඩා කරමින් සැහැල්ලුවෙන්. තම ස්වාමිපුරුෂයාගේ මේ ඒකාකාරී ක්‍රීඩාවලින් නිදහසක් සහ විවේකයක් අවශ්‍යයයි සිතූ කෙවින්ගේ බිරිඳ දිනක් රාත්‍රියේ නිරුවත් නැටීම් පෙන්වන සමාජ ශාලාවකට යමු කියා ඔහුව අරං ගියා. එහි දොර අසල සිටි සිකුයුරිටි ගාඩ් ‘කෙවින් අද ඔබට කොහොමද’ කියා ඇසුවා. පුදුමයට පත්වූ බිරිඳ ‘ඔබ කලින් මෙතනට ඇවිත් තියෙනවද’ කියා. ‘නෑ නෑ, ඒ මා සමඟ බිලියර්ඩ් ගහන එක්කෙනෙක්’ කිවා. මේ දෙදෙනා ඉඳ ගත්විට වේටර් පැමිණ කෙවින්ව දැක ‘ආ කෙවින් ඔබව

දකින්නට ලැබීම සන්තෝෂයි, සුපුරුදු විදියට ජින් සහ ටොනික්?' කියා විමසුවා. දැන් බිරීන්දගේ දෑස් පළල් උනා. 'ඔයා මෙතනට නිතරම එන පාටයි'. 'අනේ නැහැ මම ඇයව දන්නේ වොලිබෝල් වලින්'. ඉන් අනතුරුව, නිරුවත් ලලනාවක් ඔවුන් සිටි මේසයට පැමිණ 'ආ කෙවින්, පුරුදු පරිදි මෙසේ වටේ අදත් අපි දෙන්නගේ නිරුවත් නැටුමක්?' කියා විමසුවා. තවදුරත් මේවා ඉවසා දරා නොසිටිය හැකිවූ බිරිඳ සිය අත්බෑගය සහ සෙසු කළමනා රැගෙන සමාජ ශාලාවෙන් එලියට දුව ගියේ විදුලියක වේගයෙන්. කෙවින්ද ඇය පිටුපසින් දුවන්න උනා. බිරිඳ ටැක්සියකට නැගෙනු දුටු කෙවින්ද දුව ගොස් එම ටැක්සියේම පසු පස අසුනට පැන ගත්තා. බිරිඳ කෙවින්ව ටැක්සියෙන් තල්ලු කර දොර වසද්දී ටැක්සි රියැදුරු 'කෙවින්, ඔබ අද අර අඳුරු පාරේ හැමදාම ඉන්න ගැනුන්ගෙන් නරකම ගෑනු කෙනාටනෙ අසුවී තිබෙන්නේ' කියා කිවා.

402. අම්මා - 5යි 5යි එකතු කලාම කීයද පුතේ? හතර වියැති පුතා - සමනලයා; ආනේ පුතා, කොහොමද ඔයා එහෙම කියන්නේ; 5යි 5යි කියන්නේ අත් දෙකනේ අම්මේ; ඉතින්?; අත් දෙකම එකට එකතු කලාම සමනළයනේ අම්මේ; ආනේ මගේ පුතාගේ මොළේ.

403. එක මෝඩ පාහේ මිනිහෙක් ගමේ තරුණියක් ආදරයක් ඇතිකරගත්තා. දිනක් තරුණිය මේ මිනිසාට යෝජනාවක් කළේ අපි හෙට කසාද බඳිමු යනුවෙනි. මිනිහා කිවේ හෙටවෙනකම් ඉන්න ඕනෑ නැහැ අදම බඳිමු

යනුවෙනි. ඒ අනුව දෙදෙනාම කසාද බැන්දහ. මාස පහක් ගතවෙද්දී මෝඩ ගැමියාට හා තරුණියට දරු සුරතල් බැලීමට වාසනාව උදාවිය. එක දවක් මිනිහා යකා වාගේ ගෙට ගොඩවිය. 'මට ඇත්ත කියපන් අපිට කොහොමද මාස පහකින් දරුවෙක් ලැබුණේ?'. එවිට තරුණිය මෝඩ මිනිසාට මෙන්න මෙහෙම කීවාය, දැන් බලන්න, ඔයා මාව කසාද බැඳලා කොච්චර කල්වෙනවද? මිනිහා කියා සිටියේ මාස පහක් යනුවෙනි, නැවතත් තරුණිය හඬ අවදිකරමින් මම ඔයාව කසාද බැඳලා කොච්චර කල්වෙනවද? මිනිහාගේ ඒ පිළිතුරද වූයේ මාස පහක් යනුවෙනි, තරුණිය මිනිසාගෙන් මෙසේ ඇසීය - 'පහයි පහයි කීයද යනුවෙනි' ? එවිට මිනිසා කියා සිටියේ හැබෑ නේන්නම් මාස දහය හරිනේ, කියමින් දරුපැටියව නලවන්න පටන්ගත්තාලු.

404. ගැහැනියක සහ මිනිසෙකු (දෙදෙනෙකු ) එක අයකු වීම විවාහය නම් වේ. එහෙත් ඒ එක්කෙනා කවුද කියා තීරණය කරන්න ගියවිට තමයි ප්‍රශ්නය ඇතිවන්නේ.

405. අවුරුදු 25 මංගල සංවස්ත්‍රය දා මහත්තයා මඟුල් කපුවා සොයාගෙන ගෙදර එක්කන් ආවා. මන් මෙච්චර කපුකන් කළා මහත්තයට විතරයි කාලගුණ තියෙන්නේ. ඔවු තමුසෙට කාලගුණ සලකන්න තමයි මම තමුසෙව සොයන්න ආවේ කියලා මහත්තයා තඩි පොල්ලක් අරගෙන කපු මහතාට ගහන්න පටන් ගත්තා. මිනිහා කකුල් දෙකට වැඳ වැඳ දුවලා.

406. අවුරුදු 30 මංගල සංවත්සරය දා මහත්තයා නෝනාගෙන් අහනවා 'ඔයා ඉස්සර නම් බඳින්න ඉන්නකොට කිව්වේ මාව ගතවන හැම දවසෙම සන්තෝසෙන් තියන්න ඕනෑම දෙයක් කරනවා කියලා.' එතකොට බිරිඳ කියනවාලු 'ඒ කාලයේ මම නිකමටවත් හිතුවේ නැහැ මෙච්චර කලක් ඔයා ජීවත් වේවි කියලා.'

407. කෙනෙක් තෙල් ටැංකි වලට ගිනි තියලා ඒවා හෝ ගාලා ඇවිලෙන බලං ඉන්නවා. ඇහුවහම කියනවා ඒක පෙට්‍රල් ගිනි ගන්නවද බලන්න කරපු අභ්‍යාසයක්ලු.

408. විවාහයේ පලවෙනි වසරේ පිරිමියා ගැහැණියට කතා කරයි, ගැහැණිය අසා සිටියි. විවාහයේ දෙවෙනි වසරේදී ගැහැණිය පිරිමියාට කතා කරයි, පිරිමියා අසා සිටියි. විවාහයේ තුන්වෙනි වසරේදී දෙදෙනාම දෙදෙනාට කතා කරයි, අසල්වැසියෝ අසා සිටිති.

409. ගෑනු 7 දෙනෙක් කිරි හොද්දක් හදලා හොද්දට ලුණු නැතිලු..ඇඹුල් නැතිලු..දෙහි නැතිලු.

410. 'බිරිඳක් අවශ්‍ය කර තිබේ' කියලා දැන්වීමක් පත්තරේ තිබුනලු. ''වෙක් මයි වන්'' කියලා ලියපු ලියුම් බරගානක් දැන්වීම දැමූ මනුස්සයාට ලැබුනලු.

411. දිනපතා නින්දට යාමට ප්‍රථම අරක්කු විදුරු 2ක් බොන මිනිහෙක් හිටියා. බිරිඳට මේ පුරුද්ද කොහොමහරි

නතරකරන්න උවමනා කලරා තිබුනා. දවසක් ඇය වතුර වීදුරුවකට පණුවෙක් දමා පනුවා එහි පිනනු පෙන්නුවා. පසුව, අරක්කු විදුරුවටද පණුවෙක් දමා ඒ පනුවා එකෙනෙහිම මැරෙන සැටි පෙන්වූවා. 'දැන් පේනවා නේද අරක්කු බිමේ විපාක?'. එවිට ස්වාමියා කියනවා 'මම අරක්කු බිවුවොත් බඩේ පනුවෝ ඉන්නේ නැහැනේ'.

412. මේ ගමේ අනිත් අවට ගම්වලට වැඩිය ජනගහනය මොකද? පාන්දර 1ට කෝච්චියක් යනවා, අපි දෙන්නම සද්දෙට ඇහැරෙනවා; මුළු ගමේම දෙන්න දෙමාල්ලෝ එහෙමයි.

413. සාංඝික දානයක් දෙන ප්‍රසිද්ධ තැනක කර පළල හැට්ටයක් ඇඳගත්ත දානේ බෙදන දායිකාවක් දානේ වලදන්න මිටි ආසනයක වාඩිවෙලා උන්න හාමුදුරුනමක් ලඟට ගිහින් පහත් වෙලා 'හාමුදුරුවනේ බිත්තරයක් දාන්නද' කියල ඇහුවලු. අපහසුවට පත් වෙච්ච හාමුදුරුවෝ අන්න අරෙහෙට ගිහින් බිත්තරේ දාලා එන්න කියල තරහෙන් වගේ එලියට අත දික් කලාලු.

414. ආච්චි කෙනෙක් කොළඹ එන්ට කියලා හිතාගෙන නුවරින් බස් එකකට නගින්න ආවලු. කොළඹ යන්නෙ මොන බස් එකද කියලා අහලා, බස් එකට ගොඩවෙලා වාඩි වෙලා බලාගෙන ඉන්නවලු, ඉන්නවලු. බස් එක යන පාටක් නැහැල්ලු. ඔන්න ටික වෙලාවක් යද්දි ආච්චි දැක්කා පිටිපස්සේ තිබුණු බස් එකක් පිටත් වෙනවා. කේන්ති ගිය ආච්චි ඇයි මේ බස් එක යන්නෙ නැද්ද? අර පිටිපස්සෙ

තිබුණු බස් එකත් ගියා කියමින් ගෝරනාඩු කරන්නට පටන් ගත්තාලු. අසල සිටි මගියෙක් ඇයව සනසන්න සිතා ඒ ගියෙ ආච්චියෙ ඉන්ටසිටියක් කියා කීවාලු. එය ඇසූ ආච්චිට තවත් තරහා ගොස් ඉතිං බලහංකො පුතේ ඉන්ට සිටි බස් එකත් ගියා. මේ යන්ට සිටි බස් එක තාම ගියෙ නෑ නේ කියා කීවා ලු.

415. මගේ වයිෆ් නෑ කමට මගේ ආච්චි වෙනවා. ඒ මොකද අපේ අප්පච්චිගේ බාලම නැන්දා; ඒ කියන්නේ අපේ චූටි කිරි අම්මා; අපේ අප්පච්චිට වඩා අවුරුදු කීපයයි වැඩිමහල්; ඒ චූටි කිරි අම්මා බැඳලා තියෙන්නේ මගේ වයිෆ්ට දුර නෑකමකින් සහෝදරයෙක් වෙන කෙනෙක්. ඔය කථාව ගෙදර කියලා වයිෆ්ට ‘ආච්චි’ කියලා ආමන්ත්‍රණය කරන දවසට මට රෑට කෑම නැහැ.

416. බිරිඳ - මම සිහිනයක් දුටුවා ඔයා ස්වර්ණාභරණ සාප්පුවක ඉන්නවා, මට දියමන්ති මුද්දක් ගත්තා. සැමියා - මමත් ඒ සිහිනයම දුටුවා, සහ, ඔයාගේ තාත්තා ඒ බිල ගෙවනවා.

417. තම පුද්ගලික ලේකම්වරිය සමඟ අනියම් සම්බදතාවක් පවත්වන මහත්තයෙක් හිටියා. දිනක කෑමෙන් පසු දෙදෙනාම ලේකම්වරියගේ ගෙදර ගොස් සවස් භාගය වනතෙක් ලේකම් වරියගේ ගෙදර ගත කලා. ගෙදර යාමට ප්‍රථම ඔහු ලේකම්වරියගෙන් ඉල්ලා සිටියා තම සපත්තු දෙක ඇගේ තණකොළ බිස්සේ හොඳට උලා රැගෙන එන ලෙස. පුදුමයට පත් වුවත් ඔහුගේ ඉල්ලීම ඇය ඉටු කළා. ගෙදර ගිය පසු බිරිඳ ඇසුවා ඔබ කොහෙද

මෙච්චර වෙලා හිටියේ කියා. 'ඩාර්ලින් අපි එකිනෙකාට බොරු කියා ගන්නේ නැහැ කියලා පොරොන්දු වෙලානේ ඉන්නේ, මම ලේකම්වරිය සමඟ අයථා සම්බන්දයක් තියෙනවා, මෙතෙක් වෙලා සිටියේ ඇගේ ගෙදර' කියා. බිරිඳ හිනාවෙලා කියනවා, 'ඔයා නම් පොරොන්දු කඩ කරන්න දෙයියා. බලන්න ඔය සපත්තුවල තණකොළ, ඔයා මෙච්චර වෙලා පිටියේ ගොල්ෆ් ගගහනේ ඉඳලා තියෙන්නේ කියලා'.

418. කලක් පෙම්වතුන්ව සිටි යුවලක් විවාහ වී මධුසමය ගත කරන්නට හෝටලයකට ගියහ. එහි උඩ තට්ටුවේ කාමරයක ලැගුම් ගත් ඔවුන් සඳලුතලයේ සිට අඹ ගෙඩියක් රස බැලුහ. අද තමයි අපේ ආදරයේ එල නෙලන දවස.මේ දවස උදා වෙනතුරු අපි මොනතරම් සිහින මැව්වද. මනාලයා මෙසේ සොඳුරු වදන් තෙපලමින් අඹ ලෙල්ල පහළට විසිකළේය. එය පහතින් ගමන් කළ අයෙකුගේ ඔලුව මත වැටීනි. කෝපයට පත් ඔහු වහා උඩු මහලට දිව අවුත් දොරට ගසා ජෝඩුව දැක තමුසෙලා මෙතන මොකද කරන්නේ යයි ඇසීය. ඇයි මොකක්ද ප්‍රශ්නය අපි හනිමූන් ආවා, අද අපේ ආදරයේ එල නෙලන දවස, අපට අදවත් සතුටින් ඉන්න දෙන්නේ නැද්ද? මනාලයා කෝපයෙන් කියාගෙන ගියේය. හරි හරි තමුසෙලා එල නෙළුවට මට කමක් නෑ, ඒත් අපේ ඇඟට ලෙලි දාන්න එපා. ඔහු පැවසීය.

419. සිය දුවගේ උපන් දිනයට ත්‍යාගයක් ගැනීමට විශාල වෙළඳ සැලකට ගිය පියා වෙළඳ සහයිකාවගෙන් අහනවා අර ශෂී බෝනික්කා කියාද කියා. ඇය කියනවා එම ශෂි

බෝනික්කාගේ වර්ග කීපයක් තියෙනවා - නැටුමට යන ශෂි බෝනික්කා රුපියල් 1000, සාප්පු යන ශෂි බෝනික්කා රුපිය 1000, වැල්ල පාගන්න යන ශෂි බෝනික්කා රුපියල් 1000, රාත්‍රී සමාජශාලාවට යන ශෂි බෝනික්කා රුපියල් 1000, දික්කසාද වුනු ශෂි බෝනික්කා රුපියල් 10,000 වශයෙන්. ඇයි දික්කසාද වුන ශෂි බෝනික්කා ඔය තරම් ගණන් - ආ එයා එන්නේ එයාගේ හිටපු මහත්තයාගේ ගෙදර, කාර් එක, ගෘහ භාණ්ඩ සහ රත්තරන් මුදු සෙට් එකත් එක්කනේ' කියලා

420. TV එකේ බුද්ධිමතුන් සඳහා වූ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනකදී අහනවා 'සතුරු සබ්මැරීනයක් විනාශ කිරීමට තිබෙන කෙටිම සහ හොඳම මඟ කුමක්ද?'. බුද්ධිමතුන් ඔලුව කහ කහා කලපනාකරණ විටදී මගේ චුටි නංගියා කියනවා 'මුහුද යටින් පිනා ගොස් සබ්මැරීනයේ දොරට තට්ටු කරනවා, ඒ අය කවුද කියලා බලන්න දොර අරිනවනේ, එතකොට ඇතුලට වතුර ගිහිල්ලා සබ්මරිනය විනාශ වෙනවා; මම ආපහු පීනලා උඩට එනවා'.

421. සමාජ ජීවිතය එපා වී වනගත වූ තාපසෙකුට තමාට කියා තිබුනේ විලි වසාගැනිමට අමුඩ දෙකක් පමණි. නා පිරිසිදු වී අනිකෙන් විලිවසාගෙන තෙමුන අමුඩේ වේලෙන්න දැමු කල මීයෙක් එය හපා කපා දැමුයෙන් ඌ මෙල්ල කරන්න පුසෙක් ගෙනාවේය, පුසාට කිරි දෙන්න හරකෙක් ගෙනාවේය, හරකා රැක බලාගන්න තරුණයෙක්

ගෙනාවේය, තරුණයාගේ තනියට අඹුවක් ගෙනාවේය, දන්නෙම නැතිව දරු මල්ලන් පිරි නිවසක සිරි ගත්තේය.

422. 'ඇත්තටම හිටපු ඇමතිතුමා ඔබතුමා බොරු නෙමෙයි මේ කියන්නෙ, විහිළුවකුත් නෙමෙයි. තමන් ගේ දාඩිය ගඳ තමන්ට දැනෙන්නෙ නෑනේ, ඒ වගේ තමයි තමන් ගේ ප්‍රචන්ඩත්වෙ තමන්ට දැනෙන්නෙ නෑ'.

423. හමුදා හටයන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයකට අගුටුමිට්ටෙක් ගිහිල්ලා. 'ඇයි ඔයා ආවේ' කියලා ඇහුවහම කියනවා'මම කොට හින්ද මැෂින් ගන් එකෙන්, මට කැරකි කැරකි, පහසුවෙන්ම වටේටම වෙඩි තියන්න පුලුවන්; හැබැයි කොට හින්දා සතුරන්ට මට ඉලක්ක අරගෙන වෙඩි තියන්න අමාරුයි' කියා.

424. රෝගියා - ඩොක්ටර්, මම නැමිලා දණහිසෙන් පල්ලෙහාට අත් දෙක දික් කරලා ආපහු අත් දෙක ඉන ළඟට ගේන කොට පිටකොන්ද රිදෙනවා. ඩොක්ටර් - මොකද ඉතින් ඔච්චර අමාරු, කරන්න බැරි ව්‍යායාම කරන්න යන්නේ? රෝගියා - එහෙම නැතුව කොහොමද ඩොක්ටර් මම මගේ කලිසම ඇඳ ගන්නේ?

425. ඔබගේ මුදල් ඩබල් කරගන්න ඕනේ නම් මුදල් නෝට්ටුව දෙකට නමලා පර්ස් එකේ තබාගන්න.

# • අදට ඔබින මසුරන් වැකි/කියමන්

426. එක මකුණයි කන්නේ ඇයි, ඔක්කොම මකුණො මරන්නේ

427. තමන්ගේ මඩියට විදිනවිට හොර අන්ධයන්ටත් ඇස් ඇරෙනවා, හොර කොරාත් ඇවිදිනවා

428. අනුන්ගේ මඩ ඇදගෙනම ඒවා  නා නා ඉන්නාවා

429. ඔහොම යනකොට චයිනාවල චීනාගෙනුත් අහලා බලන්න කියයි

430. බලේ තියනකොට මොලේ නෑ; මොලේ තියෙනකොට බලේ නෑ

431. බොරු කියන අය අපායේ යනවා නම් ඉස්සෙල්ලම යන්නේ ඔයා

432. බොරුවෙන් ජීවත්වෙන්න එපා කියන ගොඩාක් අයත් කොපමණ වෙලාවට බොරුවෙන් ජීවත්වෙනවද?

433. ‘ඔයා හරි අහිංසක පාටයි’. ’මගේ දියසායම් පෙට්ටියේ ඒ පාට හොයාගන්නම නැහැනේ’

434. ඩොලරය රුපියල් 5000 නොට්ටුවට යාකරලා තමයි පාකරන්න වෙන්නේ මේ යන විදිහට

435. උපන් ලප එක්ක ඉපදුන අප ඒවාත් එක්කම මැරෙනවා

436. වැස්සේ නොතෙමී යන්න කාර් එකක් ගන්න

437. පටු කෝණයකින් ප්‍රශ්නය දෙස බලන්න එපා

438. දියෙන් ගොඩදැමූ මාළුවා වගේ ගැහෙනවා

439. දෙහිවල සත්තු වත්තේ හිටිය කාලේ මතක් වෙලා

440. මෙයා හැටපස් වැනි මායමත් දන්නවා

441. කෙනෙක් අත ඇති සැරයැටිය වැනිය යුත්තේ වෙනත් කෙනෙකුට නොගැවෙන දුරකට පමණයි

442. එකට කැවට බොක්ක වෙනස්

443. හොරු කියන්නේ මන්ත්‍රීන්ලාට කියන තවත් නමක්ද

444. මේ ඔක්කොම බලා ඉන්නේ වරදින තුරු අපිට

445. මගේ අතේ හකුරු ඇති නිසා ඕනෑම තේ කෝප්පයක් පැණි රසට බොන්නට පුළුවන්

446. පොලේ/කඩේ බඩු ගන්න විදියෙන් පේනවා කෙනෙකුට දැනුම/බුද්ධිය තියෙන්වද නැද්ද කියලා

447. ඔයා මෙතනින් ගියොත් හරියට අර අහවල් ඇමති නැති පාර්ලිමේන්තුව වගේ වේවි

448. බෝංචි ගන්න ආවා නම් බෝංචි අරන් මාරු වෙන්න. පැටිකිරිය අහන්නේ නැතුව

449. මන්ද මානසික කාරයෙක් බස් එකේදී මට හේත්තු වෙලා නිදා ගන්න හැදුවා. එයා පාඩමක් ඉගෙන ගත්තා

450. ගවුමට ටයි එකක් දාලා කොන්ඩේ, නිය පාට කරලා බස් හෝල්ට් එකේ ඉන්නේ හරියට ලංසි බෝනික්කා වගේ

451. අපේ වැඩපොළේ සමහරු බොස්ලා, සේවකයෝ බලාගෙන ඉන්නේ මට කකුල් මාට්ටු දාන්න

452. කොස්සෙන් තමා එයාට ගහන්න ඕන

453. ඊර්ශ්‍යා කාරයෝ තමයි කකුලෙන් අදින්නේ

454. අම්මා යන අකුරු තුනේ; ලොවුතුරු සුවය මට දැනේ

455. කනමදයට තාම වෙරි කිව්වාලු

456. උපන්නොත් මැරෙනවා

457. බේබද්දාට සිහි වෙන එකම දේ අරක්කු බෝතලෙයි

458. ඔයාගේ මස්තිෂ්කය තියෙන්නේ අමාශයේ, එකයි ප්‍රශ්නේ

459. වැරදුනු තැන කවුරුත් නැත තමන් මිස

460. ඔයා තණමල්විල ප්‍රසිද්ධ දුම් පානය පාවිච්චි කරලාද ඉන්නේ?

461. මෙයා පච කන්තොරුවක්

462. ඇස් වහ නම් බලන්න එපා, කටවහ නම් කියන්න එපා

463. ලත් තැන ලොප් වෙනවා

464. ‘ඇති ඇයෝ නැති ඇයෝ කවුද මැව්වේ මේ ඇයෝ.... නැදැයෝ’

465. නිමල සිතකට කුසල මිස අකුසල නොඒය කවදත්

466. මේ නඩුවට පිලඩෙල්ෆියා ලෝයර් කෙනෙක්ම ඕනා කථා කරන්න

467. විවාහය අමු අඹයකි. කෑ අයගේ දත් හිරිවැටී 'ෂික් කාපු මොඩකම' යයි කියා පසුතැවිලි වෙද්දි, නොකා බලන් ඉන්න කෙනාගේ කටට කෙල උනයි. කන්නම ඕනා වෙයි

468. වැරදි කරපු ඔයා කතා කරන්නේ හරි සුද්දවන්ති වාගේනේ

469. මිසදුටුවන්ට වෙන්කරලතියෙන මගෙ ලිස්ට්එකේ කුඩු නෞෆර්ට තියෙන පළවෙනිතැන ගන්න මේයා මාර ට්‍රයිඑකක් දෙනවා

470. අපේ රට තුලත් සමහර තැන්වල 'සුද්දෝ එක - අපි දෙක'

471. මම නම් දන්නවා ඉංග්‍රීසියෙන් අඬන හැටියි, හිනාවෙන හැටියි

472. බොහෝ දේවල් පිටින් ලස්සනයි, ඇතුලේ ලස්සන නෑ

473. පොර කිකිළියක් වගේ පොරකන්න එපා

474. රජ උනත් බල්ලා කයිද සෙරෙප්පුව කටින් අල්ලා

475. කතාකරනකොට පුද්ගලයා කවුද කියලා අඳුනාගන්නත් පුළුවන්/නොගන්නත් පුළුවන්

476. එක් කණකින් රිංගලා අනිත් කනෙන් එලියට එයි එයා කුඩයකුත් ඉහලාගෙන

477. නැට්ට පාගා ගෙන

478. විස්කි බීලම මොලේ කොලොප්පන් වෙලාද කොහෙද

479. අ. පො. ස. සා. පෙ. අසමත් උපාධිධාරියෙක් නේද එයා

480. ඇතිදා සීනි නැතිදා ගෝනී

481. එයාව ආශ්‍රය කරපු කාලේ කෙක්කෙන් පොල් කැඩුවා නම් මම අද කෝටිපතියෙක්

482. සල්ලි වසනා

483. තමන් ගේ දාඩිය ගඳ තමන්ට දැනෙන්නෙ නෑ

484. බඹරෙක් විදියට ආපු නිල මැස්සෙක්

485. තණකොල කන, මොලය නැති කෙනෙක් බව ඔබ ක්‍රියාවෙන් පෙන්නුම් කළා

486. ගෑනි මහ උඩැක්කියක්

487. ආදරෙන් ඉන්න යුවලකගේ විරසකය බත් හැලිය ඉදෙන කම් විතරයි

488. ඔයා කෙනෙකුට එක ඇඟිල්ලක් දික් කරන කොට ඔයාට ඇඟිලි හතරක් දික්වෙලා කියලා දන්නෙ නැද්ද

489. අහල ගම් පන්සීයයක වත් මිනිහා දැන් නැහැ

490. කාටත් පොදු මාවතේ, නොයන් ගමන් වැරදි ලෙසේ

491. හැමදාම තෝර මාළු කාලා බැහැ; පරා, ඉස්සො, පොකිරිස්සො එහෙමත් කාල බලන්න එපායැ

492. ‘දෙවියනි ඔබ කොහිද?’

493. ආ! මම දවල් හීනයකින් ඇහැරුනා

494. නාකී විසේ ගෙටත් උසේ

495. එයා වැඩ බැරි ටාසන් කෙනෙක්

496. මගේ ලොවේ රජ්ජුරුවෝ ඔබයි පියාණෙනි

497. ඔයාගේ ඔලුව අතගාලා බලන්න අං තියෙනවද කියලා

498. කතා පෙට්ටියේ බැටරිය බැහැලද

499. ඔයාගේ නම් මොලේ කවුරු හරි හොදටම හොදලා

500. ලුණු ගම්මිරිස් එක්ක දීලා ඇරියා

501. ගෙවිච්ච ටයරක් දුවවන වාහනයක අයිතිකාරයා ලෝබයෙක්

502. මෙන්න, පත්තිනි අම්මා ඇවිල්ලා

503. බොන එකෙත් සීමාවක් නැහැනේ

504. නඟමු සාධු නාදේ, වදිමු මුනි සිරි පාදේ

505. වැස්සකටවත් ඉස්කෝලයකට ගොඩ වෙලා තියෙනවද මිනිහෝ

506. නවත්ත ගන්නවද ඔය දෙන්නගේ බොරු ෆයිට්. ඕනේ නම් පුන්නක්කු ගෝනියයි, විරේක පෙති ටිකකුයි එක්ස්ප්‍රස් තැපැලෙන් එවන්නම්

507. ගමේ කියන්නේ පිට කසනවතී කියලානේ. අද ඉඳලා හොඳට බ්‍රෂ් එකෙන් පිට මැදලා, ලයිෆ් බෝය් ගාලා නාන්න

508. මිස්ට බීන්වත් පරාජය කරන ඩබල් ජෝකරයෙක්

509. 'වරදක් කලත් සිතකින් නොවේ'

510. මේ වැයම රජ වෙන්න නොවේ

511. බලු වලිගය හත් අවුරුද්දක් උණ බම්බුවේ දාලා තිබුණත් ඇදේ නොඇරේ

512. වෛරයෙන්, ක්‍රෝධයෙන්, ඊර්ෂ්‍යාවෙන් අන්‍යයන් නොදැවේ, දැවෙන්නේ තමාමයි.

513. ඇතිදා වවුලෝ එල්ලිලා කති; නැතිදා වවුලෝ ඉගිල්ලිලා යති

514. අත කැපෙන්නේ නැද්ද මෙච්චර හීනියට චීස් කපන කොට?

515. මිනිසුන් හොඳයි සැමදා, යහගුණ ඇත්නම්

516. එයාගේ කබඩ් එකේ ඇටසැකිළි

517. පෙර දින වැරදුනේ හිත හොඳ වැඩි හින්දයි; අද දින සිතනවා දෙවරක් ඒ හින්දා

518. 'අපේ බුදුන් අපි වඳින්නේ, පෙරළි පෙරළි අපි වඳින්නේ'

519. 'මා හරි උගතා මා හරි ජගතා කියනා මිනිහා මෝඩයෙකි'

520. දෙවන කැකිල්ලේ රජ්ජුරුවොද ඔයා

521. 'උපන් දා සිට කරපු පවු නැත වරක් වැන්දොත් කැලණියේ'

522. එයා මොලේ තියෙනවා කියල මිනිස්සු හිතාගෙන සිටින මීහරකෙක්

523. හොඳ හොඳ සෙල්ලම් පහු පහු වෙනකොටලු

524. කටුනැති දිව ඕනැපැත්තකට හැරෙනවා

525. ඔයා මාර්ගඵල ලබලාද?

526. ඔයාට වලිගෙ පැගිලා. ගිහිල්ලා බොන්න කසායක්

527. මුහුදේ රැල්ල ගොඩට එනවා හිස් අතින්, ආයෙම යනකොට අපෙන් දේවල් උදුරාගෙන යනවා

528. ඒ නරුම වධක මුහුණ දකින කොට අපායේ යමපල්ලෙක්ව සිහියට එනවා

529. සන්සුන් මනසකට, ස්ථිරසාර ඉදිරියකට, නොපසුබට වීර්යයකට - පරාජය උරුම නැත

530. ඔයිට වඩා නම්බුකාරයි පාරේ ඉන්න අය කරන රස්සාව

531. කුස්සියෙන්, ලිප්බොක්කේන්, ලිප ගිනි මැලෙන්, මිදුලට බැස්සම කන්වලින් දුන් පිටවෙනවා, ඇස් රතුවෙනවා

532. මලයාසියාවට ගියා නම් මලයාසියා කාරයෙක් වගේ ඉන්න

533. ‘ඔබේ සෙනෙහස සුවඳ දිදී දැනුනා මට අම්මේ’

534. රැවටුණු මේ සිත, මා තනි වුන බව නම් නෑ දන්නේ

535. මට අං තට්ටු දන්නා එන්න එපා

536. මොලය උඩ ඉඳගෙන කථා කරන්නෙකි ඔබ

537. අනුන්ගේ කුණු හොයා හොයා ඉන්නේ නැතුව අබරෝ කොටමුද කුඹුර

538. ණයට කහින්න එයාට මොකක් හෝ සුගතියක් ලැබෙන නිසා විය යුතුයි

539. බිරිඳගේ හොර අල්ලන්න මිතුරා බාර අරන්, ඒ පවුල ලියල ලාලු

540. වැස්සට ගෙට ගොඩ වෙච්ච කෙනා ඒ ගෙදර දොර අස්සෙන් බලන්නෙ නැතිව ඉන්න ඕනේ

541. සුද්දා චුයින් ගම් හපන්න පුරුදු වුනේ අපේ බුලත්විටෙන්

542. ව්‍යාපාර වස්තු, වැල් පොළිය ගැන හපනලු; 15යි 28යි එකපාර එකතුකරලා කියන්න බැහැ

543. නැලවිල්ලෙන් ආත්මයම උණුසුම් කල අම්මා

544. හොඳ වෙලාවට සෙල් පෝන් චාජර් පුපුරන්නේ නැත්තේ

545. බිරිඳගේ උත්සහයයි, දරුවන්ගේ සුරතළයයි, මගේ දියුණුවයි

546. මොකද ඔයා බැඳපු මට ලියුම් දෙන්නේ, මොලේ කොලොප්පන් වෙලාද?

547. රෝද තුනක් උඩ, සිහින ගොඩක් ඇත

548. 'මැනලද පුතේ කිරි දුන්නේ මම නුඹට?'

549. ගැහැනියක් කවදද වයස කිවේ?

550. මගේ අම්මේ අරයා ගාන බටර්. බේකරියක පානුත් මදි ගාන්න

551. රාත්තල් අස්සේ අරික්කාල් ගහන්න එපා

552. ත්‍රීවිල් මල්ලියෙක්ගෙන් ඇහුවා ඇයිද ත්‍රීවිල් කියා, ඔහු කිවා 'දුකයි, සැපයි, රසයි මාවතේ'

553. එයාට චන්දේ දෙන අය ගොම කන අය වෙන්න ඕන

554. කෝ තාත්තේ යාළුවෝ? ඒ ගොල්ල හිටියේ ඔයාට යමක් කරන්න පුළුවන් කම තියෙනකම් විතරයි පුතේ

555. නැන්දම්මා අදින ඇඳුමක පාටක් දැක්කත් මම නම් ඒ පලාතේ යන්නේ නැහැ

556. ‘සිතල උදයේ නාමල් උයනේ, ගෙවුණු අතීතය මතකද මිහිරේ’

557. මං ගිහින් අර වලන් ටික හෝදලා දාල එන්නම්? නැතිනම් හාමිනේ කිසි ඇහිල්ලක් නැහැ ඉදුල්වතුර කොරහ වීසිකරයි, අපි සේරම නැවෙනවා

558. ඒ ෆාමසි එකේ බේත් බිව්වොත් රුධිර පීඩනය විතරක් නෙමෙයි තියෙන රුධිරයත් නැති වෙනවා

559. එයා කෙක්කක් වගේ එල්ලෙන්නමයි බලන්නේ

560. අතේ සතයක් නැතත් මාමා පුතා කියයි

561. මිරිගමට වහින්නේ නැතුව වටේටම වහින්නකෝ

562. ‘දුක සැප නීති පෙරලේ, රිය සක ලෙස ලෝකේ’

563. බඩත් කොරවෙනවා හිනා වෙලා

564. ඕනාවට වැඩිය බයාදු වෙන්න එපා; නැත්නම් එළුවත් කියාවි කපාපිය මගේ රැවුල කියාලා

565. මාමා අපේ අක්කාගේ තෝල්කයා වගේ. මගේ නඩුව කල් දාලා දෙන්නකෝ මාමේ

566. මේවට තමා කියන්නේ පෙර කරුම කියලා

567. ඔයා කථා කරන්නේ හරියට අර කව්ද මගේ කලිසමේ ජරාව දාලා ගියේ කියල අහනවා වගේ

568. මඩු වලිගයක් හොයලා තලන්න ඕනෑ ඔයා කියන බොරු වලට

569. පෙට්‍රල් නෙවෙයි ක්‍රෙඩිට් කාඩ් එකෙන් මගේ වාහනේ යන්නේ

570. පවු ඒ මිනිහා ගැරඬියෙක්

571. අස්ථිර ලෝකයේ ස්ථිර ආදරය ලැබෙන්නේ දෙමව්පියන්ගෙන්

572. ඔයාට පින් උද්දේම අපේ ඔලුව නරක් කරාට

573. 'හැප්පෙනවාද බලන්න' කිව්වාම හැප්පෙනකම් ඉඳලා 'ඕන්න දැන් හැපුණා' කියන්නේ මොකද?

574. ඇතිදා පමණක් ළඟ සිටි මිතුරන් කිසිදා යලි හමු නොවේවා

575. අලංකාර බොරු කියා භයාන්කර තොප්පි දානාවා

576. ‘පොල් පොල් පොපොල් පොල් පොල් පොල් - ලංකාවෙ ගස් වල වැවෙන පොල්; පොල් පොල් පොපොල් පොල් පොල් පොල් - පිට රට පටවන පොල්’

577. නරක ආරංචි හුළඟ වගේ ගහගෙන යනවා

578. මෙයාගෙ ඔලුවට පොල් ගෙඩියක්වත් වැටිලද?

579. කවද කාපු ටකරන්ද මේවා

580. ඔය වැල තදට බඳින්නකෝ, හෙලවෙන දතක් වගේ

581. දෙන්න හඬ; මෙන්න ඉඩ

582. ඔයා හොඳයි මල ගෙවල් වල නිදිමරන්න එක්ක යන්න

583. මාව තම්බන්න එයාගේ ලුණු ගොරක මදි

584. ඔහේ මීහරක් මස් කාලාද?

585. නිලය බලය තාවකාලිකයි; මනුස්සකම සදාකාලිකයි

586. උණ්ඩයට උණ්ඩයෙන් උත්තර දෙන්න වෙන වෙලාවල් තියෙනවා

587. ඝාතනය කල දේශපාලකයා ජීවත්ව සිටියදීට වඩා බලවන්තයි

588. කිරියි පැණියි වගේ හිටපු පවුල දැන් වහ කදුරු වගේ වෙලා

589. ‘මා දන්නේ එක් දෙයක් පමණි ඒ මා කිසිවක් නොදන්නා බවය’ (සොක්‍රටීස්)

590. ‘මුළු ලොවම රඟ මඩලකි, අප එහි නළුවෝ වෙමු’ (ෂේක්ස්පියර්)

591. බල්ලා හොදලු වලිගය උගෙ වැනෙන නිසා, හරකා හොදලු කිරි ටික උගෙ බෙදන නිසා, කොලුවා හොඳලු කිතුලේ ඌ යන නිසා, මියා හොද නැතිලු මේ තුනම උගේ නැති  නිසා

592. ඔයාගේ කථා අහලා කනේ කරගැට ඇවිල්ලා

593. එන පොට හොද නෑ කෙල්ල ගෙට ගන්

594. ඔබගේ ඊර්ෂ්‍යාව මගේ දියුණුවයි

595. අපි හොඳ බව දන්නෝ දනී; නොදන්නෝ බනී

596. සුරතල් දුවේ, ඔබයි අපේ දිවිය අර්ථවත් කලේ

597. ඔයා හිතුවට ඒක අර්තාපල් කියලා, ඇත්තටම එක වල් අලයක්

598. පුහ්!! මැස්සෙක් ගිය උඩ!

599. මගේ අම්මෝ ඉන්න සෙනග, මුහුදේ මාළු වගේ

600. ලෙහෙසියෙන් විසඳිය හැකි දේශපාලන ප්‍රශ්ණ පොරවෙන් හෝ කපා බිම හෙළිය නොහැකි වන තෙක් අනා ගන්නා ලකුණු තිබේ

601. පොර කුකුල් සමිතියේ සභාපති ඔයා නේද?

602. දොස්තරලත් ඇහැ කන නාසය පපුව හැටියට වෙනස් වෙනවා. මහාචාර්යයවරුත් එහෙමයි, ගුරුවරුත් එහෙමයි

603. පවුල් සංස්ථාව කියන්නේ පාඩු ලබන සංස්ථාවක් වෙන්න පුළුවන්. හැබැයි කවදාවත් ජනසතු කරන්න හරි, පොදු සමාගමක් කරන්න හරි දෙන්න එපා

604. 'මහා සයුර ඔබයි අම්මේ පෙම්බර මගේ'

605. රට වට කර සාගරයි, ඒ සම්පත් ආකාරයයි

606. නොමැරෙන කෙනෙක් ලෙස හිතා ජීවත් වෙන්න එපා

607. මුව පුරා සිනාසී, හදවතින් ඊර්ෂ්‍යා නොකරන්න

608. සමහර අයව පාර්ලිමේන්තු යවන අපියි බූවල්ලෙන් තලාගන්න ඕනෑ

609. ඔය අයියාත් බලනකොට එක්තරා පත්තරයක් තමයි. එයාට හොරෙන් මොකුත්ම කරන්න බැහැ

610. වනේ වන හතුරෙකුටවත් මෙවන් දෙයක් නොවේවා

611. අපේ නිවස මත්පැනින් තොරය - හිතේ සතුට උතුරා යයි

612. 'සමකෝණී ත්‍රිකෝණයකි ඔබත් මාත් ඇයත් තිදෙන'

613. අත් දෙකින්ම මුහුණ වහගෙන; අතේ ඇඟිලි ටික ඇත් කරලා

614. බල්බ් එක දාගන්න බැරි මහාචාර්යවරුත් ඉන්නවා

615. තැනේ හැටියට ඇනේ ගහනවා

616. මෝඩකමට කොයින්ද බෙහෙත් කිවුවලු

617. ඔයා ජීවත්වෙන්න කන මිනිහෙක්ද? එහෙම නැත්නම් කන්න ජීවත්වෙන කෙනෙක්ද?

618. අයියෝ සල්ලි කිව්වාලු

619. බීලා වාහන එලවන්නේ අන්ත මෝඩයෙකි

620. සමකෝනි ත්‍රිකෝණයක කෝණ විතරයි සම, පාද සම නැහැ

621. බුලත් තිබෙන්නේ පුදන්නට මිස හපන්නට නොවේ

622. මොකක්ද තිත්ත ඇත්ත?

623. ආසයි මට පියාඹන්න

624. මෝඩයි කියලා මරන්නද?

625. ඔයා කන්නේ බත්ද, තණකොලද?

626. මුහුණ බලලා කතා කරන්න

627. අමිතා හව්වන් නම් මිනිහා ඉතුරු කරපු මස් කටු කෑලිත් ලෙවකයි අපේ අය

628. ඔයාගේ කල් ක්‍රියාවෙන් මනුස්ස වර්ගයා පැවත එන්නේ වඳුරු, වැදිරියන්ගෙන් බව තව දුරටත් තහවුරු වෙනවා

629. මාව තම්බන්න ඔය ලුණු ගොරකා මදි

630. මොලේ කවල්ද?

631. වැඩ බැරි ටාසන්ලා ලොකු පුටු වලට දමන්න එපා

632. මොකද මේ ටික දවසෙම හෝන්දු මාන්දු නැතිව වගේ

633. අහක යන නයි ඔඩොක්කුවේ දාගෙන කනවෝ කනවෝ කියල කෑගහන එක තමයි සමහරු කරන්නේ

634. කුසයේ දස මසක් මා දැරුවාට, ලේ කිරි කර පොවා මා හැදුවාට; සදා ණයයි අම්මේ මම ඔබට

635. ගියත් ඔබ අප අතහැර බොහෝ කල්, නිවසේ ඇත්තේ ඔබ සුවඳයි පියාණෙනි කිසිදා නොයන්

636. ඔයා අපිට විත කරන පිට සක්වල ජීවියෙක්?

637. මට නැතිදා මා ළඟ නැහැ මගේ යාලුවා

638. බැලුමක් ගිය උඩ!

639. මහනුවරටත් වරායක් හදා දෙන්න පොරොන්දු වෙලා, චන්දේ ඉල්ලනවා

640. මයිල් ගහක වත් විළි ලැජ්ජාවක් නැද්ද එයාට

641. කැලෑ පාළුවා/හොරා - 'නිකන් තියෙන කැලේනේ, ඕන්න ඔහේ කාපා දාගම්මු; හැමදාමත් කපන්නයැ, පුළුවන් වෙලාවට කපා ගන්නේ නැතුව'

642. කරපු දේ ගඟේ මුහුදේ දැම්මා වගේ

643. මහදැන මුත්තා එලුවාගේ බෙල්ල කැපුවා මිස එළුවාගේ අයිතිකාරයාගේ බෙල්ල කපන්න කීවේ නැත

644. ඩොලරය රුපියල් 5000 නොට්ටුවට යාකරලා තමයි පාකරන්න වෙන්නේ මේ යන විදිහට

645. මා හැමදාම කර ඇත්තේ මාගේ ඡන්දය රටට මෙන්ම මටද විපතක් වන අයුරින් භාවිතා කර ඇති බවයි

646. බොරුවක් කරලා හරි ඒ මිනිහා හිඟමන් ඉල්ලුවේ ජීවත්වෙන්න නේ

647. මා කැඩපත ඉදිරියේ සිටගත් විට එහි ඉන්න පුද්ගලයා හරිම හොඳයි, මගේ දුකට කවදාවත් හිනාවෙන්නේ නැහැ

648. දුක හිතෙන්නේ පොඩි මිනිහට හැම දුකක්ම

649. ඔයාගේ ඇඟ පුරාම මොලේද?

650. කළ හොඳ පමණක් ඉතිරිවේ

651. අල වගේද, ගෝවා

652. ඔයාට ඔලුවට බෙහෙත් ගන්න වෙන ලෙඩෙක් තියෙන්නේ

653. 'කුසගිනි හැඳුනට ඉඳුල්නොකව්, තනකොල නොබුදිති සිංහ පැටව්'

654. ඔයා රට පිළිගත් ශල්‍ය වෛද්‍යවරයෙක්ද, මනමාලියන්ට අන්දන කෙනෙක්ද?

655. අප සිනාසුනා නොවේ, වෙන අයව සැනසුවා

656. මෙයාට නමක් තියාපියෝ ගල් ඉබ්බයි කියාපියෝ

657. හදිස්සියාට කෑම තිබේ, කාපං මේ තණකොළ

658. 'මැනලද පුතේ කිරි දුන්නේ මම නුඹට'

659. මුළු රටෙම් ඉන්නේ බහුතරය හිගන්නෝ තමා, එක එක විදියකට හිඟා කනවා

660. හුස්ම ගැනිමට ඔක්සිජන් බද්දක් ඕන

661. මෙයා චෛතිය රජ කෙනෙක්

662. ආණ්ඩුවට සල්ලි නැහැයිලු - පයින් යනවටත් බද්දක් අය කරනවා නම් නේද හොඳ; එතකොට ළිං බද්දක්, යාවක බද්දක් අය කලොත් ආණ්ඩුව ගොඩ

663. නැන්දම්මා ඔය තරම් වස මොකද හුලුවත්තකුත් අරන් මා පිටි පස්සෙන් එලවන්න

664. බැරි වෙලාවත් අකුණු ගහන වෙලාවට එළියට බහින්න එපා කියන්න එයාට

665. එයාගේ තරහා කොච්චරද කිව්වොත් නහරයක් පුපුරාවිද මන්දා

666. සූ ගාලා 10 දෙනෙක් විතර ඇවිල්ලා

667. පෙරහැර ගිහින් ඉවර බව දැන ගන්නේ පාරේ අලි බෙටි දැක්කාමලු

668. වැට් එකෙන් නොව මඩුවලිගයෙනුයි අපට ගහන්න ඕනෑ'

669. හැමදාම සම්බෝලයි බතුයි කන්න බැහැ

670. වැසිකිලි යාමෙනුත් පරිසර දූෂණය වෙනවා කියනවනේ, අනිවාර්යයෙන්ම බද්දක් අය කරන්න

671. ‘පලංචියේ ලී ඉරුවේ අපි එකට’

672. ඔයාද එයාගේ සහයට ඩැනී?

673. මොකද කුකුළත් අතින් අරගෙනම

674. හැමදාම බුරියානි කන හින්දද අද සම්බෝලයි බතුයි කන්න හිතුනේ

675. කොටලුවෙක්ද, බූරුවෙක්ද දන්නේ නැහැ එයාගේ තාත්තා

676. ඔයාගේ කල් ක්‍රියාවෙන් පස්සේ අලුත් ‘වානර’ ලග්නයක් අවශ්‍ය බව මට පෙනී ගියා

677. ළමයි ලොකු වුණහමද ඔහේගේ මඟුල් විසේ ගැහැව්වේ

678. එයාට ලැජ්ජාවක් කියල දෙයක් තියේනම් දැන්වත් බඩ කපන් මැරෙනවා

679. පිස්සු හැදෙන සඳ කිච්චලු

680. බළලා මල්ලෙන් එළියට පැනලා

681. ඔය චෝදනාව ඇත්තනම් මම ගෙල කපා ගෙන මැරෙනවා

682. දැන්ම රේන් කෝට් එක ඇඳගන්න ඉන්න; ඔය දන්නෙ නැති වැහි වලට තෙමිලා අලි හෙම්බිරිස්සාවක් හදාගන්න ඉඩ තියෙනවා

683. සමහර ගමෙන් නගරයට ආපු  කපුටෝ ඔලුවට නෙමේ මොළයටමයි කොටන්න බලන්නේ

684. හිල්ටන් එකෙන් බිව්වත් අන්තිම ෂොට් එක හොර පොට් එකෙන්නේ

685. මම තරහා නැහැ. ඕනෙම නම් ඉතින් හෙට අපේ කැන්ටිමට ආවාම මගේ කෝපි එකට ඔයා සල්ලි ගෙවන්නකෝ

686. පැනි වරකා ගහට හෙන ගහලා

687. අප්පට සිරි ගජ අම්මට කජු මද කිව්වලු

688. මිනිසෙකු ඉපදුනොත් සිවලෙකු හට දාව, ඔහුට උරුමවෙයි හැමදාමත් හූව

689. එයාලා බොක්කෙන්ම යාළුවෝ

690. ‘හද හඬනා නිහඬ රැයේ ....’

691. ඔය වගේ මිනීකාක්කන්ට අකුණු ගහන්න එළියට බහින්නම ඕන නැහැ, හෙනපාරවල් ගේ ඇතුළටම එනවා

692. ඔබේ රබර් කශේරුකාවට ජය වේවා